
දෙසතිය
පුවත් සඟරාව
2024 පෙබරවාරි
විශේෂ මුද්‍රණය
VAT
බද්දේ
කතාව



# ICON OF THE SEAS

Icon of the seas ලෙස හඳුන්වන ලොව විශාලතම සංචාරක නෞකාව 2024 ජනවාරි 27 දින සිය මංගල ගමන ඇරඹුවේ ඇමරිකාවේ ෆ්ලොරිඩාවේ මියාමි වරායෙන්. තට්ටු 20කින් සමන්විත අඩි 1107ක වපසරියක විහිදෙන මේ නෞකාවේ මගීන් 7600ක් එකවර ගමන් කළ හැකි අතර එය සමන්විත වන්නේ පිහිනුම් තටාක 07ක්, ආපනශාලා, බාර්, විවේකාගාර 40කට අධික සංඛ්‍යාවකින්. Royal Cairibbean සමූහයේ නවතම නිෂ්පාදනය වන මේ නැවට ඇමරිකන් ඩොලර් බිලියන 2ක් වැය වී තිබෙනවා.

නැව ධාවනයට යොදා ගන්නා ද්‍රව ස්වාභාවික වායුව (LGN) සඳහා දැනටමත් මතු ව තිබෙන්නේ පරිසරවේදීන්ගේ විරෝධතා. ඒ, මේ වායුව සාම්ප්‍රදායික ඉන්ධනවලට වඩා පිරිසිදු ව දහනය වුව ද අහිතකර මීතේන් වායුව කාන්දුවීම හේතුවෙන් ඇතැම් අහිතකර වායු පිටවීමේ අවදානමක් පැවතීම නිසා.

පිරිසිදු ප්‍රවාහනය පිළිබඳ කවුන්සලයේ (ICCT) සමුද්‍ර වැඩසටහනේ අධ්‍යක්ෂ බ්‍රයන් කොමර් LGN යොදා ගැනීම වැරදි දිශාවකට ගත් පියවරක් ලෙස ප්‍රකාශ කරනවා. කාබන්ඩයොක්සයිඩ්වලට වඩා ප්‍රබල හරිතාගාර වායුවක් ලෙසයි මීතෙන් වායුව සැලකෙන්නේ. 2035 වන විට ශුද්ධ ශුන්‍ය විමෝචන නෞකාවක් හඳුන්වාදීමට මේ Royal Cairibbean සමූහය සැලසුම් කර තිබෙනවා.

**ඩබ්. එම්. ශාන්තප්‍රිය**



# දෙසතිය
පුවත් සඟරාව

වෙළුම 46, කලාපය 02,
2024 පෙබරවාරි

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2514150

උපදේශක සංස්කාරක
**දිනිත් චින්තක කරුණාරත්න**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - සංස්කරණ අංශය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛකයන්
**රංගිකා අබේසේකර**

ප්‍රවෘත්ති නිලධාරි
**නිල්මිණී ප්‍රනාන්දු**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**හිතවත් පාඨකයිනි,**

46 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව






19 බද්දේ කතාව


15 හසීනා යළි මහ පුටුවට


03 නිදහසේ උරුමය


35 කොඩි ගහ යට


09 උරුමයට උරුමය


40 ඔස්කා පිස්ටෝරියස්

# දෙසතිය
පුවත් සඟරාව

**ඔබ ළඟට ම ගෙන්වා ගන්න. පහත කූපනය පුරවා අප වෙත එවන්න.**

දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..........................................

Address ..........................................

..........................................

..........................................

..........................................

..........................................

ID Number ..................................Tel / Mobile ..................................

Signature .................................. Date..................................

**දෙසතිය සඟරා දායකත්වය**

දෙසතිය සඟරා දායකත්වය වාර්ෂික / අර්ධ වාර්ෂික ලාබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා රු. 3,000.00/ රු. 1,500.00 වටිනාකමකින් යුත් අංකය........................................ හා ..................................... දින දරන චෙක්පත / මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් "ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්" නමට ලියා, තැපැල් කාර්යාලය, කම්කරු මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස සඳහන් කර කූපනයද පුරවා මෙම ලිපිනයට එවන්න.

**දෙසතිය, බෙදාහැරීම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 163, පොල්හේන්ගොඩ, කොළඹ 05**

## ආවර්ජනය

වසර 46ක අඛණ්ඩ ගමනක යෙදෙමින් සිය මාධ්‍ය මෙහෙවර ඉටු කරමින් සිටින 'දෙසතිය පුවත් සඟරාව' 47 වැනි වියට පා තබන මොහොතේ ඒ පිළිබඳ ආවර්ජනයක යෙදීම කාලෝචිත වුවක්. ජනසන්නිවේදන ක්ෂේත්‍රයේ නව අත්හදාබැලීමක් ලෙස 1978 පෙබරවාරි මස 04 දින දෙසතිය පුවත් සඟරාවේ මංගල කලාපය නිකුත් වන්නේ සඟරා මාධ්‍ය කලාවේ සුවිශේෂ පිටුවක් පෙරළමින්.

දෙසතිය පුවත් සඟරා සංකල්පයේ නිර්මාතෘ එවක රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ආචාර්ය සරත් අමුණුගම සඳහන් කරන්නේ එම යුගයේ දෙස් විදෙස් තොරතුරු ඉංග්‍රීසි බසින් කියවන්නට පාඨකයාට අවස්ථාව තිබුණත් සිංහල පාඨකයාට එවැන්නක් නොතිබීමේ අඩුව සපුරාලීම මෙහි අරමුණ වූ බව. සඟරාවේ ආකෘතිය ඔහු පැහැදිලි කරන්නේ "දෙසතිය පුවත්පතක් නොවේ. පුවත්පතක දක්නට ලැබෙන ලහි ලහියේ සකස් කරන ලද ප්‍රවෘත්ති මෙහි නොමැත. එහෙත් පුවත් රැස් කර, විස්තර කර ප්‍රවීණයන් ලවා විග්‍රහ කර ඔබ වෙත ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. අපි ප්‍රවෘත්ති මෙන් ම ප්‍රවෘත්තිවලට පසුබිම් වූ කරුණු ද ඉදිරිපත් කිරීමට ඉටාගෙන සිටිමු." යනුවෙන්.

මෙවැනි අනන්‍යතාවක් සහිත ව බුද්ධිමත් පාඨක සමාජයකට අමතන 'දෙසතිය' මෙතෙක් පැමිණි ගමනේ ඊට දයක වූ පිරිස අතිමහත්. රජයේ ප්‍රකාශනයක් ලෙස එළිදක්වන මෙයට ප්‍රවෘත්ති සහ ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වරු, රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරු, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරු නිසි මාර්ගෝපදේශ ලබා දුන්නා. සිරිල් බී පෙරේරාගේ සංස්කාරකත්වයෙන් ඇරඹුණු දෙසතිය පුවත් සඟරාවට කලින් කලට පත් වූ සංස්කාරකවරු කළ කැපවීම එහි පැවැත්ම හා ඉදිරි ගමන තහවුරු කළා. උගතුන්, බුද්ධිමතුන්, වියතුන් තම ශාස්ත්‍රීය දයකත්වය නොමසුරු ව ලබා දුන් නිසා ම පාඨකයාගේ බුද්ධිමය නිම්වළලු පුළුල් කරන්නට 'දෙසතිය'ට හැකි වුණා. එහි ලේඛක පරපුර දැනුම රැස් කරන්නට හා බෙදා හරින්නට ගත් අපමණ වෙහෙස පාඨක දැනුම් පිපාසාව නිවාලන්නට සමත් වුණා. දශක 04ක් ඉක්මවා යමින් ඒ වටා රැඳුණු පාඨක ප්‍රජාව නොවන්නට 'දෙසතිය'ට මෙතෙක් දුර පැමිණෙන්නට හා පවතින්නට නොහැකි වන බව අමුතුවෙන් කිව යුතු නැහැ.

දෙස් විදෙස් ආර්ථික, සමාජ, දේශපාලන, පරිසර, කලා, සිනමා, සාහිත්‍ය, ක්‍රීඩා ආදී විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ ලියැවෙන විශේෂාංග ලිපිවලින් පොහොසත් 'දෙසතිය පුවත් සඟරාව' නව මාධ්‍ය සංස්කෘතියට අනුගත වෙමින් මුද්‍රිත මෙන් ම ඊ-සඟරාවක් ලෙස ද 2024 වසරේ සිට ඔබ අතට පත් කිරීමට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සූදනම්. 47 වැනි වියට පා තබන 'දෙසතිය' අභිප්‍රාය වන්නේ ඉදිරියේදී මුහුණදීමට සිදු වන අභියෝග ද ජය ගනිමින් නව මුහුණුවරකින් පාඨක ඔබ අතරට පැමිණීම. විශේෂයෙන් රජයේ දැක්ම සමාජගත කරන ප්‍රමුඛ සහ එක ම සඟරාව ලෙස 'දෙසතිය පුවත් සඟරාව' වත්මන් සඟරා මාධ්‍ය ක්ෂේත්‍රයේ මෙතෙක් ගොඩනගා ගත් අනන්‍යතාව තව බොහෝ කලක් පවත්වා ගන්නට පාඨක ඔබ අත්වැල් බැඳගනු ඇත යන්නයි 'දෙසතිය' අපගේ විශ්වාසය.

මාලා මල්කාන්ති ජයමාන්නගේ

- සංස්කාරක -

'හදමු අලුත් රටක්' තේමාවට අනුව යමින් 76 වැනි ජාතික නිදහස් දින සැමරුම 2024 පෙබරවාරි මස 04 දින පැවැත්වෙන්නේ ගාලු මුවදොර පිටියේදී, ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර වසර 700ක පමණ සිට පවතින නොබිඳුණු ආගමික සහ සංස්කෘතික මිතුදම ශක්තිමත් කරමින් ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ ආරාධනාව අනුව ප්‍රධාන ආරාධිතයා ලෙස ඊට සහභාගි වන්නේ තායිලන්ත අග්‍රාමාත්‍ය ස්‍රෙතා තැවිසින් (Srettha Thavisin). මේ ලිපිය ඒ නිමිත්තෙන්.





**පී. බී. මණ්ඩාවල**
පීඨාධිපති
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය
හිටපු අධ්‍යනාංශ ප්‍රධානි
ඉතිහාසය හා පුරාවිද්‍යා අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# නිදහසේ උරුමය


**1948 පෙබරවාරි 04 දින අප බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් නිදහස් වීම පරාධීන යුගයක් නිමා කළ බවයි ඉතිහාසයේ ලියැවීම. ඉංග්‍රීසි පාලනය කාලයේ අත්විඳි බොහෝ කටුකකම් මැද වුව ද රටක් ලෙස ලංකාව ආසියාවේ යම් ස්ථානයක් හිමි කර ගත්තා. අද වන විට නිදහස ලබා වසර 76ක් අප ගෙවා ඇතත් ඒ ස්වර්ණමය සිහිනය සැබෑ වූවා ද යන්න ගැඹුරට ම ගිය ප්‍රශ්නාර්ථයක්. අප සැබෑවට ම නිදහස දිනා ගත්තා ද? අතීතයෙන් උගත් පාඩම් ශ්‍රී ලාංකික ජනතාව විසින් සැබෑවට ම තේරුම් ගත්තා ද? යන්න අප අප ව ම ප්‍රශ්න කළ යුතු වනවා. මේ, ඒ පිළිබඳ විද්වත් අදහස් දැක්වීමක්.**

1948 නිදහස දිනා ගැනීමට පෙර ලංකාව වසර දහස් ගණනක ශ්‍රේෂ්ඨ අතීතයකට උරුමකම් කී බව ලෝකය ම පිළිගන්නා කරුණක්. ඉතා ක්‍රමවත් විනයවත් දියුණු මානව සමාජයකින් යුක්ත සමාජීය වටපිටාවක් අපට තිබුණා. ක්‍රිස්තු පූර්ව 3 වැනි සියවසේ සිට ම රජු මූලික වූ සමාජ ක්‍රමයක් එය. රජුගේ ප්‍රධානත්වයෙන් ඉතා ම සංවර වූ සංවිධිත වූ සවිබල ගැන්වුණු බල කේන්ද්‍රයකින් යුතු සමාජයක් ලෙසයි එය විහිදී ගියේ. ක්‍රි.පූ. 3 වැනි සියවසේ සිට ක්‍රි.ව. 12 වැනි සියවස දක්වා තිබුණේ අනුරාධපුර රාජධානිය. අද අප සමාජමය වශයෙන් දකින සියල්ල එදාත් තිබුණා. අවශ්‍ය පහසුකම් රට වැසියන්ට තිබුණා. ඔවුන් සශ්‍රීකයි. සෑම අතින් ම පොහොසත්. රජවරු ජනතාවට බරක් නොවන ලෙස බදු ආදායම පවා එකල රැස් කළා. එයින් කිසිදු සමාජ බලපෑමක් වූයේ නැහැ. ඔවුන් ඒ බදු ආදායම් රටේ සංවර්ධනයට සෘජු ව ම යොදා ගත්තා.

ආසියාවේ රිදී රේඛාව බඳු සේද මාවත ඔස්සේ ආගිය වෙළෙඳ ප්‍රජාව රාජකීය ප්‍රභූවරු සහ දේශගවේශකයන් පවා අපේ රටට පැමිණියා. විශේෂයෙන් චීනය, ආරාබිය වැනි රටවල වෙළෙඳ කණ්ඩායම්වලින් මාතොට වැනි වරාය ස්ථාන ජාතියකට දෙවැනි නොවන ඉහළ මට්ටමකයි වැජඹුණේ. අනුරාධපුර යුගයේ සිට පැවති එකී ප්‍රබල ජන සාමාජය මහනුවර යුගය වන විටයි පසුබෑමකට ලක් වූයේ. අපට රජු මූලික වූ සමාජ පද්ධතිය අහිමි වන්නේ ඒ අවධියේදී. 16 වැනි සියවසේ සිට ආ පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන්ගේ බල විහිදුමය එයට හේතු වුණේ. ඔවුන් මෙරට බොහෝ දේ වෙනස් කළා මෙන් ම ඇතැම් දේ ගොඩනැඟීමත් කළා. විශේෂයෙන් ලන්දේසීන් ගාල්ල ඇතුළු ව මෙරට බලකොටු කිහිපයක් ගොඩනැඟුවා. එහෙත් ලන්දේසින් මෙරට ඉදිකිරීම් කළේ ඕලන්දයට අවශ්‍ය ආකාරයට නොව ලාංකික සමාජ පරිසරයට ගැළපෙන්න. රාජකීය පැරණි දේපළ මෙන් ම බටහිර ජාතීන් මෙරට ඉදි කළ බලකොටු හා වෙනත් ගොඩනැඟිලි පවා අදත් මෙරටට මූල්‍ය ශක්තිය කැඳවන ධන උපායන මාර්ග බවට පත් ව තිබෙනවා. එතල මෙරට වතු කර්මාන්තය හා අනෙක් යටිතල පහසුකම්වල වර්ධනයත් රටට අයහපතක් වූයේ නැහැ.

ඔවුන් රටේ නීති පද්ධතිය ක්‍රමානුකූල ව එක තලයකට ගෙන ඒමත් රට දියුණු මට්ටමට පත්වීමට රුකුල් දුන්නා. විශේෂයෙන් අතීතයේ පැවති කෘෂි හා වාරි කර්මාන්ත ක්‍රියාවලිය මෙරට ආර්ථිකයේ කොඳු නාරටිය ලෙසිනුයි පැවතුණේ. රටේ බහුතර ප්‍රභූ පක්ෂය ආර්ථකයෙන් පොහොසත් උදවිය නිසා ඔවුන් මෙරට දේශපාලනයට අත තිබ්බේ සවිමත් පදනමකින්. 1948 වකවානුව වන විට මෙරට ජාතික නායකත්වය දැරූ සියල්ලන් ම ආර්ථික බලයෙන් පොහොසත් ව සිටි අය. නිදහස දිනා ගන්නා විටත් ලංකාව ලෝකයේ නම් දරාපු රටක් වුණේ සැප සම්පතින් ආඪ්‍ය වූ බලසම්පන්නභාවය නිසා.

එහෙත් නිවැරදි ව නොගත් ඇතැම් දේශපාලන තීන්දු හා ආර්ථික ප්‍රතිපත්ති නිසා සුරපුරයක් බවට පත් විය යුතු රටක් වෙනසකට ලක් වුණා. 1956 සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වීමත් පසුව උද්ගත වූ සමාජ අවපාතයට හේතුවක්. එයින් අපට යුරෝපය සමග සෘජු ව තිබූ ඇතැම් සබඳතා නැවතුණා. ආර්ථිකය නොවැටී තබා ගැනීමට ජනසතු ව්‍යාපාර මුලදී ප්‍රතිඵලදායක වුවත් පසුකාලීන ව පැවති දුර්වල කළමනාකාරිත්වය ඒවායේ පරිහානියට හේතු වුණා. රාජ්‍ය මූලික ව ක්‍රියාත්මක වූ ආර්ථික ධනෝපායන මාර්ග කඩා වැටීමත් ඒවායේ ප්‍රමිතියක නිවැරදි නායකත්ව පිහිදීම් නොමැති වීමත් නිසා රටේ ගමන්මග තරමක් වෙනස් වූ බව පැහැදිලි වන කරුණක්. එවකට මෙරට ප්‍රධාන ආයතන සියල්ල ම රජයේ. ඒ නිසා ඒවායේ ඉදිරි ප්‍රගමනය අවුල් වුණා. එංගලන්තයේ තත්ත්වය මීට වඩා වෙනස්. ඔවුන්ගේ දුම්රිය සේවය ක්‍රියාත්මක වන්නේ පෞද්ගලික අංශයෙන්. සමස්ත මාර්ග පද්ධතිය ම විනයගරුකයි. සමාජය ම ඒ විනයගත ක්‍රමවේදයෙන් ඉදිරියට ම ගමන් කරනවා. එහෙත් අපේ රටේ තත්ත්වය මීට වෙනස් වුණා. රටක් ලෙස සෘජු ව නැඟී සිටීමට අපොහොසත් වුණා. 1972 ලංකාව ජනරජයක් වීමත් සමග බ්‍රිතාන්‍යය සමග තිබූ සියලු බැඳීම්වලින් ඉවත් වුණත් ඉන් රටේ ඇතැම් අංශවල ඇති වුණේ සෘණ අපගමනයක්. 1971 කැරැල්ල හා නැඟුණු දේශපාලන බලවේගයක් මේ රටේ ඉදිරි ගමනට බාධා කළා. දේශීය කර්මාන්ත ක්‍රමවේදය ඉදිරියට ගියත් ඒවා නිසි ලෙස අස්වැද්දීමට ඇතැම් අයට නොහැකි වුණා. ස්වයං නිෂ්පාදන ආර්ථිකය කඩා වැටීම සිදු වන්නේ 1977න් පසුව. ඒ, විවෘත ආර්ථිකයට රට විවර කිරීම නිසා. ආර්ථිකය නියාමනයකින් තොර ව මෙලෙස විවර වීම නිසා එතෙක් නොවූවිරූ සමාජ ප්‍රශ්න රැසකට රට මුහුණ පෑවා.


1948 නිදහස් උළෙළ


කැලණි ටයර් නිපදවීම



පැවැති පැරණි මැතිවරණ ක්‍රමය අනුව ගමක නායකත්වය ඒ ගමට වැඩ කළා. බොහෝ විට ඔවුන් පිළිගැනීමක්, විශ්වාසයක් තිබුණු අය. එහෙත් දිස්ත්‍රික්කයෙන් මනාප ක්‍රමයට මැතිවරණය ගත් විට ගමේ නායකයා ඒ ගමට නැති වෙලා. බලය හා ප්‍රචාරණය මුවහත් කරගත් අයයි ඉදිරියට පැමිණෙන්නේ. මේ ක්‍රමය වෙනස් වීමත් රටේ අනාගතයට යහපතක්.

එදා ලංකාවේ වේයන්ගොඩ, පූගොඩ වැනි කර්මාන්ත ප්‍රදේශවල තුල්ටෙක්ස්, වේටෙක්ස් ආදී කර්මාන්තශාලා රැසක් තිබුණා. අද එවැනි බොහෝ කර්මාන්ත වැසී ගිහින්. අප නැවතත් මේ කර්මාන්ත ක්‍රමය වර්ධනය කර ගැනීමයි වැදගත්.

රටක් වශයෙන් අප නිෂ්පාදන ආර්ථික ක්‍රම හැඩගස්වා ගත යුතුයි.

අපනයනය වැඩිදියුණු කළ තරමටයි ආර්ථික ප්‍රතිලාභ අත්විඳිය හැක්කේ. අතීතයේ රජවරු මේ බව තේරුම්ගත් නිසා ආසියාවේ ප්‍රබල වාණිජ බල කේන්ද්‍රයක් බවට ලංකාව පත් වුණා. එදා මෙරට අභ්‍යන්තර වෙළෙඳාමත් විදේශ වෙළෙඳාමත් ඉතා ක්‍රමවත් ව හා විධිමත් ව පවත්වාගෙන යාමට හැකි ව තිබුණා. මේ සියල්ල රටේ ස්වයංපෝෂිත ආර්ථිකය කඩා නොවැටෙන ලෙස


2008 උතුරු නැගෙනහිර යුද ජය


අපේ ඇඟලුම්


සංචාරක උරුමය

පවත්වාගෙන යාමට හැකි වූයේ ඔවුන් දූරදර්ශී ව ක්‍රියා කළ නිසා.

අප අමතක කළ යුතු නැහැ දශක තුනකට එහා උතුරු-නැගෙනහිර පැවති යුදමය ත්‍රස්තවාදය. ඉන් රටේ ආර්ථික මර්මස්ථානවලට බලපෑමක් වුණා. ග්‍රාමීය ජන ජීවිතය හා ආර්ථිකය අප්‍රාණික වීමත් සමස්ත ජනතාවට ම බලපෑ දැඩි පීඩනයත් රටේ ගමන්මග හරස් කළ බව සත්‍යයක්. එහෙත් එය හැරවුම් ලක්ෂයක් කරගෙන යුද ජයග්‍රහණයෙන් පසුව රටේ දිශානතිය සීඝ්‍ර ධනෝපායන පරිවර්තනයකට ලක් කර ගැනීම නිසි පරිදි සිදු වූයේ ද යන්න ගැඹුරින් විමසා බැලිය යුතු වනවා.

අපට අමතක කරන්නට බැහැ දෙවැනි ලෝක යුද්ධයෙන් පසු තිව්‍ර කඩා වැටීමකට ලක් වූ ජපානය වැනි රටවල් හිස එසවූ ආකාරය. ණය ආධාර මත ම අපට ගොඩනැගෙන්නට බැහැ. දේශීය නිෂ්පාදන, සංචාරක කර්මාන්තය නිසි ලෙස මාර්ගගත කර ගැනීමයි අවශ්‍ය වන්නේ. ශ්‍රී ලංකාව තරම් සංචාරක ආකර්ෂණය දිනා ගත හැකි වෙනත් දිවයිනක් නැතිතරම්. හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රෝලන්ඩ් සිල්වා සීගිරිය සංචාරක ව්‍යාපෘතිය ඉහළ මට්ටමකට ගෙන ආවා. සීගිරිය නඩත්තු කළේ එම මුදල්වලින්. සීගිරිය ආරක්ෂා කර ගැනීමත් එයින් රටට මුදල් උපයා දීමත් කළේ සීගිරියේ සංචාරක ව්‍යාපෘතියෙන්. එම ඓතිහාසික ශ්‍රී විභූතිය, පාරිසරික සුන්දරත්වය මෙරට ආර්ථිකමය ලෙස උපරි වර්ධනයකට ගෙන ඒමට තරම් සවිමත්. අප නිවැරදි ව එය ආයෝජනය නොකිරීම නිසයි නිදහසින් වසර 76ක් ගත වී තිබියදීත් තව ම ආර්ථිකමය කඩඉම් රේඛාව දිනුම් කණුව කරා යාම ප්‍රමාද වූයේ. සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයත් ග්‍රාමීය සවිබලයත් එකට ශක්තිමත් වී රට සංවර්ධනය කිරීමට ජාතික සැලැස්මක් නිවැරදි ක්‍රමවේදයක් අවශ්‍ය වනවා. එය රජයෙන් රජයට වෙනස් නොවන පොදු ක්‍රමවේදයකට එනතාක් මේ දියුණුව ලබන්නට බැහැ. සමස්ත දේශපාලන යාන්ත්‍රණයත් රටේ සියලු ආර්ථික සම්පාදන ආයතනත් එක් දිශාවකටයි යොමු විය යුත්තේ.

රටේ පූජ්‍ය පක්ෂයත් මීට වඩා වගකීම් සහගත ව ආගමික පිළිවෙත් ගරුසරු ව ක්‍රියා කිරීම අවශ්‍ය වනවා. සියලු ආගම් අනන්‍ය ධර්මතා රැකගෙන ජනතාවට සත්‍යවාදී ව මැදිහත්වීමයි අවශ්‍ය වන්නේ. රජයක් ගන්නා සාධනීය ක්‍රියාමාර්ග දූරදර්ශී ව දැක සහයෝගය දීමත් වැරදි තීරණයකදී වහා විය යුත්ත පෙන්වාදීමත් බුද්ධිමත්වයි සිදු විය යුතු.

**නිශාන්ත පීරිස්**




# ගෝලීය හවුල්කාරීත්වයෙන් සමෘද්ධිය කරා....

**චන්දන මාරසිංහ**

නොබැඳි ජාතීන්ගේ 19 වැනි සමුළුව (Non-Aligned Movement) 2024 ජනවාරි 19-20 දෙදින පැවැත්වුණේ උගන්ඩාවේ කම්පාලා නුවරදී. ඒ, සාමාජික රටවල් 120ක, නිරීක්ෂණ රටවල් 18ක, නිරීක්ෂණ සංවිධාන 10ක නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන්.

මේ සමුළුව පැවැත්වෙන්නේ වසර 03කට වරක්. මෙහි ඉහළ ම තීරණ ගැනීමේ සමුළුව ලෙස සැලකෙන්නේ රාජ්‍ය නායකයන්ගේ සමුළුව. නොබැඳි ජාතීන්ගේ සාමාජික රටවල ජනගහනය බිලියන 4.6ක් වන පසුබිමක ජාත්‍යන්තර තලයේ කටයුතු වෙනුවෙන් විශාල බලපෑමක් කිරීමට නොබැඳි සමුළුවට හැකියාව පවතිනවා.

මෙවර සමුළුව ආරම්භ කරමින් උගන්ඩාවේ විදේශ අමාත්‍ය ජෙනරල් අබුමාකර් ජේජේ ඔඩිංගා ප්‍රකාශ කළේ ගෝලීය වශයෙන් ත්‍රස්තවාදය, දේශගුණ විපර්යාස සහ සාගතය ඇතුළු අභියෝග හමුවේ පවත්වන මේ සමුළුවේදී හවුල් ගෝලීය සමෘද්ධිය සඳහා කටයුතු කිරීම වඩාත් යෝග්‍ය වන බව. එක්සත් ජාතීන්ගේ මහලේකම් අන්තෝනියෝ ගුටෙරස් පෙන්වා දුන්නේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ මූලධර්ම හා නොබැඳි ව්‍යාපාරයේ බැන්ඳුම් මූලධර්ම අතර අභිසාරීතාවක් පවතින බව.

එක්සත් ජාතීන්ගේ සංවිධානයට පසුව වැඩි ම සාමාජික රටවල් සංඛ්‍යාවක් සිටින නොබැඳි ව්‍යාපාරයට ආරම්භක ප්‍රඥප්තියක්, ගිවිසුමක් හෝ ස්ථිර ලේකම් කාර්යාලයක් නැහැ. ව්‍යාපාරයේ කාර්යයන් සම්බන්ධීකරණය හා කළමනාකරණය කිරීමේ වගකීම පැවරෙන්නේ සභාපතිත්වය දරන රටට. ඒ අනුව උගන්ඩාව 2024 වසරේ සිට 2027 වසර දක්වා එහි සභාපති ධුරය දරනවා.

චීන ජනාධිපති ෂී ජින්පින්ගේ විශේෂ නියෝජිතයෙක් ද මෙවර සමුළුවට එක් ව සිටියා. එහිදී ඔහු පෙන්වා දුන්නේ චීනය සෑම විට ම සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ සාමාජිකයකු වන බවත් ගෝලීය සංවර්ධන මුලපිරීම සහ ගෝලීය ආරක්ෂක මුලපිරීම් ප්‍රවර්ධනය කිරීමට නොබැඳි ජාතීන් සමග එක් ව කටයුතු කිරීමට සූදානම් බවත්.

ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මෙවර සමුළුවේදී කරුණු ගණනාවක් අවධාරණය කළා. ඔහු පෙන්වා දුන්නේ ඩිජිටල් හා තාක්ෂණික බෙදීම්වලින් මෙන් ම සාමූල ඝාතක අවිභාවිතයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ සංවර්ධිත රටවල් අතර ගැඹුරු අසමානතාවක් නිර්මාණය කර ඇති බව. යහපත් ලෝකයක් වෙනුවෙන් ශක්තිමත් හා එක්සත් නොබැඳි ජාතීන්ගේ සංවිධානයකින් එම ගැටලු කඩිනමින් විසඳා ගත යුතු බවත් ඔහු සඳහන් කළා. වසර 05ක් ඇතුළත පලස්තීන රාජ්‍යයක්


1976 ශ්‍රී ලංකාවේ පැවති නොබැඳි ජාතීන්ගේ සමුළුවට එක් වූ සියලු රාජ්‍ය නායකයන්

පිහිටුවිය යුතු බවත් ජනාධිපතිවරයා පෙන්වා දුන්නා. මේ සමුළුවට එක් වූ ශ්‍රී ලංකා ජනාධිපතිවරයා උගන්ඩා ජනාධිපති, දකුණු අප්‍රිකා ජනාධිපති, ටැන්සානියා අගමැති, බහමාස් අගමැති සහ ඉතියෝපියාවේ අගමැති අතර ද්විපාර්ශ්වික සාකච්ඡා ද පවත්වා තිබෙනවා.

මෙවර සමුළුවේදී ප්‍රධාන වශයෙන් අවධානයට ලක්වුණේ ඊශ්‍රායල් හා හමාස් සංවිධානය අතර ගැටුම සම්බන්ධයෙන්. මේ ගැටුමෙන් පලස්තීනය අර්බුදයකට ලක් ව තිබෙනවා. මේ පිළිබඳ සාකච්ඡාවේ ප්‍රධාන තේමාව ලෙස ගැනුණේ 'ගෝලීය වශයෙන් හැකියා බෙදා ගැනීම අරභයා සහයෝගිතාව පුළුල් කිරීම' යන්න.

රාජ්‍ය නායකයන් රුසක් ඊශ්‍රායල් යුද්ධය බරපතල විවේචනයකට ලක් කළ බවයි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය සුමුදු වලාකුළුගේ සඳහන් කරන්නේ. අදහස් දක්වන සුමුදු වලාකුළුගේ; "බොහෝ රාජ්‍ය නායකයන් සාමකාමී පලස්තීනයකට සහය පළ කළා. අනාගත ලෝක ක්‍රමය තුළ නොබැඳි ජාතීන්ගේ පෙළගැස්ම සහ භූමිකාව සකස් කර ගත යුතු ආකාරය සම්බන්ධයෙන් ද අවධානය යොමු කර තිබෙනවා. 'කම්පාලා ප්‍රකාශනය' නිර්මාණය කරන්නත් එහිදී තීරණය කළා. පලස්තීනයට වෙන ම ප්‍රකාශයක් නිර්මාණය කරන්න අවධානය යොමු ව තිබෙනවා. ලෝකයේ අසමාන ආර්ථික අත්කර ගැනීම්වලට විරුද්ධ වී සංවර්ධනය වෙමින් පවතින රටවල් උපරිම ලෙස සිය පහසුකම් සලසා ගන්නා ආකාරය පිළිබඳ ව මෙන් ම ශක්තිමත් කලාපීය සංවිධාන තුළ නොබැඳි ජාතීන්ගේ භූමිකාව පිළිබඳවත් මෙවර සමුළුවේදී අදහස් හුවමාරු වුණා."

ආර්ථික මතවාදය නියෝජනය කළ බටහිර කඳවුර නැතහොත් ගෝලීය උතුරේ ප්‍රධාන කඳවුර සහ අනෙක් පැත්තෙන් සමාජවාදී දේශපාලන මතවාදයත් කොමියුනිස්ට් ආර්ථික උපාය මාර්ග අනුගමනය කළ රුසියාව ප්‍රමුඛ සමාජවාදී කඳවුරත් ලෙස. මේ කඳවුරු දෙක අතර යුද්ධ සංග්‍රාම භූමියක් නොතිබුණාට බරපතළ තරගයක් හා අරගලයක් දක්නට ලැබුණා. මෙම රටවල් දෙකේ ජාතික අභිලාෂ ලක්ෂගත වූ ඇතැම් ස්ථානවලින් යුද්ධවලට ආසන්න අවස්ථා ලෝකයේ පරිධියේ ඇති වුණා. කොරියන් යුද්ධය, කියුබා මිසයිල අර්බුදය, වියට්නාම් යුද්ධය වැනි යුද්ධයට ආසන්න අවස්ථා තිබුණා. මේවායෙහි ගැටලුව වූයේ සුපිරි බලවතුන්ගේ යුද්ධයක් නිසා ඊට සම්බන්ධයක් නොතිබූ අය යුද්ධය මතවාදී ලෙස ප්‍රතික්ෂේප කිරීම. මෙයින් තුන් වැනි ලෝකයේ රටවලට බලපෑමක් ඇති වුණා."

ඒ අනුව සංවර්ධනය වෙමින් පවතින රටවල් කිහිපයක රාජ්‍ය නායකයන් සාකච්ඡා කර සංවර්ධනය වෙමින් පවතින රටවල කඳවුරක් පිහිටුවා ගැනීමටත් පවතින ආරක්ෂක, ආර්ථික හා දේශපාලන වෙනස්වීම පිළිබඳ ව සංවර්ධනය වෙමින් පවතින රටවලට පොදු මතයක් ඉදිරිපත් කළ හැකි වේදිකාවක් ගොඩනැගීම. දෙවැනි අරමුණ ලෙස ගොනු කළේ යටත්විජිතහරණය නිර්මාණය කිරීම. වර්ණ භේදවාදයට විරුද්ධ වීම, න්‍යෂ්ටික අවිහරණය, න්‍යෂ්ටික අත්හදාබැලීම් නැවැත්වීම යන කරුණු ඉස්මතු කිරීම. තුන් වැනි කරුණ වන්නේ ලොව ඒ වන විට ගොඩනැගී තිබුණු අසමාන ආර්ථික තත්ත්ව සමනය කර සංවර්ධනය වෙමින් පවතින රටවලට පය ගසා සිටිය හැකි අලුත් ආර්ථිකයක් ලෝක ආර්ථික ක්‍රමය තුළ නිර්මාණය කිරීම.

මේ කාරණා යථාර්ථයක් බවට පත්වුණේ නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය නිර්මාණය වීමෙන් පසුව. නොබැඳි ව්‍යාපාරය විධිමත් ලෙස පිහිටුවා ගැනීම 1961 සැප්තැම්බර් මස 01-06 දක්වා යුගොස්ලෝවියාවේ බෙල්ග්‍රේඩ්හිදී පැවැත්වුණා. ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඉන්දුනීසියාව හා ඇල්ජීරියාව ඇතුළු රටවල නියෝජිතයන් ඊට සහභාගි





සමුළුව අතරතුර

කථිකාචාර්ය සුමුදු වලාකුළුගේ නොබැඳි ජාතීන්ගේ සමුළුව බිහිවීමේ පසුබිම පැහැදිලි කළේ මෙලෙස. ඔහු; "නොබැඳි ජාතීන්ගේ සමුළුව ආරම්භ වීමට මූලික අදහස ලැබුණේ 1950 ගණන්වලදී. 1955 වසරේදී සංවර්ධනය වෙමින් පවතින රටවල බැන්ඩුම් නමින් සමුළුවක් පවත්වා තිබෙනවා. එහි මූලික ලෙස සඳහන් වුණේ අප්‍රිකා හා ආසියා රටවල් අතර මූලික සාකච්ඡා පැවැත්වීම. ඒ වන විට ලෝකයේ තිබූ න්‍යෂ්ටික අවි ගැන සහ ප්‍රධාන බලවතුන් කණ්ඩායම් දෙක අතර අරගලයට මැදිහත් නොවී සිටින ආකාරය පිළිබඳවත් මෙහිදී අවධානය යොමු ව තිබෙනවා. දෙවැනි ලෝක යුද්ධය අවසන් වූ පසු ලෝකය කඳවුරු දෙකකට බෙදුණා ලිබරල්වාදී දේශපාලන මතවාදය හා ධනවාදී

ඒ කඳවුර එම රටවල් අපේක්ෂා කරන කාර්යයන් වෙනුවෙන් පෙනී සිටීමටත් බැන්ඩුම් සමුළුවේදී අදහස් පළ කළා. මේ කරුණු යම් ආකාරයකට න්‍යායගත කිරීමක් එහිදී සිදු වුණා.

1961 වසරේදී ඊජිප්තුවේ කයිරෝ නගරයේදී ඉදිරියේදී නිර්මාණය කරගත යුතු තුන් වැනි ලෝකයේ රාජ්‍යවල සංවිධානයක් ගැන සැලසුම් කිරීමේ සමුළුවක් පැවැත්වුණා. මේ සමුළුවේදී ප්‍රධාන කාරණා 03ක් සාකච්ඡා කළ බවයි කථිකාචාර්ය සුමුදු වලාකුළුගේ පවසන්නේ. ඉදිරියේදී ගොඩනගන සංවිධානයට පදනමක් වෙනුවෙන් පළමු කරුණ ලෙස සාකච්ඡා වන්නේ 1960 දශකය වන විට ලෝක පරිමාණ ව සිද්ධ වෙමින් වී තිබෙනවා. ඒ සඳහා ලෝකයේ ප්‍රධාන රාජ්‍ය නායකයන් කිහිපදෙනෙක් එක් ව සිටියා. යුගොස්ලෝවියාවේ මාෂල් ටිටෝ, ඊජිප්තුවේ ගමල් අබ්දුල් නසාර්, ඉන්දියාවේ ජවහල්ලාල් නේරු, ඝානාවේ ක්වාමෙන් කෘෘමා සහ ඉඳුනිසියාවේ සුකර්නෝ එම නායකයන්. මේ නිසා සංවර්ධනය වෙමින් පවතින රටවල් යම් බලවත් තත්ත්වයක සිටියා.

ශ්‍රී ලංකාව මේ සමුළුවේ ආරම්භක සාමාජිකයෙක්. 1976 වසරේදී එහි 05 වැනි රාජ්‍ය නායක සමුළුව සඳහා ශ්‍රී ලංකාවට සත්කාරකත්වය හිමි වුණා. ඒ අනුව 1976 සිට 1979 දක්වා එහි සභාපති ධුරය හිමි වූයේ ශ්‍රී ලංකාවට.

කථිකාචාර්ය සුමුදු වළාකුළුගේ පවසන ආකාරයට නොබැඳි ජාතීන්ගේ සමුළුවේ මූලධර්ම කිහිපයක් තිබෙනවා. එනම් ලෝක පරිමාණ ව මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, රාජ්‍යයන්ගේ ස්වාධිපත්‍යය සහ භෞමික අඛණ්ඩතාව, භූමිය නොබෙදීම ඉස්මතු කිරීම, ලොව ඒ වන විට යටත්විජිත ලෙස රටක් පවතී නම් ඊට නිදහස ලබාදීම වෙනුවෙන් සහය පළකිරීම, කුමන අයුරින් හෝ නිර්මාණය වන ප්‍රධාන සුපිරි බලවතුන්ගේ ඉලක්කවලින් ඉවත්වීම ඒ අතරට අයත්.

1961 වසරේ සිට මේ දක්වා පැවති සමුළු 19දී නොබැඳි ජාතීන්ගේ සංවිධානය ප්‍රධාන ජයග්‍රහණ කීපයක් අත්කරගෙන තිබීම සුවිශේෂත්වයක්. ඉන් වැදගත් ම කරුණක් වන්නේ මූලධර්මවල පිහිටා සිටිමින් ජාතීන්ගේ ස්වයං නීර්ණ අයිතිය සඳහා සහාය පළකිරීම. අප්‍රිකා හා ආසියා කලාපයේ රාජ්‍යවල ස්වයං නිර්ණ අයිතිය වෙනුවෙන් පෙනී සිට බොහෝ අවස්ථාවල එය ජය ගැනීමට හැකි වූ බව කථිකාචාර්ය සුමුදු වළාකුළුගේ සඳහන් කරනවා. අදහස් දක්වන ඔහු; "1971 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ජගත් සංවිධාන මහා මණ්ඩලයේදී යෝජනාවක් ඉදිරිපත් කළා ඉන්දීය සාගර කලාපය සාම කලාපයක් බවට පත් කළ යුතු බවට. න්‍යෂ්ටික අවි අත්හදා නොබලන මහා බලවතුන් මැදිහත් නොවූ සාම කලාපයක් ලෙස එය පවත්වාගෙන යා යුතු බවයි ඇය සඳහන් කළේ. නොබැඳි සංවිධානයේ සියලු රාජ්‍ය නායකයන් ඊට සහාය පළ කළා. ඒ හේතුවෙන් යෝජනාව සම්මත වුණා. සීතල යුද්ධය සක්‍රීය ව පැවති සමය එනම් 1945-1989 කාලය ආරක්ෂක සංවිධානවල සන්ධානගත වීමක් සිදුවුණා. එහෙත් නොබැඳි ජාතීන්ගේ සංවිධානය හේතුවෙන් 1961-1990 කාලය වසර 30ක පමණ කාලයක් කිසිදු සංවර්ධනය වෙමින් පවතින රටක් මේ බල කඳවුරුවල කොටස්කරුවකු නොවී මධ්‍යස්ථ ව සිටියා. යම් අවස්ථාවල යම් ආකාරයේ මැදිහත්වීම් සිදුවුණා."

නොබැඳි ජාතීන්ගේ සංවිධානය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නිරීක්ෂණ රටවල් 18න් චීනය හා බ්‍රසීලය නොබැඳි ජාතීන්ගේ අභ්‍යන්තරයට එක් කර ගත යුතු බව කථිකාචාර්යවරයා පෙන්වා දෙනවා. ලෝකය මේ වන විට ගමන් කරන්නේ ඇමරිකාව සහ චීනය කේන්ද්‍ර කරගත් ක්‍රමවේදයකට. යුක්රේන යුද්ධය හේතුවෙන් රුසියාව දුර්වල වෙමින් පවතිනවා. යුරෝපා සංගමයේ බලවත් ම සාමාජිකයා වූ එංගලන්තය ඉවත්වීමෙන් පසුව එය යම්දුරකට දුර්වල සංවිධානයක් බවට පත්වුණා. මේ හේතුවෙන් ආපසු ලෝකය සීතල යුද්ධයක් දෙසට යොමු වෙමින් පවතින බවයි කථිකාචාර්ය සුමුදු වළාකුළුගේ සඳහන් කරන්නේ. නොබැඳි ජාතීන්ගේ සම්මේලනයට ඇමරිකාවේ ඍජු මැදිහත්වීමක් නොමැති වුවත් ඇමරිකාව මේ සම්මේලනයේ හැසිරීම සමීප ව නිරීක්ෂණය කරන බවයි කථිකාචාර්යවරයා පවසන්නේ. යම් ආකාරයකින් බ්‍රසීලය හා චීනය නොබැඳි ජාතීන්ගේ ස්ථාවර රටවල් බවට පත්වුවහොත් ඇමරිකාවට අනිවාර්යයෙන් නොබැඳි ජාතීන් කෙරෙහි මිත්‍රශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට සිදුවන බවත් ඔහු පෙන්වා දෙනවා.

බලවතුන් සමග ගැටීමෙන් වැළකීමට. නොබැඳි ජාතීන්ගේ මූලධර්මවලට අනුගත වෙමින් දකුණු අප්‍රිකාව, ඊශ්‍රායලයට එරෙහි ව ජන සංහාරක නඩුවක් ගොනු කළේ ජාත්‍යන්තර අධිකරණයේදී. එහි තීන්දුව පලස්තීනයට හිතකර වුව ද ඊශ්‍රායලය ඊට අවනත බවක් දැක්වූයේ නැහැ. ඇමරිකාව ඔවුන්ගේ මතවාදය වෙනුවෙන් පෙනී සිටීම ද ඊට හේතුවක්. ගෝලීය දකුණේ රටවල අවශ්‍යතා වෙනුවෙන් ද ඇමරිකාවේ අවධානය යොමු කළ යුතු වනවා. එම රටවල අවශ්‍යතා හා ප්‍රමුඛතාවලට පහසුකම් සැලසීම මූලික අරමුණක්. එසේ වන්නේ එම රටවල කලාපීය සංවිධාන ශක්තිමත් වන විට නේටෝ වැනි සංවිධාන තරමක් දුර්වල ලක්ෂණ පෙන්නුම් කරන බැවින්. මේ


ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ඉතියෝපියානු අගමැති අබි අහමඩ් සමග ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වමින්


උගන්ඩාවේ කම්පාලා නුවරදී නොබැඳී ජාතීන්ගේ 19 වැනි සමුළුව පවත්වමින්

නොබැඳි ජාතීන්ගේ සමුළුව, ෂැන්හයි සහයෝගිතා සංවිධානය සහ බ්‍රික්ස් සංවිධානය අතර යම් පොදු තත්ත්වයක් ද දක්නට ලැබෙනවා. එක් අරමුණක් වූයේ ඇමරිකාවේ ආධිපත්‍යයට හමුදාමය වශයෙන් නොව දේශපාලනික ව අභියෝග කර බහු ධ්‍රැවීය ලෝකයක් ස්ථාපිත කිරීම. එහිදී ඉන්දියාව වැනි රටවල් උපාය මාර්ගික ස්වයංපාලන ක්‍රමවේදයක් අනුගමනය කර තිබෙනවා. ඇමරිකාවේ සම්බාධක නොතකා රුසියාවෙන් ඉන්ධන මිල දී ගැනීම ඊට උදාහරණයක්. එසේ ම ඉන්දියාව නොබැඳි සමුළුවෙන් ඉවත් ව වෙන් ව කටයුතු කිරීමට හැකියාව ඇති බවට ඇමරිකාව කළ යෝජනාව ද මෙතෙක් ඉටුවී නැහැ. ඉන්දියාවේ සිට ඉඳුනීසියාව දක්වාත් බ්‍රසීලයේ සිට තුර්කිය දක්වාත් නයිජීරියාවේ සිට දකුණු අප්‍රිකාව දක්වාත් සංවර්ධනය වෙමින් පවතින රටවල් වැඩි අවධානය යොමු කරන්නේ ප්‍රධාන රටවල අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටීමට ඇමරිකාව අපොහොසත් වී ඇති බව පෙනී යන කරුණක්. ගාසා තීරයේ සිදුවන අමානුෂික ක්‍රියාවලියට එරෙහි ව ද දැඩි ලෙස පෙනී සිටීමට නොබැඳි ජාතීන් ක්‍රියා කළේ මෙවැනි පසුබිමක. ආසියාවේ අප්‍රිකාවේ සහ ලතින් ඇමරිකාවේ ජාතික විමුක්ති ව්‍යාපාරවල උච්චතම අවස්ථාවක බිහි වූ නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය ලෝක සාමය හා මානව ප්‍රගතිය වෙනුවෙන් පෙනී සිටින සංවිධානයත් බවට පත් ව තිබෙනවා. එහි මූලික අවශ්‍යතාවක් වන්නේ බල අරගලවලට නතු නොවී ස්වාධීන ව ක්‍රියා කිරීමට හැකිවීම. නොබැඳි ජාතීන්ගේ මූලධර්මවලට ගරු කිරීම සෑම රටක ම වගකීමක්. එසේ වන්නේ වරින් වර සුළු වශයෙන් හෝ එම මූලධර්ම උල්ලංඝනය වීමට අවස්ථාව පවතින බැවින්.



# උරුමයට උරුමය

**රංගිකා අබේසේකර**

> ‘උරුමය’ වැඩසටහනෙන් අපේක්ෂා කරන්නේ 1947 රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාර ව දැනටමත් මහජනතාව භුක්ති විඳින ඉඩම් කොටස් සඳහා 1982 වසරේ සිට ලබා දුන් දීමනාපත්‍ර ලක්ෂ 20 සහ බලපත්‍ර ලක්ෂ 06 වසර කීපයක් ඇතුළත නිදහස් දීමනාපත්‍ර වශයෙන් පූර්ණ ලෙස බැහැර කිරීම.

ලෝකයේ සියලු ම ශිෂ්ටාචාර ගොඩනැගී ඇත්තේ භූමිය මුල්කරගෙන. එයින් ගම්‍ය වන්නේ භූමියක උරුමයක් නොමැති ව මානව වර්ගයාගේ පැවැත්මක් නොමැති බව. අතීත මුතුන් මිත්තන්ගෙන් රජය ලබාගත් ඉඩම් ඔවුන්ගේ වර්තමාන පරම්පරාවට පූර්ණ අයිතිය සහිත ව ලබාදීම සඳහා 2024 අයවැය යෝජනා අංක 8 යටතේ අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම මෙරට භූමි පරිභෝජනයේ හැරැවුමක් ලෙසයි සැලකිය හැක්කේ. මෙරට සමස්ත භූමි ප්‍රමාණය 162,000,000ක් (හෙක්ටයාර ලක්ෂ 65,000ක්) වන අතර ඉන් 82%ක භූමිය රජයට අයත් වනවා.

‘උරුමය’ වැඩසටහනෙන් අපේක්ෂා කරන්නේ 1947 රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාර ව දැනටමත් මහජනතාව භුක්ති විඳින ඉඩම් කොටස් සඳහා 1982 වසරේ සිට ලබා දුන් දීමනාපත්‍ර ලක්ෂ 20 සහ බලපත්‍ර ලක්ෂ 06 වසර කීපයක් ඇතුළත නිදහස් දීමනාපත්‍ර වශයෙන් පූර්ණ ලෙස බැහැර කිරීම. මේ වැඩසටහනේ පළමු අදියර යටතේ දිස්ත්‍රික්ක 25ට ම බෙදී යන ලෙස නිදහස් දීමනාපත්‍ර 10,000ක් ලබාදීමට නියමිත ව තිබෙනවා. එහි සමාරම්භය පෙබරවාරි මස 05 දින ජනාධිපතිගේ ප්‍රධානත්වයෙන් රංගිරි දඹුලු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී පැවැත්වෙනු ඇති.

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මේ කාර්යයට එක් වනවා.

රජයේ ඉඩමක පදිංචි ව සිටින්නකුට එම ඉඩමේ නිරවුල් අයිතියක් නොමැති වීම ගැටලු සහගත තත්ත්වයක්. තම පරම්පරාව වෙත අයිතිය තහවුරු කිරීමට අවකාශ නොලැබීම එහිදී කැපී පෙනෙන කාරණයක්. දැනට ඇති ස්වර්ණ භූමි, ජයභූමි, බලපත්‍ර වැනි අයිතිය තහවුරු කරන කොන්දේසි සහිත ලේඛන ඊට නිදසුන්. විශේෂයෙන් 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පැවරීම් කළ නොහැකි, විකිණීමට නොහැකි, වැඩි ආදායම්ලාභියකුට මිලදී ගත නොහැකි, අඩු ආදායම්ලාභියකුට පමණක් පවරාගත හැකි, ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අවසරය ලබා ගැනීම අනිවාර්ය වූ කොන්දේසි සහිත දීමනාපත්‍ර ලබා දී තිබෙනවා.

අදහස් දක්වන සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් දර්ශන වික්‍රමාරච්චි; ”ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ දිස්ත්‍රික් මට්ටමින් තිබෙන බලපත්‍ර, කොන්දේසි සහිත දීමනාපත්‍ර බවට පත් කිරීමට පරිගණක දත්ත පද්ධතිය ඔස්සේ අමාත්‍යාංශය වෙත තොරතුරු යොමු කර තිබුණා. ජනාධිපතිගේ අවසරය, උපදෙස් හා අනුමැතිය ඇති ව නීතිපතිගේ උපදෙස් සහ සහයෝගය සහිත ව එම බලපත්‍රවල නීතිමය ගැටලු විසඳා කොන්දේසි විරහිත නිදහස් දීමනාපත්‍ර 10,000ක් බවට පත්කිරීමයි අපගේ කාර්යය වූයේ. ‘උරුමය’ වැඩසටහනේ අදියර 2 සහ 3 යටතේ ඉදිරියටත් බලපත්‍ර හෝ දීමනාපත්‍ර හිමි ජනතාවට ජනාධිපතිගේ ප්‍රතිරූප අත්සනින් යුතු ලක්ෂ 20ක නිදහස් දීමනාපත්‍ර ලබා දීමට සූදානම්. 2024 වසර අවසන් වීමට ප්‍රථම ඉන් ලක්ෂයක පමණ නිදහස් දීමනාපත්‍ර සකසා අවසන් කරනවා.

මෙහිදී සිදුවන්නේ යම් පුද්ගලයකු සතු ව තමන්ට අනන්‍ය වූ දීමනා පත්‍රයක් තිබේ නම් ස්ව කැමැත්තෙන් ලිඛිත ව ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව රජය වෙත භාරදෙන කොන්දේසි සහිත දීමනාපත්‍රය වෙනුවට රජය විසින් කොන්දේසි රහිත නිදහස් දීමනාපත්‍රයක් ලබාදීමට පියවර ගැනීම."

නීතිමය ගැටලු හේතුවෙන් උසාවි දක්වා ගිය බලපත්‍ර සහ දීමනාපත්‍ර සහිත පිරිසටත් මේ නිදහස් දීමනාපත්‍ර ලබා ගැනීමට අවස්ථාව තිබෙනවා. එහෙත් ඊට ප්‍රථමයෙන් පාර්ශ්ව දෙක සමථයකට පත් ව ඔවුන්ගේ එකඟතාවෙන් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉල්ලීමක් කිරීමෙන් ඒ සඳහා අවස්ථාව හිමිකර ගත හැකි බවයි අතිරේක ලේකම්වරයා සඳහන් කරන්නේ.

ඉඩම් සම්බන්ධයෙන් මෙරට ක්‍රියාත්මක වන්නේ රෝම ලන්දේසි නීතිය. මුල් යුගයේ රජු භූපති, භූපාල ලෙසින් හඳුන්වා ඇත්තේ රජුට සමස්ත භූමියේ අයිතිය හිමි ව තිබූ නිසා වන්නට ඇති. විශේෂයෙන් එකල සන්නස්, තුඩපත් හා තල්පත්වලින් ජනතාවට වගා සහ නොයෙකුත් කාරණා සඳහා ඉඩම් ලබා දී තිබෙනවා. ඒ, එහි සමස්ත අයිතිය රජු සතු ව තබා ගනිමින්. පසුකාලීන ව ඉංග්‍රීසීන්ගේ පැමිණීමත් සමග වගා සඳහා ඔවුන්ට ඉඩම් අවශ්‍ය වුණා. ඒ වන තෙක් මෙරට ජනතාව රජයේ ඉඩම් පරිහරණය කළත් භූමිය ලියාපදිංචි කළ ලේඛන තිබී නැහැ. ඉංග්‍රීසීන් ඉඩම් ලේඛනගත කිරීමට පියවර ගත්තේ ලාංකිකයන්ට අයිතිවාසිකම් කීමට නොහැකි ඉඩම් රජය සන්තක කර ගැනීමට. ඒ අනුව ඔවුන් අයිතිවාසිකම් කීමට නොහැකි සියලු ඉඩම් මුඩුබිම් ආඥා පනතෙන් රජය සතු කළා.

අදහස් දක්වන අතිරේක ලේකම්වරයා; "1930 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොවි ජනපද ආරම්භ කිරීමත් සමග රජයට අයත් ඉඩම් කොටස් කෘෂිකාර්මික හා නේවාසික බිම් ලෙස මහජනතාව වෙත ලබා දී තිබෙනවා. මුල් කාලයේ එක් පුද්ගලයකුට ලබා දී ඇති බිම් ප්‍රමාණය අක්කර 5ක්. ඒ, කෘෂිකාර්මික භූමිය අක්කර 3කින් හා නේවාසික භූමිය අක්කර 2කින් සමන්විත ව. පසුකාලීන ව ඉඩම් සීමාවීමත් ජල සම්පාදන පද්ධති ඇති කිරීමේ අපහසුතාත් හේතුවෙන් එලෙස ඉඩම් ලබාදීම සීමා කර තිබෙනවා. එහෙත් 'උරුමය' යටතේ ලබාදෙන නේවාසික බිම් ප්‍රමාණය පර්චස් 20ක් වන අතර කෘෂිකාර්මික බිම් ප්‍රමාණය පර්චස් 80ක්".

මෙරට භූමියේ අයිතිය ලබාදෙන ප්‍රධාන ඔප්පු වර්ග 2ක් තිබෙනවා. ඒ, සින්නක්කර ඔප්පු, රජයෙන් ලබා දෙන දීමනාපත්‍ර හා බලපත්‍ර ලෙස. රජයේ ඉඩම් සම්බන්ධයෙන් අදහස් දක්වන ජ්‍යෙෂ්ඨ නීතිඥ නිරෝධා කලංසූරිය, "පෞද්ගලික සහ රජයේ ඉඩම් ලෙස වර්ග 2ක් තිබෙනවා. පෞද්ගලික ව අයිතිය තහවුරු කළ නොහැකි ඉඩම් සියල්ල අයිතිකරුවකු සිටියත් නොසිටියත් රජයේ ඉඩම් බවට පත්වනවා. වැදගත් ම කාරණය ඒවා රජයේ කාර්යයන් සඳහා යෙදවීමට අවකාශ තිබීම. ආයතනයකට විකිණීමටත් පුද්ගලයකුට විකිණීමට හෝ බදු දීමටත් පුළුවන්. මෙරට ක්‍රියාත්මක වන්නේ රෝම ලන්දේසි නීතිය නිසා පෞද්ගලික ඉඩමක් ඇති අයකුට නිදහසේ එය භුක්ති විඳීමට, අන්සතු කිරීමට හැකියාව පැවතුණත් රජයේ ඉඩම් සඳහා ඊට නෛතිකමය අවකාශයක් නැහැ. විශේෂයෙන් 1935 ඉඩම් සංවර්ධන ආඥා පනත සැලකූ විට රජය සන්තක ව ඇති ඉඩම් සංවර්ධනය කිරීමේ අරමුණින් අවසර පත්‍රයකින් හෝ බලපත්‍රයකින් හෝ ජනතාවට ලබා දීමේ නෛතිකමය බලයක් තිබෙනවා. එහිදී ජනතාව කොන්දේසිවලට යටත් විය යුතුයි."

> රජයේ ඉඩමක පදිංචි ව සිටින්නකුට එම ඉඩමේ නිරවුල් අයිතියක් නොමැති වීම ගැටලු සහගත තත්ත්වයක්. තම පරම්පරාව වෙත අයිතිය තහවුරු කිරීමට අවකාශ නොලැබීම එහිදී කැපී පෙනෙන කාරණයක්. දැනට ඇති ස්වර්ණ භූමි, ජයභූමි, බලපත්‍ර වැනි අයිතිය තහවුරු කරන කොන්දේසි සහිත ලේඛන ඊට නිදසුන්.

ඇය සඳහන් කරන ආකාරයට 2022 අංක 11 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත යටතේ පෙර පැවැති දෘඪ නීතිය ලිහිල් කර තිබෙනවා. විශේෂයෙන් ඉඩම් සංවර්ධන ආඥා පනතේ අන්තර්ගත නොවන කාරණා රජයේ ඉඩම් ආඥා පනතෙන් ලබා දී තිබෙනවා. ඒ අනුව රජයේ ඉඩම් ආඥා පනතේ 2 වැනි වගන්තියට අනුව රජයේ ඉඩම් (කොන්දේසි සහිත ව) නියත වශයෙන් හෝ තාවකාලික ව ප්‍රදානය කිරීමට ඉඩ ලබා දී තිබෙනවා. එහිදී ගිවිසුම්පත්‍ර, අවසරපත්‍ර හා ප්‍රජා ඔප්පු අන්සතු කිරීමටත් අවකාශය ලබා දී තිබෙනවා. මේ ආඥා පනත් ද්විත්වයට ම වඩා ඉදිරියට යමින් කොන්දේසි සහිත ව තිබූ ඉඩම්, 'උරුමය' වැඩසටහන යටතේ ජනතාවට කොන්දේසි විරහිත ව ඉඩමේ පූර්ණ අයිතිය ලබා දීමයි රජයේ අරමුණ. එය වැදගත් සංකල්පයක්. ඒ අනුව ජනතාවට නිදහසේ තම ඉඩම භුක්ති විඳීමටත් දූ දරුවන්ට අයිතිය ලබා දීමටත් විවිධ ආයෝජන සිදුකිරීමටත් ඒ ඔස්සේ අවකාශ ලැබෙනු ඇති".

මෙවැනි පසුබිමක විශේෂයෙන් පූර්ණ අයිතිය ලැබුණු භූමිය ව්‍යාපාර සඳහා යෙදවීමටත් ආයෝජන කාර්යයට යොදා ගැනීමටත් එහි හිමිකම් ලැබූවන්ට හැකි වීමෙන් පුද්ගලික ව ඔවුන්ගේ ආර්ථිකයත් රටේ ආර්ථිකයත් ශක්තිමත් කළ හැකි පරිසරයක් ඉදිරියේදී නිර්මාණය වීම එලදායී කාර්යයක් වනු ඇති.




# මල් නොතලා රොන් ගැනීම

චන්දන මාරසිංහ

TIN (Taxpayer Identification Number) ලෙස හඳුන්වන්නේ "බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය'. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් පරිපාලනය වන ඕනෑ ම බද්දක් ගෙවන, සෑම තැනැත්තකු ම පෙර සිට ම ඉලක්කම් 9කින් සමන්විත TIN ලබාගෙන තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ විට මේ අංකය ලබාදෙන බැවින් එය ලබා ගත් පමණින් කිසිවකු හෝ බදු ගෙවිය යුතු යැයි අදහස් වන්නේ නැහැ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් නිහාල් විජේවර්ධන සඳහන් කරන ආකාරයට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ බලතල ප්‍රකාර ව 2023 මැයි 31 දින නිකුත් කළ ගැසට් නිවේදනයෙහි අ-කොටසෙන් 2023 ජූනි 01 සිට කාණ්ඩ 14කට අයත් පුද්ගලයන්ට TIN ලබාගැනීම අනිවාර්ය කෙරුණා. ඒ අතර නීතිඥවරුන්, වරලත් ගණකාධිකාරීවරුන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවරුන් වැනි වෘත්තිකයන් මෙන් ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තම ව්‍යාපාර ලියාපදිංචි කළ පුද්ගලයන් ද සිටින අතර කිසියම් අර්ථසාධක අරමුදලකට සේවකයා සහ සේවායෝජකයා යන දෙපාර්ශ්වයේ ම මාසික දායකත්වයට රුපියල් 20,000.00ට වඩා වැඩි සේවකයන් ද ඇතුළත්. එහෙත් ඔවුන් ආදායම් බදු සඳහා යටත්වන සීමාව ඉක්මවා යන ආදායමක් උපයන්නේ නැතිනම් ආදායම් බදු ගෙවිය යුතු වන්නේ නැහැ. වාර්ෂික ව රු.1,200,000.00ට වැඩි ආදායමක් උපයන්නන්ගෙන් පමණයි ආදායම් බදු අයකෙරෙන්නේ.

මේ ගැසට් නිවේදනයේ ආ-කොටසෙන් 2023.12.31 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කළ අය සහ 2024 ජනවාරි 01 දින සිට ඉදිරියට වයස අවුරුදු 18 සම්පූර්ණ කරන අය TIN ලබාගැනීම ද අනිවාර්ය කර තිබෙනවා. මීට සියලු ම ශ්‍රී ලංකාවාසික පුද්ගලයන් ඇතුළත්. විදේශගත ව ජීවත්වන, අධ්‍යාපනය ලබන හා රැකියා කරන ශ්‍රී ලාංකික පුරවැසියන් TIN ලබාගත යුතු නැහැ. එයට හේතුව ඔවුන් ශ්‍රී ලංකාවාසික පුද්ගලයන් ලෙස දේශීය ආදායම් පනතට අනුව හඳුනා නොගන්නා නිසා බවයි නියෝජ්‍ය කොමසාරිස් නිහාල් විජේවර්ධන සඳහන් කරන්නේ. එම නිසා එවැනි අය නැවත ශ්‍රී ලංකාවේ වාසය කිරීමට මෙරටට පැමිණෙන තෙක් TIN ලබාගැනීමට හදිසි විය යුතු නැහැ. ඔවුන් විදේශයන්හි උපයන මුදල් මෙරටට එවූ පමණින් එම මුදල් ලබාගන්නා අය හෝ පවුලේ අය එම ලැබීම මත ආදායම් බද්දකට යටත් වන්නේත් නැහැ.

වයස අවුරුදු 18ට වැඩි සියලු ම ශ්‍රී ලංකාවාසික පුද්ගලයන් ඔවුන්ගේ ආදායම් මට්ටම කුමක් වුවත් TIN ලබාගැනීම අනිවාර්ය කිරීමේ යෝජනාව ඉදිරිපත් වන්නේ 2022 අතුරු අයවැය යෝජනාවක් ලෙස. එම කාලයේදී රටේ ආර්ථික තත්ත්වය සහ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රජයේ බදු ආදායම අඩු අගයක් ගැනීම ඊට හේතු වී තිබෙනවා. නියෝජ්‍ය කොමසාරිස් නිහාල් විජයවර්ධන පෙන්වාදෙන පරිදි බදු ආදායම අඩු වීමෙන් රජයේ වියදම් පියවා ගැනීම ගැටලුවක් වූ නිසා බදු ප්‍රතිසංස්කරණ අවශ්‍ය වීමත් සමග බදු පැහැරහැරීම අඩුකිරීමට ඉදිරිපත් වූ එක් යෝජනාවක් මෙය. පුද්ගලයන් සිදු කරන විවිධ ගනුදෙනු සහ ආයෝජන සඳහා තමන්ගේ TIN සහතිකයේ පිටපතක් අනිවාර්ය කරමින් එම ගනුදෙනු සහ ආයෝජන තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබාගැනීමෙන් ආදායම් බදු නියමිත පරිදි නොගෙවන පුද්ගලයන් හඳුනා ගන්නට පුළුවන්.

එහි මූලික අදියරක් ලෙස 2024 වර්ෂය සඳහා වූ අයවැය යෝජනා යටතේ TIN භාවිතයට ගත යුතු අවශ්‍යතා 4ක් හඳුන්වා දී තිබෙනවා. ඒ, ඕනෑ ම බැංකුවක ජංගම ගිණුමක් ඇරඹීම, මෝටර් රථයක් ලියාපදිංචි කිරීම හෝ බලපත්‍රය අලුත් කිරීම, ඉඩමක හිමිකම ලියාපදිංචි කිරීම, ගොඩනැගිලි සැලැස්මක් අනුමත කිරීම ආදී වශයෙන්. එම කාරණාවලදී TIN සහිත සහතිකයේ පිටපතක් අදාළ ස්ථානවලට ලබාදිය යුතු වනවා. වාහනයක් ලියාපදිංචි කිරීම හෝ බලපත්‍රය අලුත් කරන විට TIN සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ පමණින් යළිත් ආදායම් බදු ගෙවීමේ අවශ්‍යතාවක් නැහැ. මේ යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන නීති රීති සකස් වූ පසු ඒවා ක්‍රියාත්මක වනු ඇති බවත් ඉදිරියේදී මෙවැනි අවශ්‍යතා හඳුන්වා දෙමින් TIN අනිවාර්ය කිරීමේ වැඩපිළිවෙළ ශක්තිමත් ව ක්‍රියාත්මක වනු ඇති බවත් නියෝජ්‍ය කොමසාරිස්වරයා සඳහන් කරනවා.

ආදායම් බද්ද මෙරට ක්‍රියාත්මක වන ප්‍රධානතම සෘජු බද්දක්. සෘජු බද්දක බදු බර තවත් අයෙකුට විතැන් කරන්නට බැහැ. එය බදු ගෙවන තැනැත්තා විසින් ම දැරිය යුත්තක්. එහෙත් වක්‍ර

බදු අයකිරීමේදී වන්නේ භාණ්ඩ හා සේවා මත බදු පැනවීමෙන් සෑම පුද්ගලයකුට ම එක ලෙස බදු ගෙවීමට සිදු වීම. වක්‍ර බදුවල මෙන් ආදායම් බදු බර තවත් අයකුට විතැන් කරන්නට නොහැකි නිසා ආදායම් බදු පැහැර හැරීමට ඇති ඉඩකඩ වැඩියි. මේ නිසා කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ පවසන්නේ TIN අනිවාර්ය කිරීමෙන් නියමිත ලෙස බදු නොගෙවන පිරිස් හඳුනා ගැනීමට හැකි වන බවත් බදු ආදායම් රැස්කිරීමට එය පහසුවක් වන බවත් සහ බදු නොගෙවා සිටින්නට පෙළඹෙන පිරිස් වෙත නීතිය ක්‍රියාත්මක කෙරෙන බවත්.


පහසුවෙන් TIN අංකය ලබාගත හැකි ක්‍රම 03ක් තිබෙන බව නියෝජ්‍ය කොමසාරිස් නිහාල් විජයවර්ධන සඳහන් කරනවා. ඒ, අයදුම්පත්‍රය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන කාර්යාලය, නගර කාර්යාල හෝ ප්‍රාදේශීය කාර්යාලවලින් ලබාගෙන, නැතිනම් www.ird.gov.lk යන දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් බාගත කරගෙන එය සම්පූර්ණ කිරීමෙන් පසු තමන්ගේ ජාතික හැඳුනුම්පතේ දෙපැත්ත ම සහිත පිටපතක් සමග දෙපාර්තමේන්තු කාර්යාලයකට භාරදීමත් එය දෙපාර්තමේන්තුවේ ලිපිනයට තැපැල් කිරීමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිස අයදුම්පත්‍රය පුරවා වෙබ් අඩවිය ඔස්සේ ම යොමු කිරීමත් වශයෙන්. යම් අයකුට තොරතුරු විමසීමට අවශ්‍ය නම් 1944 අංකයට ඇමතීමෙන් හෝ වෙබ් අඩවියෙහි ඇති මාර්ගෝපදේශවලින් උපදෙස් ලබාගත හැකි අතර ලියාපදිංචි වන පුද්ගලයන් ලබාදෙන සංවේදී හා රහස් තොරතුරු ආරක්ෂා කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බැඳී සිටිනවා.

මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ සඳහන් කරන ආකාරයට මේ වැඩපිළිවෙළෙහි අභියෝගය වන්නේ එකවර විශාල පිරිසක් මේ පද්ධතියට ඇතුළු කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හැකියාව තිබේද යන්න. වාර්ෂික ව ඉදිරිපත් කළ යුතු ආදායම් වියදම් ලේඛන පරීක්ෂා කිරීම ආදිය කොතරම්දුරට සාර්ථක ව කළ හැකි ද යන්නත් ගැටලුවක්. සැලසුම් කර තිබෙන පරිදි ආදායම් අධිකාරියක් පිහිටුවීම සිදු කළහොත් මේ වැඩපිළිවෙළ සාර්ථක වනු ඇති බවයි ඔහු පවසන්නේ.

බදු ගෙවීමට අදාළ අණපනත් බහුතරයක් පැරණි වන බවත් මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ පෙන්වා දෙනවා. බදු ගෙවීමේදී යම් නොගැළපීමක් ඇතිවුවහොත් බදුවලට අදාළ අභියාචනා ඉදිරිපත් කළ හැකි අතර ම බදු ගෙවන්නන්ට අධිකරණ ඇතුළු අනිකුත් ක්‍රියාමාර්ගවලින් බදු ගෙවීමට කාලය ලබාගත හැකි වනවා. එය යහපත් තත්ත්වයක් නොවන නිසා වර්තමානයට ගැළපෙන ලෙස නීති සකස් විය යුතු බවයි මහාචාර්යවරයා පවසන්නේ. අදහස් දක්වන ඔහු; "නූතනයට ගැළපෙන ලෙස නීති සැකසීමේදී අදාළ සහන ඊට ඇතුළත් විය යුතුයි. වාණිජ අධිකරණයක් පිහිටුවීමත් වැදගත්. 21 වැනි ශත වර්ෂයේ බදු ව්‍යුහය කළමනාකරණයට පැරණි අණපනත් යොදා ගැනීම සුදුසු වන්නේ නැහැ. බ්‍රිතාන්‍ය ජාතිකයන් හඳුන්වා දුන් අණපනත් ඉදිරියට ගෙනයාම වෙනුවට නව අණපනත් හඳුන්වා දිය යුතුයි. අභියාචනා ආදී ක්‍රියාමාර්ග හේතුවෙන් වසර 15ක් පමණ වන තුරු පුද්ගලයකුට බදු පැහැර හැරීමේ හැකියාව පවතිනවා. මේ විෂමතා ඉවත් කළ යුතුයි."

TIN අනිවාර්ය කිරීමේ ඉලක්කවලට යොමු වීම සඳහා කාලයක් ගත වන්නට පුළුවන්. ඒ, ජනතාව ඊට හුරුවීම සහ ආදායම් පිළිබඳ නිවැරදි දත්ත රැස්කිරීමට කල්ගතවීම වැනි කාරණා හේතුවෙන්. මේ නිසා බදු එකතු කිරීමේ යාන්ත්‍රණය සරල කිරීම, නිවැරදි ලෙස බදු ප්‍රතිසංස්කරණ සිදු කිරීම කාලීන අවශ්‍යතාවක්.

21 වැනි ශත වර්ෂයේ බදු ව්‍යුහය කළමනාකරණයට පැරණි අණපනත් යොදා ගැනීම සුදුසු වන්නේ නැහැ. බ්‍රිතාන්‍ය ජාතිකයන් හඳුන්වා දුන් අණපනත් ඉදිරියට ගෙනයාම වෙනුවට නව අණපනත් හඳුන්වා දිය යුතුයි. අභියාචනා ආදී ක්‍රියාමාර්ග හේතුවෙන් වසර 15ක් පමණ වනතුරු පුද්ගලයකුට බදු පැහැර හැරීමේ හැකියාව පවතිනවා. මේ විෂමතා ඉවත් කළ යුතුයි.



# නව ලෝක රටාවක උපත

මොහාන් සමරනායක

2023 වසර මනුෂ්‍ය සමාජයේ යුග පරිවර්තනයක උපත නිශ්චිත ව සලකුණු කළා. එම වසර, ඉතිහාසයේ අන් ඕනෑ ම කාලවකවානුවක් සේ ම යුද්ධ, අවිගැටුම්, ආණ්ඩු පෙරළි, කුමන්ත්‍රණ, ආර්ථිකයේ නැගීම් සහ වැටීම්, විද්‍යාවේ හා තාක්ෂණයේ ප්‍රගතිය ආදී ලක්ෂණවලින් සලකුණු වූවක්. එහෙත් 2023 වසර ඓතිහාසික ව වැදගත් වන්නේ නව ලෝක රටාවක උපත සිදු ව ඇති බව පැහැදිලි ව පෙනී යන සාක්ෂි දක්නට ලැබෙන නිසා. 1991 දෙසැම්බර් මාසයේදී සෝවියට් දේශය බිඳවැටීමෙන් අනතුරු ව නිර්මාණය වූ ඒකධ්‍රැව ලෝක රටාව නිශ්චිත ව ම අවසන් වන ලකුණු 2023 වසරේදී දක්නට ලැබුණා.

එක්සත් ජාතීන්ගේ මහලේකම් අන්තෝනියෝ ගුටෙරස් 2023 වසරේ ජූලි මාසයේ 20 දින එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් හමුවේ නව ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කළා. එය නම් කර තිබුණේ 'සාමය සඳහා නව න්‍යාය පත්‍රයක්' (new agenda for peace) යනුවෙන්. මේ ලේඛනයේ මහ ලේකම්වරයා සඳහන් කරනවා "දැන් අපි හැරවුම් ලක්ෂයකට පැමිණ සිටිනවා. පශ්චාත් නිරවි යුද සමය අවසන්. නව ගෝලීය රටාවක් දෙසට ලෝකය පරිවර්තනය වෙමින් තිබෙනවා. ඒ නව ලෝක රටාවේ සමෝච්ඡ රේඛා තව ම නිර්වචනය වී නැති නමුත් ලොව නායකයන් බහුධ්‍රැව (Multipolar) ලෝක රටාවක් ගැන කතා කරන්නට පටන් අරන්." යනුවෙන්.

'පශ්චාත් නිරවි යුද සමය' යනුවෙන් අදහස් වන්නේ 1991දී සෝවියට් දේශය බිඳවැටීමෙන් පසුව උදා වූ අවධිය. එම යුද සමය අවසන් වී ඇති බව ලෝකයේ ප්‍රධාන පෙළේ දේශපාලන චරිත පසුගිය වකවානුවේ ප්‍රකාශ කළා. ඉන් එක් අයකු ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ජෝ බයිඩන්. ඔහු 2022 වසර සඳහා සම්පාදනය කළ 'එක්සත් ජනපද ජාතික ආරක්ෂක උපාය මාර්ගය' නමැති ලේඛනයේ පෙරවදනේ සඳහන් කරනවා "පශ්චාත් නිරවි යුද සමය ස්ථිර ව ම අවසන්" (The post cold war era is definitely over) යනුවෙන්.



පශ්චාත් නිරවි යුද සමය අවසන්. ඒ වෙනුවට නව ලෝක රටාවක් බිහිවෙමින් තිබෙනවා. ලෝකයේ එක් එක් ජාතීන් අතර ආර්ථික, දේශපාලන, මිලිටරි, සාමාජීය, සංස්කෘතික සබඳතා ජාලයේ හැඩරුව නිර්මාණය වී තිබෙන ආකාරයයි දළ වශයෙන් ලෝක රටාව යන්නෙන් අදහස් කෙරෙන්නේ. මනුෂ්‍ය සමාජයේ මෑත ඉතිහාසයේ එවැනි ලෝක රටා කිහිපයක් ම දක්නට ලැබුණා. 1500 වසර වෙත අප ගමන් කළහොත් පැරණි වැඩවසම් ලෝකය බිඳවැටී නව ලෝක රටාවක් බිහිවීම දක්නට පුළුවන්. එය කෙමෙන් විකාශනය වූවක්. මේ ලෝක රටාවේ ප්‍රධාන ලක්ෂණය වුණේ යටත්විජිත සහිත අධිරාජ්‍ය ගොඩනගා ගත් සහ එහි බලකේන්ද්‍ර සමග සෘජු සම්බන්ධතා ඇති කරගත් රාජ්‍ය අතළොස්සක් ලෝකය ම දේශපාලන, ආර්ථික, මිලිටරි, සාමාජීය, සංස්කෘතික වශයෙන් පාලනය කිරීම. එය දීර්ඝ කාලයක් පැවතුණේ එක ම ආකාරයට නොවෙයි, වෙනස්කම් සහිත ව. 1939දී ආරම්භ වී 1945දී අවසන් වූ දෙවැනි ලෝක සංග්‍රාමය සමග 1500දී ගොඩනැගුණු බටහිර යුරෝපීය ජාතීන් අතළොස්සකගේ ආධිපත්‍යයට නතු වූ ලෝක රටාව බිඳවැටෙන්නට පටන් ගත්තා. යටත්විජිත වශයෙන් පැවැති රටවල් එකිනෙක ස්වාධීනත්වය දිනා ගත්තා. 1980 වන විට ලෝකයේ සෘජු යටත්විජිත කිසිවක් ඉතිරි වී තිබුණේ නැහැ. මෙසේ 1945න් පසු නිර්මාණය වූ නව ලෝක රටාවේ මූලික ලක්ෂණය වුණේ එය කලින් තිබුණු ලෝක රටාව මෙන් බහුධ්‍රැව එකක් නොවී ද්වීධ්‍රැව (Bipolar) ලෝක රටාවක් බවට පත්වීම.

ද්වීධ්‍රැව ලෝක රටාවේදී ලෝකයේ ජාතීන් අතර ආර්ථික, දේශපාලන සබඳතා ජාලය නිශ්චය කළේ එක්සත් ජනපදයේ නායකත්වයෙන් යුත් ධනේශ්වර නැතහොත් බටහිර ආධිපත්‍යයෙන් යුත් කඳවුර සහ සෝවියට් දේශයේ නායකත්වයෙන් යුත් සමාජවාදී කඳවුර. මේ බල කඳවුරු දෙකට මැදින් 1945න් පසු කාලවකවානුවේදී බිහි වන නව රාජ්‍ය පද්ධතිය ලෝක ඉතිහාසයේ, ලෝක වේදිකාවේ පෙනී සිටියේ නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය ලෙස. මේ වකවානුව 'නිරවි යුද්ධ සමය' ලෙස ද හැඳින්වෙනවා.

'නිරවි යුද්ධය' ලෙස හැඳින්වෙන මේ කාලවකවානුව 1980 දශකයේ අගභාග යේදී බර්ලින් තාප්පය බිඳවැටීමත් 1991දී සෝවියට් දේශය බිඳවැටීමත් සමග අවසානයකට පැමිණියා. ඉන් අනතුරු ව බිහි වුණේ බටහිර රාජ්‍යවලට සෑම ක්ෂේත්‍රයක ම තීරක බලය හිමි, ආධිපත්‍ය හිමි ලෝක රටාවක්. පශ්චාත් නිරවි යුද සමයේ ප්‍රධාන ලක්ෂණය වුණේ ලෝකයේ ධනේශ්වර කඳවුර නිර්දේශිත නව ලිබරල් ආර්ථික මාදිලිය සෑම රටක් ම කැමැත්තෙන් හෝ අකමැත්තෙන් හෝ වැළඳගැනීම. මේ වකවානුවේදී නිරවි යුදසමයේ සිදුනොවුණු ආකාරයේ දරුණු යුද්ධ රාශියක් හටගත්තා. ඒ, 1991දී ප්‍රථම ගල්ෆ් යුද්ධය, 1995දී පැරණි යුගෝස්ලාවියාවට එරෙහි ව

සිදුවුණු විවිධ ආක්‍රමණ හා අවිගැටුම්, 2001දී ඇෆ්ගනිස්ථානය ආක්‍රමණයකොට යටත් කරගැනීම, 2003දී ඉරාකය ආක්‍රමණයකොට යටත් කරගැනීම, 2011දී ලිබියාවේ රාජ්‍ය නායකයා ඝාතනයකොට එය අස්ථාවර රාජ්‍යයක් බවට පත්වීම ආදී වශයෙන්. මේ අවධියේදී ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ රාජ්‍ය පද්ධතිය වෙනුවට, බලකඳවුර වෙනුවට නව බලකේන්ද්‍ර කිහිපයක් ඉස්මතු ව, වර්ධනය වන්නට පටන් ගත්තා. එහි පෙරමුණේ සිටින්නේ චීනය සහ රුසියාව. නිරවි යුද සමයේදී සහ පශ්චාත් නිරවි යුද සමයේදී චීනය ලෝකයේ ආර්ථික මිලිටරි බලවතුන් බවට, තාක්ෂණික විද්‍යාත්මක ක්ෂේත්‍රයෙන් බලවතුන් බවට කෙමෙන් වර්ධනය වුණා. 1990දී චීනය ලෝක ආර්ථික බලවතුන්ගේ ලැයිස්තුවේ සිටියේ පහළ ස්ථානයක. එහෙත් 1990 දශකය අවසන් වන විට චීනය ලෝකයේ දෙවැනි ආර්ථිකය බවට පත් වුණා.

මේ රාජ්‍ය දෙක මුල් වී, විශේෂයෙන් චීනය මුල් වී නව ලෝක රටාවක් ගොඩනැගීමේ ව්‍යාපාරය පැහැදිලි ව ආරම්භ වී තිබෙනවා. දින කිහිපයකට පෙර චීන ජනාධිපති ෂී ජින්පින් තම ආණ්ඩුවේ ප්‍රධානීන් සමග කළ සාකච්ඡාවකදී කියා සිටියා චීනය සුපිරි මූල්‍ය බලවතකු බවට පත්වීමට ක්‍රියා කරන බව. ඒ, මූල්‍ය වත්කම් (Financial assets) මුල්කොටගෙන ගොඩනගන ආර්ථිකයක් මත නොවෙයි, සැබෑ වටිනාකම් සහිත මූර්ත ආර්ථිකය පදනම් කරගෙන බව. දැන් චීනයේ නායකත්වයෙන් බටහිර කඳවුරට අභියෝග කරන, එරට ආර්ථික ආධිපත්‍යය, දේශපාලන ඇඟිලිගැසීම් ප්‍රතික්ෂේප කරන කණ්ඩායමක් බිහි ව තිබෙනවා. එම කණ්ඩායමයි BRICS යනුවෙන් හැඳින්වෙන්නේ.

BRICS යනු බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය, දකුණු අප්‍රිකාව. 2023 වර්ෂයේදී BRICS කණ්ඩායමට එකතු වූ එක් ප්‍රබල රාජ්‍යයක් වන්නේ ඉරානය. තෙල් සම්පතින් ඉරානය සිටින්නේ 03 වැනි ස්ථානයේ පමණ. මේ නිසා ඉරානය BRICS කණ්ඩායමට එකතු වීම නව ලෝක රටාවක උපත සනාථ කරන සාක්ෂියක්. චීනයේ සහ රුසියාවේ නායකත්වයෙන් යුත් මේ නව ව්‍යාපාරය ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යවහාර මුදල වන ඩොලරයට ලෝක වෙළෙඳාමේදී හිමි ව තිබෙන ආධිපත්‍යය, ප්‍රධානත්වය අභියෝග කරන වැඩපිළිවෙළක් පටන් අරන්, අන්තර්ජාතික වෙළෙඳ ගනුදෙනු දේශීය ව්‍යවහාර මුදල්වලින් කරන්නට ඔවුන් ක්‍රියා කරමින් සිටිනවා. මේ ක්‍රියාදාමය හැඳින්වෙන්නේ De-dollarization එනම් ඩොලර්හරණය යනුවෙන්. ඇමරිකාවේ සහ බටහිර යුරෝපීය රටවල ආධිපත්‍යයට යටත්වුණු අන්තර්ජාතික මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි මූල්‍ය ආයතන වෙනුවට නව මූල්‍ය ආයතන පද්ධතියක් ස්ථාපනයට මේ කණ්ඩායම පියවර ගෙන තිබෙනවා. ඊට ප්‍රබල සාක්ෂියක් ආසියානු ආයෝජන හා යටිතල පහසුකම් බැංකුව සහ Shanghai Cooperation ආයතනය. 2023 වසරේදී විශාල ප්‍රගතියක් අත් කරගත්තා ජනාධිපති ෂී ජින්පින්ගේ නව සේද මාර්ග ව්‍යාපෘතිය (Belt and Road).

මැදිහත්වීම, බලහත්කාරකම්, තන්ත්‍ර පෙරළි ව්‍යාපෘති, මානව හිමිකම් ප්‍රයෝජනයට ගනිමින් සෙසු රටවල් පාලනය කිරීමට ගන්නා උත්සාහය, ලෝකයේ ආර්ථික බලය බටහිර ජාතීන් අත තබාගැනීමට දරන උත්සාහය වෙනුවට සහයෝගිතාව, සෑම රටකට ම තමන්ට අභිමත ආර්ථික මාදිලියක් තෝරා ගැනීමට තිබෙන අයිතිය, තාක්ෂණික ප්‍රගතිය බෙදාහදා ගැනීම, අන්තර්ජාතික වෙළෙඳාමේ ඉඩ ප්‍රස්ථා උදා කිරීම, අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි නොගැසීම, ආක්‍රමණයෙන් වැළකී සිටීම වැනි මූලධර්ම මතයි මේ නව ලෝක රටාව ගොඩනැගෙමින් තිබෙන්නේ. ඊට සහය පළවන තවත් ලකුණු ගණනාවක් 2023දී දක්නට ලැබුණා.

යුක්රේන් යුද්ධයේදී රුසියාව පරාජය කිරීමට නොහැකිවීම ඇමරිකාවේ මිලිටරි ආධිපත්‍යට එල්ල වූ ප්‍රධාන අභියෝගයක්. එය ඇමරිකාවේ මිලිටරි ආධිපත්‍යය දුබල වෙමින් තිබෙන බවට සාක්ෂියක්. 2023 වසරේ ඔක්තෝබර් 07 දින හමාස් නමැති සටන්කාමී සංවිධානය ඊශ්‍රායලයට කළ ප්‍රහාරය සමග ඊශ්‍රායලය, පලස්තීනයට එරෙහි ව ආරම්භ කළ දැවැන්ත මනුෂ්‍ය ඝාතනය පැහැදිලි කරනවා ඇමරිකා එක්සත් ජනපදයේ ආර්ථික මිලිටරි ආධිපත්‍යයට ප්‍රබල ලෙස අභියෝග කිරීමක් පවතින ලෝක රටාව විසින් සිදු කරනු ලබන බව.

'නිරවි යුද්ධය' ලෙස හැඳින්වෙන මේ කාලවකවානුව 1980 දශකයේ අගභාග යේදී බර්ලින් තාප්පය බිඳවැටීමත් 1991දී සෝවියට් දේශය බිඳවැටීමත් සමග අවසානයකට පැමිණියා. ඉන් අනතුරු ව බිහි වුණේ බටහිර රාජ්‍යවලට සෑම ක්ෂේත්‍රයක ම තීරක බලය හිමි, ආධිපත්‍යය හිමි ලෝක රටාවක්. පශ්චාත් නිරවි යුද සමයේ ප්‍රධාන ලක්ෂණය වුණේ ලෝකයේ ධනේශ්වර කඳවුර නිර්දේශිත නව ලිබරල් ආර්ථික මාදිලිය සෑම රටක් ම කැමැත්තෙන් හෝ අකමැත්තෙන් හෝ වැළඳගැනීම.

ඊශ්‍රායලය නිර්මාණය වන්නේ බටහිර ජාතීන්ගේ අවශ්‍යතාව අනුව. 1986දී පමණ වත්මන් එක්සත් ජනපද ජනාධිපති ජෝ බයිඩන් (ඒ වනවිට ඔහු ජනාධිපති නොවෙයි, සෙනෙට් සභිකයෙක්) ප්‍රකාශ කළා ඊශ්‍රායලය නමින් රාජ්‍යයක් මැදපෙරදිග නොතිබුණා නම් ඇමරිකාවට මැද පෙරදිග කලාපය නැත්නම් බටහිර ආසියානු කලාපයේ ස්වකීය වුවමනා ආරක්ෂා කරගැනීම සඳහා ඊශ්‍රායලය නිර්මාණය කිරීමට සිදුවන බව. එයින් පැහැදිලි වන්නේ ඊශ්‍රායලය තෙල් සම්පතෙන් පොහොසත් ගල්ෆ් කලාපයේ, මැදපෙරදිග කලාපයේ ඇමරිකාවේ පොලිස් භටයා බව. දැන් එම පොලිස් භටයාගේ කාර්යයට බරපතල තර්ජනයක්, අභියෝගයක් එල්ලවී තිබෙනවා. මේ සටන ව්‍යාප්ත වෙමින් තිබෙන බව දක්නට පුළුවන්. අද එයට ඉරානය, යේමනය, ඉරාකය, සිරියාව සම්බන්ධ වී සිටිනවා. ඊශ්‍රායලය වර්ග සංහාරයක නිරත වී සිටින බවට දකුණු අප්‍රිකාව එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික අධිකරණයට පැමිණිලිකොට දැන් ඒ නඩුව විභාග වෙමින් තිබෙනවා. මේ ව්‍යාපෘතියට ලෝකයේ සෙසු රටවල සහයෝගය ලැබී තිබෙනවා. ගාසා ගැටුම පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ පැවැති ඡන්ද විමසීම්වලදී එක්සත් ජනපදයේ පාර්ශ්වයට ඡන්දය ප්‍රකාශ කළේ සාමාජිකයන් 193ක් අතරින් 10ක් වැනි ඉතා කුඩා සංඛ්‍යාවක්. තව 30ක් 40ක් පමණ ඡන්දය දීමෙන් වැළකී සිටියා. එහෙත් එක්සත් ජාතීන්ගේ සාමාජිකයන්ගෙන් අතිමහත් බහුතරය සිටින්නේ ඇමරිකාවේ ඊශ්‍රායලය පිළිබඳ ස්ථාවරයට එරෙහි ව. මෙසේ බිහි වන නව ලෝක රටාව නිශ්චිත ව තව ම නිර්වචනය කරන්නට බැහැ. එහි හැඩරුව තව ම තිබෙන්නේ නොපැහැදිලි තත්ත්වයක. එහෙත් මේ ගමන ඉදිරියට සිදු වන බව දක්නට පුළුවන්. එසේ නම් මතු එළඹෙන කාලවකවානුවේදී ලෝකයේ සියලු ජාතීන්ගේ ආර්ථික, දේශපාලන, සාමාජීය, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණික ගමන් මග මේ ලෝක රටාවේ හැඩගැස්ම අනුව, වර්ධනය අනුව තීරණය වන බව නිගමනය කළ හැකියි.

**කාංචනා සිරිවර්ධන**



# හසීනා යළි මහ පුටුවට

ඩබ්. එම්. ශාන්තප්‍රිය

බංග්ලාදේශයේ වත්මන් අග්‍රාමාත්‍ය ලෙස ෂෙයික් හසීනා නැවත වරක් පාර්ලිමේන්තු බලය තහවුරු කර ගත්තේ 2024 ජනවාරි 07 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයෙන්. ඒ අනුව ඇය 05 වැනි වතාවටත් බංගලාදේශයේ අග්‍රාමාත්‍ය ධූරයට පත් වන්නේ වැඩි ම කලක් බංගලාදේශයේ එම ධූරය දැරූ පුද්ගලයා ලෙස ඉතිහාසයට එක්වෙමින්.

පාර්ලිමේන්තු මැතිවරණයෙන් ඇය නායකත්වය දෙන සන්ධානයට ආසන 222ක බලය හිමි වන්නේ එරට පවතින මැතිවරණ කොට්ඨාස 300න්. ලියාපදිංචි ඡන්දදායකයන්ගෙන් 41.8%ක් ඡන්දය ප්‍රකාශ කර ඇති බව එරට මැතිවරණ කොමිසම නිවේදන කළේ' එරට ප්‍රධානතම විපක්ෂය වන කලීඩාෂියාගේ නායකත්වයෙන් යුත් බංග්ලාදේශයේ ජාතිකවාදී පක්ෂය ප්‍රමුඛ සන්ධානය ඡන්දය වර්ජනය කරන තත්ත්වයක් යටතේ. එරට මැතිවරණ කොමසාරිස් සතාවන් හුසේන් මාධ්‍යයට ප්‍රකාශ කර තිබුණේ ඡන්දය ප්‍රකාශ කිරීම අවසන් කිරීමට පැයකට පෙර ඡන්දය ප්‍රකාශ කිරීම 27%ක මට්ටමක පැවැතියත් අවසන් පැයේ වැඩි වශයෙන් ජනතාව ඡන්දය දීමට උනන්දු වීම හේතුවෙන් එය 40% සීමාව පසු කළ බව. අවාමි ලීගයට ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම් එරට දුප්පත් ජනතාවට ලබාදී ඇති සුභසාධන කාඩ්පත් අහෝසි කරන බවට එරට පාලක පක්ෂය කර තිබූ තර්ජනය හමුවේ ජනතාව වැඩි වශයෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා උනන්දු වූ බවයි එරට ප්‍රධාන විපක්ෂය චෝදනා කරන්නේ.

මැතිවරණය සඳහා එරට ලියාපදිංචි දේශපාලන පක්ෂ 44න් 28ක් මෙවර මැතිවරණයට තරග කළ අතර ප්‍රේක්ෂකයන් 2000ට ආසන්න සංඛ්‍යාවක් මැතිවරණ කොට්ඨාස 300 සඳහා තරග වැදී තිබුණා. එහෙත් එරට පාර්ලිමේන්තුවෙහි මුළු මන්ත්‍රී සංඛ්‍යාව 350ක් වන අතර ඉතිරි 50 තෝරා ගත්තේ කාන්තා නියෝජනය සඳහා. මෙය එරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම කළ ප්‍රතිපාදනයක්. 2009 වර්ෂයේ සිට ම පාර්ලිමේන්තු බලය පවතින්නේ ෂෙයික් හසීනාගේ අවාමි ලීගය ප්‍රමුඛ සන්ධානයට.

මෙවර මැතිවරණය විරෝධතා හා ප්‍රචණ්ඩත්වය මධ්‍යයේ පැවැතියක් බව ඇතැම් මාධ්‍ය හා එරට විරුද්ධ පක්ෂ ප්‍රකාශ කළත් එරට මැතිවරණ කොමිසම ප්‍රකාශ කරන්නේ සමස්තයක් ලෙස මැතිවරණය සාමකාමී ව පැවැති බව. එහෙත් එක්සත් ජනපදය හා යුරෝපා සංගමයේ ඇතැම් රටවල් මේ මැතිවරණය නිදහස් හා සාමකාමී නොවුණු බවයි ප්‍රකාශ කර ඇත්තේ.

බංග්ලාදේශයේ ස්ථාපිත වත්මන් පාර්ලිමේන්තු ක්‍රමය 1991දී ඇරඹෙන්නේ එරට ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වන බංග්ලාදේශයේ අවාමී ලීගය හා බංග්ලාදේශ ජාතිකවාදී පක්ෂය ප්‍රමුඛ බහුතර දේශපාලන පක්ෂවල ඉල්ලීම මත හා ප්‍රබල උද්ඝෝෂණ හමුවේ. මිලිටරි පාලනයක් ගෙන ගිය ලුතිනන් ජෙනරාල් එච්. එම්. එල්ෂාඩ් 1990දී ඉල්ලා අස්වීමෙන් පසු භාරකාර රජය යටතේ වත්මන් පාර්ලිමේන්තු ක්‍රමය ඇරඹුණා.

1971 ඔක්තෝබර් මාසයේ පාකිස්තානයෙන් වෙන් කර ස්වාධීන රටක් ලෙස බංග්ලාදේශය පිහිටුවීමෙන් පසු පැවැත්වූ 12 වැනි පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රධාන විපක්ෂ බලවේග වර්ජනය කරන්නේ භාරකාර රාජ්‍යයක් යටතේ මැතිවරණය පවත්වන ලෙස කළ ඉල්ලීම අගමැති ෂෙයික් හසීනා ප්‍රමුඛ ආණ්ඩුව ප්‍රතික්ෂේප කරන තත්ත්වයක් හමුවේ. එහෙත් මෙයට

පෙර සිව් වතාවක් භාරකාර රජයක් යටතේ බංගලාදේශයේ පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වා තිබෙනවා.

බොරු චෝදනා මත විපක්ෂ දේශපාලන නායකයන් අත්අඩංගුවට ගැනීම, මාධ්‍ය මර්දනය මෙන් ම සමාජ මාධ්‍ය ඔස්සේ ආණ්ඩුව විවේචනය කරන දේශපාලන ක්‍රියාකාරිකයන්, ලේඛකයන්, විද්වතුන්, යෞවන කණ්ඩායම්වලට එල්ල කරන පීඩනය, පක්ෂ විපක්ෂ ක්‍රියාකාරිකයන්ට එල්ල වන පොලිස් ප්‍රචණ්ඩත්වය යන ප්‍රධාන චෝදනා විරුද්ධ පාක්ෂිකයන් විසින් ෂෙයික් හසීනා පාලනයට එල්ල කරනු ලබනවා. ඇයගේ පාලන කාලයේ බලහත්කාර අතුරුදහන්වීම්, නීතිවිරෝධී ඝාතන සිදු වූ බවට හියුමන් රයිට් වොච් සංවිධානයේ විවේචනයට ලක් වී තිබෙන අතර 2014 සිට එරට මාධ්‍ය නිදහස සීමා කර ඇති බවයි දේශ සීමාරහිත වාර්තාකරුවන්ගේ සංවිධානය පවසන්නේ.

භාරකාර රජයක් යටතේ මැතිවරණ පවත්වන ලෙස එරට ප්‍රධාන විපක්ෂ බලවේග හඬ නැගුවේ මේ තත්ත්වය යටතේ. බංග්ලාදේශයේ ජාතිකවාදී පක්ෂයේ නායිකාව මෙන් ම විපක්ෂ සන්ධානයේ ද නායිකාව වන කලීඩාසියා තවමත් දූෂණ චෝදනා මත සිරගත ව සිටිනවා. උද්ධමනය, දූෂණය රැකියා නැතිවීම, කම්කරු අයිතිවාසිකම්, භාෂණයේ නිදහස, ආරක්ෂාවීම හා ප්‍රචණ්ඩත්වයෙන් ගැළවීම එරට බහුතර තරුණ ප්‍රජාවගේ විරෝධයට හේතු වූ ප්‍රධාන කාරණා.

1947 ඉන්දියාවෙන් කොටසක් පාකිස්තානය ලෙස බෙදී යන අතර වර්තමානයේ බංග්ලාදේශය නමින් හඳුන්වන කොටස නැගෙනහිර බෙංගාලය ලෙස හැඳින්වූවත් එය පාකිස්තානයට අයිති ප්‍රදේශයක්. 1955 සිට නැගෙනහිර පාකිස්තානය ලෙස බෙංගාලය හැඳින් වූ අතර බටහිර පාකිස්තානයෙන් වෙන් වී ස්වාධීන රටක් බවට පත්වීමට එය විශාල අරගලයක් දියත් කළා. එහි ප්‍රතිඵලයක් ලෙස 1971 ඔක්තෝබර් මාසයේදී බංග්ලාදේශය ලෙස ස්වාධීන රටක් ලෙස ස්ථාපිත වුණා. එසේ ස්ථාපිත වුණත් එරට දශක එකාමාරකට ආසන්න කාලයක් පැවතුණේ හමුදා පාලනයක්.

බංග්ලාදේශය ස්වාධීන රටක් බවට පත්වීමට ගෙන ගිය අරගලයේ නියමුවා ලෙස ෂෙයික් මුජිබර් රහමාන් ඉතිහාසගත ව තිබෙනවා. ඔහු බංග්ලාදේශයේ නිර්මාතෘවරයා මෙන් ම ප්‍රථම ජනාධිපතිවරයා ලෙස ද ක්‍රියා කළ අතර රහමාන් 1975දී ඝාතනය වන තෙක් එරට ජනාධිපති හා අගමැති ධුර හෙබවූවා. ඔහු ආරම්භ කළ අවාමි ලීගය පක්ෂයේ වත්මන් නායකත්වය උසුළන්නේ ඔහුගේ දියණිය වන අග්‍රාමාත්‍ය ෂෙයික් හසීනා.

වර්ග කිලෝමීටර් 148,460ක් විශාල බංග්ලාදේශයේ වත්මන් ජනගහනය මිලියන 170කට ආසන්න වනවා. ප්‍රජාතාන්ත්‍රික අනාගාමික ඒකීය ජනරජයක් වන එරට ආගමික පක්ෂ තහනම්. ස්වාභාවික විපත්, දුගී බව, දේශපාලන ගැටුම් හා හමුදා කුමන්ත්‍රණ බංග්ලාදේශය පිහිටුවීමත් සමග එරට දක්නට ලැබුණු සුලබ දර්ශන.

ලෝකයේ විශාලතම සරණාගත කඳවුරක් වන කොක්ස් බාසාර්හි උයියා බංග්ලාදේශයේ පිහිටුවා ඇති අතර ප්‍රධානතම සරණාගත සත්කාරක රටක් බවට එරට පත් ව තිබෙනවා. මියන්මාරයේ ආගමික හිංසනය නිසා එයින් පලා යන රෝහින්ග්‍යා සරණාගතයන් වැඩි වශයෙන් මෙහි රඳවා තිබෙනවා. ඔවුන්ට රැකවරණය සැපයීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරියට පවතින්නේ විශාල ප්‍රසාදයක්.

බංග්ලාදේශය පසුවන්නේ ලෝකයේ ආර්ථික අතර 36 වැනි ස්ථානයේ. එරට ප්‍රධාන විපක්ෂය ඡන්දය වර්ජනය කළ හැකි තත්ත්වය හමුවේ ඇයගේ පාලනයට වැඩි සුජාතභාවයක් ලබාගැනීම අසීරු කාර්යයක්. 2009 හා 2018 පැවැති මැතිවරණවලදී විශාල වශයෙන් ඡන්ද දූෂණ හා බලහත්කාරකම් සිදු වූ බවට ලෝකයෙන් සහ එරට ප්‍රධාන විපක්ෂයෙන් එල්ල වන චෝදනා ඇගේ පාලනය ඉදිරියට ගෙනයාමට අභියෝගයක්.

විශේෂයෙන් වත්මන් ලෝක සන්දර්භයෙහි සංවර්ධනය වෙමින් පවතින රටවලට ආධාර කිරීමේදී ලෝක මූල්‍ය ආයතන මෙන් ම සංවර්ධිත රාජ්‍ය ද අදාළ රටේ මානව අයිතිවාසිකම් හා ප්‍රජාතන්ත්‍රවාදී පදනම යන කාරණා කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන නිසා ඉදිරියේදී හසීනා පාලනයට ඇති කරනු ඇත්තේ බලවත් පීඩනයක්.

**මෙවර මැතිවරණය විරෝධතා හා ප්‍රචණ්ඩත්වය මධ්‍යයේ පැවැතියක් බව ඇතැම් මාධ්‍ය හා එරට විරුද්ධ පක්ෂ ප්‍රකාශ කළත් එරට මැතිවරණ කොමිසම ප්‍රකාශ කරන්නේ සමස්තයක් ලෙස මැතිවරණය සාමකාමී ව පැවැති බව. එහෙත් එක්සත් ජනපදය හා යුරෝපා සංගමයේ ඇතැම් රටවල් මේ මැතිවරණය නිදහස් හා සාමකාමී නොවුණු බවයි ප්‍රකාශ කර ඇත්තේ.**





# කිරුළ හළ අවසන් රැජින

නිහාල් පීරිස්

බ්‍රිතාන්‍යයේ දෙවැනි එළිසබෙත් රැජින මෑත ඉතිහාසයේ ජනප්‍රිය ම රාජකීයයන් අතර ඉදිරියෙන් ම සිටියකු බව නොරහසක්. මාධ්‍යයේ ද ඇය ගැන නිතර අවධානය යොමු වුණා. නොබෝද තවත් එවැනි ම රැජිනක ගැන විශාල මාධ්‍ය අවධානයක් යොමු ව තිබෙනු දක්නට ලැබුණා. ඒ, ඩෙන්මාර්කයේ දෙවැනි මාග්‍රෙතා රැජින පිළිබඳ ව. ඊට එක් හේතුවක් වූයේ ඇය තමාගේ කැමැත්තෙන් ම සිහසුන අත්හැරීමට පියවර ගැනීම.

ගෙවුණු ජනවාරි 14 දින මාග්‍රෙතා රැජින ඩෙන්මාර්කයේ කිරුළට සමු දුන්නා. ඔටුනු දරන රාජකීයයන් සිය කැමැත්තෙන් ම කිරුළ අතහැරීම නිතර සිදු නොවන්නක්. ඇය ගැන විශේෂ අවධානයක් යොමු වන්නට තවත් හේතුවක් වූයේ ඒ වනවිට ලෝකයේ කිරුළ දරමින් සිටි එක ම රැජින ඇය වීම. ඇය කිරුළ අත්හැරීමෙන් පසු දැන් ලෝකයේ සිහසුන දරන එක ම රැජිනක්වත් නැහැ.

මාග්‍රෙතා රැජින කිරුළ අත්හරිද්දී තවත් වාර්තාවකට හිමිකම් කියමින් සිටියේ ඒ වන විට යුරෝපයේ වැඩි ම කාලයක් සිහසුන දරමින් සිටි රාජකීයයා හැටියට. 1972 ජනවාරි 14 දින සිහසුනට පත් වූ ඇය 2024 ජනවාරි 14 දින සිහසුනෙන් බැස යද්දී වසර 52ක් කිරුළ දරා තිබුණා. බ්‍රිතාන්‍යයේ දෙවැනි එළිසබෙත් රැජින කිරුළ දරද්දී මේ වාර්තාවට හිමිකම් කීවේ ඇය.

මාග්‍රෙතා රැජින කිරුළ අත්හැරීමට හේතු වූයේ සෞඛ්‍යය සම්බන්ධ කාරණා බවයි පෙනුණේ. ඇයගේ වයස අවුරුදු 83ක්. 2023 වසරේ මුල් භාගයේ ඇය තුනටියේ ආබාධයක් නිසා සැත්කමකටත් මුහුණ දී තිබුණා. රජ කිරුළේ බරින් නිදහස් විය යුතු බවක් ඇයට සිතෙන්නට පටන්ගෙන තිබුණේ එයින් පසුව. කිරුළ අත්හැරීම ගැන නිවේදනය කරමින් රූපවාහිනිය ඔස්සේ කළ කතාවේදී ඇය මේ ගැන සඳහන් කළා.

“සැත්කමෙන් පසු මා අනාගතය ගැන කල්පනා කරන්නට පටන් ගත්තා. වගකීම ඊළඟ පරම්පරාවට බාර දීමට කාලය එළැඹ ඇත් ද යන්න කල්පනා කළ මොහොතේ මා තීරණය කළා මෙයයි ඊට වෙලාව කියලා” ඇය පැවසුවා. කිරුළ දරන රාජකීයයකු මෙලෙස සිය කැමැත්තෙන් කිරුළ අත්හැරීම එතරම් සුලබ සිද්ධියක් නොවෙයි. ඩෙන්මාර්කයේ මෙවැන්නක් සිදු ව තිබුණේ වසර 800කට පසුව.

දෙවැනි මාග්‍රෙතා රැජින ඩෙන්මාර්ක වැසියන්ගේ නොමඳ ආදරයට, ගෞරවයට පාත්‍ර ව සිටි බව පැවසෙනවා. බොහෝ දෙනා ඇය සැලකුවේ ප්‍රියමනාප, විනෝදශීලී කෙනකු හැටියට. ඇය කිරුළට සමු දීම මේ නිසා ඩෙන්මාර්ක වැසියන්ට කනගාටුවක් ඇති කර තිබූ බව ද පෙනෙන්නට තිබුණා.

මාග්‍රෙතා රැජින අධික ලෙස දුම්පානයට ඇබ්බැහි ව සිටි කෙනකු බව පැවසෙනවා. මේ නිසා 'අළු බඳුනේ රැජින' (Ashtray Queen) යන නමක් ද ඇයට පටබැඳී තිබුණා. ඇය පිළිබඳ අවධානයට ලක් වූ තවත් විශේෂ කාරණයක් වූයේ කිසි දිනෙක ජංගම දුරකතන හෝ අන්තර්ජාලය හෝ භාවිත නොකිරීම. ඒවා නොමැති වුවත් තමා සතුටින් සිටින බවත් කිරුළ දැරීමට එයින් බාධාවක් වී නොමැති බවත් ඇය වරක් පවසා තිබුණා.

ඩෙන්මාර්කයේ මාග්‍රෙතා රැජින සහ බ්‍රිතාන්‍යයේ දෙවැනි එළිසබෙත් රැජින අතර ඥාති සම්බන්ධයකුත් තිබුණා. ඔවුන් සැලකෙන්නේ ඥාති සහෝදරියන් හැටියට. ඔවුන්ගේ මේ නෑදෑකම පැවතෙන්නේ 1837- 1901 අතර කාලයේ බ්‍රිතාන්‍යයේ කිරුළ දැරූ වික්ටෝරියා රැජිනගෙන් බව සඳහන්. නෑකමට අමතර ව මාග්‍රෙතා සහ එළිසබෙත් රැජින මිතුරියන් ලෙසත් ඇසුරු කළා. තමා එළිසබෙත්

රැජිනගෙන් විශාල ආභාසයක් ලැබූ බවක් වරක් මාග්‍රෙතා රැජින පවසා තිබුණා. "ඇය වගේ ම මමත් මගේ ජාතිය වෙනුවෙන් ජීවිතය කැප කළ යුතු බව මා තේරුම් ගත්තා. ඒ අතින් ගත් විට ඇය මගේ ජීවිතයට ඉතා වැදගත් චරිතයක්" ඇය සඳහන් කළා. 2022 වසරේ එළිසබෙත් රැජින අභාවප්‍රාප්ත වූ අවස්ථාවේ මාග්‍රෙතා රැජින එම අවමගුල් උත්සවයටත් සහභාගි වුණා.

මාග්‍රෙතා රැජින කලාවට විශාල කැමැත්තක් දක්වූවකු හැටියටත් ප්‍රසිද්ධ වනවා. එම්බ්‍රොයිඩරි කලාවට, චිත්‍ර කලාවට ඇය විශේෂ දක්ෂතා දක්වා තිබුණා. චිත්‍රපට තිරනාටක රචනයටත් ඇය සම්බන්ධ වී සිටියා. හාන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන්ගේ සුරංගනා කතා ඇසුරෙන් නිර්මාණය වූ The Snow Queen සහ The Wild Swans යන චිත්‍රපටවල තිර රචනයට ඇය සම්බන්ධ වුණා. මාග්‍රෙතා රැජින විශේෂ කැමැත්තක් දක්වූ තවත් ක්ෂේත්‍රයක් වූයේ පුරාවිද්‍යාව. පුරාවිද්‍යා කැණීම්වලට පවා ඇය සහභාගි වී ඇති බව පැවසෙනවා.

1972 වසරේ ඇය වෙත ඩෙන්මාර්ක රජ කිරුළ හිමි ව තිබුණේ අනපේක්ෂිත ආකාරයෙන්. සෑම අවුරුද්දක ම නව අවුරුදු උදාවත් සමග එරට රජු ජනතාව අමතා ප්‍රකාශයක් කිරීමේ සම්ප්‍රදායක් තිබෙනවා. ඒ වනවිට සිහසුන දරමින් සිටි ඇයගේ පියා වූ 9 වැනි ෆ්‍රෙඩරික් රජු එම වසරේ අවුරුදු ප්‍රකාශය කිරීමෙන් සුළු වේලාවකට පසු රෝගාතුර වී තිබුණා. මුලින් ඔහුගෙන් පළ වී තිබුණේ උණ තත්ත්වයක්. එහෙත් දින තුනකට පසු රජුට හෘදයාබාධයක් වැළඳුණු අතර ඒ අවස්ථාවේ ඔහු වහා රෝහල්ගත කෙරුණත් ඔහුගේ ජීවිතය බේරා ගන්නට වෛද්‍යවරුන්ට හැකි වුණේ නැහැ. රෝහලේ ප්‍රතිකාර ගනිමින් සිටියදී ෆ්‍රෙඩරික් රජු ජනවාරි 14 දින සවස් වරුවේ මරණයට පත් වුණා. ඔහුගේ වැඩිමල් දියණිය වූ මාග්‍රෙතාට සිහසුන බාර ගන්නට සිදු වුණා.

ඩෙන්මාර්කයේ කාන්තාවන්ට කිරුළ දැරීමට හැකියාවක් තිබුණේ නැහැ. එහෙත් 9 වැනි ෆ්‍රෙඩරික් රජුට සිටියේ දියණියන් ම තුන් දෙනෙක්. එවැනි තත්ත්වයක රටේ නීතිය වෙනස් කිරීමට පියවර ගැනුණා. ඒ, කාන්තාවන්ටත් කිරුළ දැරීමට හැකිවන ආකාරයෙන්. නීතිය මේ අයුරින් වෙනස් කර තිබුණේ මාග්‍රෙතාට වයස අවුරුදු 13ක් ව තිබියදී. සිහසුනට පත්වෙද්දී ඇයගේ වයස අවුරුදු 32ක්.

පසුගිය ද මාග්‍රෙතා රැජින සිහසුනෙන් බැස යාමෙන් පසු ඩෙන්මාර්කයේ රජකමට පත් වූයේ ඇයගේ වැඩිමල් පුත්‍රයා වූ ෆ්‍රෙඩරික් අන්ද්‍රෙ හෙන්රික් ක්‍රිස්ටියන් කුමරු. 55 හැවිරිදි ඔහු රජ වූයේ 10 වැනි ෆ්‍රෙඩරික් යන නමින්. මාග්‍රෙතාට ජෝකිම් නමින් තවත් පුතකු සිටිනවා.

ෆ්‍රෙඩරික් රජු සහ ඔහුගේ බිරිඳ වන මේරි බිසව නවීන අදහස් ඇත්තන් හැටියට සැලකෙනවා. ඔවුන් තම දරුවන් සාමාන්‍ය දරුවන් මෙන් හදන්නට උත්සාහ කරන බව ද සඳහන්. රජු සහ බිසව ඔවුන්ගේ දරුවන් යවන්නේ සාමාන්‍ය රජයේ පාසල්වලට බවත් පැවසෙනවා.

ඩෙන්මාර්කයේ රජ කෙනකු හෝ රැජිනක හෝ අභිනවයෙන් පත් වන විට බ්‍රිතාන්‍යයේ මෙන් නිල අභිෂේක මංගල්‍යයක් පැවැත්වෙන්නේ නැහැ. රජ මාළිගය ඒ පිළිබඳ නිවේදනය කිරීම පමණක් සිදු කරනවා. ෆ්‍රෙඩරික් රජුගේ මාලිගය හැඳින්වෙන්නේ 'ක්‍රිස්ටියන්ස්බර්ග් මාලිග ය' යන නමින්. රජ කෙනකු හෝ රැ ජිනක හෝ අභිනවයෙන් පත් වූ විට මාලිගයේ සඳළුතලයේ කෙටි උත්සවයක් පැවැත්වෙනවා. 10 වැනි ෆ්‍රෙඩරික් රජු වෙනුවෙන් පැවැති මේ උත්සවයට අතිවිශාල ජනකායක් සහභාගි වී සිටි අතර එතරම් සෙනගක් රැස් ව සිටිනු දුටු රජුගේ දෑසට කඳුළු පිරුණු බව සඳහන්.

මේ උත්සවයේදී රජු ප්‍රකාශ කළේ තමා රටේ එක්සත්භාවය වෙනුවෙන් පෙනී සිටින, අනාගතයට ගැළපෙන රජකු වන බව. බ්‍රිතාන්‍යයේ චාල්ස් රජු සහ කැමිලා බිසව ද ෆ්‍රෙඩරික් රජු වෙත සුබ පැතුම් පිරිනමා තිබුණා.

මාග්‍රෙතා සහ එළිසබෙත් රැජින



රැජින සිය සැමියා සමග





10 වැනි ෆ්‍රෙඩරික් රජු සහ බිසව

# බද්දේ කතාව




**දීප්ත කුමාර බටගොඩ**

**2024 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා රජය එකතු කළ වටිනාකම මත පනවන බදු (Value Added Tax - VAT) අනුපාතය 15% සිට 18% දක්වා ඉහළ නංවා තිබෙන්නේ 2024 අයවැය යෝජනාවකට අනුව. මේ පිළිබඳ නිසියාකාර ව දැනුවත් නොවීම හේතුවෙන් රටේ ජනතාව විටෙක බියෙන් පසුවන බවක් ද පෙනී යනවා. ඒ, ඇතැම් දේශපාලන පාර්ශ්ව දරන අදහස් හා පුද්ගල සමාජ කණ්ඩායම් දරන අදහස් මත පදනම් ව. මේ නිසා මෙවර 'දෙසතිය' කවරයේ කතාව සැකසෙන්නේ VAT අනුපාතය ඉහළ දැමීම රටේ ආර්ථිකයට හා ජනතාවට කෙසේ බලපායි ද? යන්න විග්‍රහයක යෙදෙමින්.**

## බද්දක් යනු කුමක් ද?

පුද්ගල ආදායම හෝ ව්‍යාපාරික ලාභ මත හෝ භාණ්ඩ හා සේවා ගනුදෙනුවලදී ඒවායේ පිරිවැය මත පදනම් වෙමින් රාජ්‍ය ආදායමට බැර කළ යුතු අනිවාර්ය ගෙවීමක් බද්දක් ලෙසින් ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය (Oxford Dictionary) නිර්වචනය කර තිබෙනවා. බ්‍රිටනිකා ශබ්ද කෝෂයට (The Britannica Dictionary) අනුව බද්දක් යනු රජයක් සිදු කරන කාර්ය වෙනුවෙන් අවශ්‍ය වන වියදම් සඳහා මහජනතාව තම ආදායම, දේපළ ඇතුළු වෙනත් වටිනාකම් අනුව රජයට ලබා දිය යුතු ගෙවීමක්. ඒ අනුව පෙනී යන්නේ බද්දක් යනු රජය සිදු කරන පොදු කාර්ය වෙනුවෙන් සෘජු ප්‍රතිලාභ නොමැති ව මහජනතාව ගෙවිය යුතු අනිවාර්ය ගෙවීමක් බව.

## රජය බදු අයකරන්නේ ඇයි?

මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පවත්වා ගැනීම, මහාමාර්ග හා මංමාවත් ඉදිකිරීම ඇතුළු යටිතල පහසුකම්, සමාජ ආරක්ෂණය හා සුභසාධනය ආදිය වෙනුවෙන් රජයට වියදමක් දැරීමට සිදු වනවා. රජය මේ සඳහා බොහෝ විට මිලක් අය කරන්නේ නැහැ. ඇතැම්විට ඉතා සහන මිලක් අය කරන අවස්ථා ද දක්නට පුළුවන්. මෙවැනි ඇතැම් සේවා සැපයීමට පෞද්ගලික අංශය ඉදිරිපත් වන්නේ ද නැහැ. එසේ ඉදිරිපත් වුවත් ඒ සඳහා විශාල මිලක් ගෙවීමට සිදු වනවා. මේ නිසයි රජයක් රටක දියුණුවට අවශ්‍ය මෙවැනි පොදු සේවා සපයන්නේ. මේ සඳහා අවශ්‍ය වියදම් රජය පියවා ගන්නේ රාජ්‍ය ආදායමේ ප්‍රධාන කොටසක් වන බදු ආදායමෙන්. රජයක් එම රාජ්‍යයේ මහජනතාවගෙන් බදු අය කිරීමේ පදනම සහ එහි යුක්තිසහගත බවට පවතින තාර්කික පදනම මෙයයි.

## මහජනතාව රජයට බදු ගෙවිය යුතු ද?

බදු ගෙවීම සහ ඒවා අය කර ගැනීම පිළිබඳ බදු මූලධර්ම මෙන් ම විවිධ ආගමික අදහස් ද පවතිනවා. බෞද්ධ දර්ශනය අනුව බදු ගෙවීම මහජනතාවගේ යුතුකමක් සහ වගකීමක්. රජු බදු අය කිරීම කළ යුත්තේ බඹරකු මල නොතලා රොන් ගන්නා සේ යැයි පැවසෙනවා. කිතුනුවන්ට අනුව සීසර්ගේ දේවල් සීසර්ටත් දෙවියන්ට අයත් දේ දෙවියන්ටත් යන්නෙන් පැහැදිලි වන්නේ රජයට ගෙවිය යුතු බද්ද ගෙවිය යුතු බවක්. ඒ අනුව රජයකට බද්දක් ගෙවීම මහජනතාව සතු යුතුකමක් සහ වගකීමක්. මහජනතාවගෙන් සාධාරණ ව අය කර ගන්නා බදු මුදල්, නැවත මහජනතාවගේ ම සුභසිද්ධිය උදෙසා ඵලදායි ලෙසින් ආයෝජනය කිරීම ඕනෑ ම රජයක ද වගකීමක්.

රජයක් වුවත් බදු අයකිරීමේදී සම්මත මූලධර්ම අනුව ක්‍රියා කළ යුතු වනවා. සාධාරණත්වය (equity), පිරිමැසුම්දායක බව (economy), පහසුව (convenience), නිශ්චිත වීම (certainty), කාර්යක්ෂම බව (efficiency), නම්‍යශීලි බව (flexibility) එම බදු මූලධර්ම. විශේෂඥයන්ගේ අදහස වන්නේ මේ මූලධර්ම අනුව ක්‍රියාත්මක වීමෙන් රජයේ බදු අය කිරීම නිසා ඇති විය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කර ගැනීමට හැකියාව තිබෙන බව.

## බදු ඉතිහාසය

ලෝක බදු ඉතිහාසය ක්‍රි.පූ. 3000-2800 දක්වා දිවෙනවා. පළමුවෙන් ම බදු අය කරන ලද රට වශයෙන් සැලකෙන්නේ ඊජිප්තුව. බදු පිළිබඳ අර්ථ දැක්වීමට අනුව ලෝකයේ රාජ්‍ය සංකල්පය බිහි වීමත් බදු රැස් කිරීමත් සමගාමී ව සිදුවන්නට ඇතැයි සිතන්නට පුළුවන්.

> **ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමේ සමස්ත බදු ආදායම පසුගිය කාලවකවානුවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට සාපේක්ෂ ව වර්ධනය වීමක් පෙන්නුම් කළේ නැහැ. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙසින් රාජ්‍ය බදු ආදායම ක්‍රම ක්‍රමයෙන් පහළ යාමකුයි පෙන්නුම් කළේ. මෙයට හේතුව ලෝකයේ වෙනත් රටවලට සාපේක්ෂ ව අවම බදු පදනම සහ අවම බදු අනුපාතයක් පවත්වාගෙන යාම.**

ශ්‍රී ලංකාවේ ලිඛිත බදු ඉතිහාසය පිළිබඳ ක්‍රි. පූ. 3 වැනි සියවස දක්වා වූ බවට සාක්ෂි තිබෙනවා. කොත්ගල්කන්ද සෙල්ලිපිය (ක්‍රි.පූ 250), වසභ රජ දවස පෙරිමියන්කුලම සෙල්ලිපිය, IV වැනි මිහිඳු රජුගේ මිහින්තලා ශිලා ලේඛනය, IV වැනි උදය රජුගේ බදුල්ල (හෝපිටිගම) ටැම් ලිපිය, නිශ්ශංකමල්ල රජුගේ පොළොන්නරුව ගල්පොත ශිලා ලේඛනය, I වැනි ගජබා රජුගේ ගොඩවාය සෙල්ලිපිය, මහා වංශය, සමන්තපාසාදිකාව, පූජාවලිය සහ රොබට් නොක්ස් විසින් රචිත 'An Historical Relation of the Island of Ceylon' නැමැති ග්‍රන්ථය ශ්‍රී ලංකාවේ පැවති බදු අය කිරීම පිළිබඳ ලිඛිත සාක්ෂි. 'දකපති', 'බෝජකපති, 'මතරමජබක', 'කැතිඅධ', 'කෙටු කනබ', 'මහවර බද්ද', 'මෙලාඩ්සි බද්ද', 'නිල පඬුරු' අතීත ශ්‍රී ලංකාවේ පැවති බදු වර්ග. මේ බදු අය කර ගැනීම සඳහා විවිධ නිලධාරීන් ද පත්කර තිබුණා.

බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේදී ලංකාවේ එතෙක් පැවති බදු ක්‍රමයේ බොහෝ වෙනස්කම් සිදු වුණා. 'මරාල බද්ද', 'ඇඟ බද්ද', 'පොල් බද්ද', 'මහ බද්ද', 'තුවක්කු බද්ද', සහ 'බලු බද්ද' වැනි බදු වර්ග යටත් විජිතපාලන සමයේදී මෙරට ක්‍රියාත්මක වූ බදු වර්ග. මේ බදු අය කිරීම නිසා ජනතාව මහත් පීඩාවට පත් වූ බව පැවසෙනවා.

වත්මන් බදු ක්‍රමය බ්‍රිතාන්‍ය පාලන සමයේදීයි හඳුන්වා දී තිබෙන්නේ. 1932 අංක 02 දරන ආදායම් බදු ආඥා පනත ශ්‍රී ලංකා බදු නීතියේ වැදගත් සංධිස්ථානයක්. එම පනතෙන් 1932 වසරේ ආදායම් බද්ද හඳුන්වා දී තිබුණා. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම බදු අයකිරීමේ ආයතනය වන ආදායම් බදු දෙපාර්තමේන්තුව එම වසරේදී ම පිහිටුවා ඇති අතර වර්තමානයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් බදු අය කරන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නමින් වෙනස් වූ එම ආයතනය. ශ්‍රී ලංකා රේගුව, සුරා බදු දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන ශ්‍රී ලංකාවේ බදු අය කරන අනෙකුත් ආයතන.

## බදු වර්ගීකරණය (බදු සංයුතිය) හා බදු පදනම

ඕනෑ ම රටක රාජ්‍ය ආදායම ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ බදු ආදායම සහ බදු නොවන ආදායම ලෙස. බදු ආදායම ද නැවත සෘජු බදු සහ වක්‍ර බදු ලෙස වර්ග වෙනවා. සෘජු බදු ලෙසින් අදහස් වන්නේ පුද්ගලයකුගේ ආදායම, පිරිවැය හෝ දේපළ මත පදනම් වෙමින් ඔහුගෙන් සෘජු ව ම යම් බදු මුදලක් අය කර ගැනීම. මේ බදු සෑම පුද්ගලයකු ම ගෙවිය යුතු නැහැ. ආදායම හෝ වත්කම් හෝ (බදු පදනම) අනුව එය වෙනස් වනවා. රටක බදු දැල ශක්තිමත් නොවන විට සෘජු බදු පැහැර හැරීමේ හැකියාව තිබෙනවා. පුද්ගල ආදායම මත පනවන බදු, ව්‍යාපාරික ලාභය මත පනවන බදු ආදි සෘජු බදු සඳහා උදාහරණ.

එහෙත් වක්‍ර බදු බොහෝ විට පුද්ගල තරාතිරම හෝ ආදායම හෝ දේපළ හෝ මත පදනම් වන්නේ නැහැ. පරිභෝජනය කරන භාණ්ඩ හා සේවා මත අය කරන්නක් වක්‍ර බදු. එම නිසා භාණ්ඩ හා සේවා පරිභෝජනය කරන සෑම පුද්ගලයකු ම එම බදු ගෙවිය යුතු වනවා. වක්‍ර බදු පැහැර හැරීමේ හැකියාව අවම මට්ටමක පවතින නිසා පරිභෝජනයෙන් ඉවත් නොවුණහොත් රජයකට අපේක්ෂිත ආදායම ලබා ගැනීමේ හැකියාව ඉහළ මට්ටමක පවතිනවා. භාණ්ඩ හා සේවා බද්ද (GST), එකතු කළ වටිනාකම මත අය කරන බද්ධ (VAT) මේ සඳහා උදාහරණ.

බදු පදනම බොහෝ විට බදු වර්ගීකරණය සමග බැඳී පවතින්නක්. බදු පදනම

**මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව : 2022 - 2027**

ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස

| දර්ශකය | 2021 තාවකාලික | 2022 සංශෝධිත ඇස්තමේන්තුව | 2023 ඇස්තමේන්තුගත | පුරෝකථන 2024 | 2025 | 2026 | 2027 |
|---|---|---|---|---|---|---|---|
| **මුළු ආදායම හා ප්‍රදාන** | **8.3** | **8.8** | **11.3** | **13.5** | **15.0** | **15.1** | **15.2** |
| මුළු ආදායම | 8.2 | 8.7 | 11.3 | 13.5 | 15.0 | 15.0 | 15.1 |
| බදු ආදායම | 7.3 | 7.8 | 10.3 | 12.6 | 14.1 | 14.1 | 14.1 |
| බදු නොවන ආදායම | 0.9 | 1.0 | 0.9 | 0.9 | 0.9 | 0.9 | 1.0 |
| ප්‍රදාන | 0.04 | 0.04 | 0.02 | 0.04 | 0.04 | 0.04 | 0.04 |
| **මුළු වියදම** | **19.9** | **18.6** | **19.2** | **19.9** | **20.0** | **19.9** | **19.9** |
| වර්තන වියදම | 15.5 | 15.2 | 15.2 | 15.3 | 15.6 | 15.4 | 15.3 |
| ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම | 4.4 | 3.4 | 4.0 | 4.5 | 4.5 | 4.5 | 4.5 |
| රාජ්‍ය ආයෝජන | 4.5 | 4.5 | 4.0 | 4.5 | 4.5 | 4.5 | 4.5 |
| **ආදායම් හිගය (-)/අතිරික්තය(+)** | **-7.3** | **-6.4** | **-4.0** | **-1.8** | **-0.6** | **-0.4** | **-0.2** |
| **ප්‍රාථමික හිගය (-)/අතිරික්තය(+)** | **-5.7** | **-4.0** | **-0.7** | **0.8** | **2.3** | **2.3** | **2.3** |
| **අයවැය හිගය (-)/අතිරික්තය (+)** | **-11.6** | **-9.8** | **-7.9** | **-6.3** | **-5.0** | **-4.9** | **-4.7** |

මූලාශ්‍රය - මුදල් අමාත්‍යාංශ වෙබ් අඩවිය



යනුවෙන් අදහස් වන්නේ බද්දට විෂය මූලික වන දෙය. පුද්ගල ආදායම මත බදු පනවා නම් බදු පදනම වන්නේ පුද්ගල ආදායම. භාණ්ඩ හා සේවා සඳහා බදු පනවන විට බදු පදනම වන්නේ බදු අයකෙරෙන භාණ්ඩ හා සේවා. මේ අනුව රජයක බදු ආදායම ඉහළ දමා ගැනීම සඳහා බදු අනුපාතය ඉහළ දැමීමටත් බදු පදනම පුළුල් කිරීමටත් හැකියාව තිබෙනවා.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමේ  සමස්ත බදු ආදායම පසුගිය කාලවකවානුවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට සාපේක්ෂ ව වර්ධනය වීමක් පෙන්නුම් කළේ නැහැ. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙසින් රාජ්‍ය බදු ආදායම ක්‍රම ක්‍රමයෙන් පහළ යාමකුයි පෙන්නුම් කළේ. මෙයට හේතුව ලෝකයේ වෙනත් රටවලට සාපේක්ෂ ව අවම බදු පදනම සහ අවම බදු අනුපාතයක් පවත්වාගෙන යාම. මේ කාලයේ දකුණු ආසියාතික කලාපයේ රටවල් අතුරින් අවම බදු අනුපාතයක් පවත්වාගෙන ගොස් තිබුණේ ශ්‍රී ලංකාව සහ බංගලාදේශය. මේ නිසා අයවැය හිගය සම්බන්ධයෙන් පැවති ගැටලුකාරී තත්ත්වය ද තීව්‍ර වෙමින් පැවතුණා.

## එකතු කළ වටිනාකම මත පනවන බදු (Value Added Tax - VAT)

එකතු කළ අගය මත පනවන බද්ද මුල්වරට හඳුන්වා දුන්නේ 1954 වසරේදී ප්‍රංශය බවටයි සැලකෙන්නේ. ශ්‍රී ලංකාවේ මුල්වරට එකතු කළ අගය මත බදු අය කළේ 2002 අංක 14 දරන පනතින්. එය 2002 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වුණා. භාණ්ඩ හා සේවා බද්ද වෙනුවට එකතු කළ අගය මත බද්ද එවක රජය හඳුන්වා දුන්නේ භාණ්ඩ හා සේවා මත පැනවෙන සාමාන්‍ය බදු ක්‍රමයේ අවාසිසහගත තත්ත්වය අවම කරමින් බදු ගෙවන්නාටත් රජයටත් උපරිම වාසි අත්කරගැනීමට. භාණ්ඩ හා සේවා සඳහා වන බද්දක බොහෝ විට එක ම භාණ්ඩයට කිහිප වරක් බදු අය වීමේ හැකියාවක් තිබෙනවා. එකතු කළ වටිනාකම මත පැනවෙන බද්දකදී බදු පැනවෙන්නේ භාණ්ඩයක එකතු කළ වටිනාකම් මත පදනම් ව. මේ නිසා එක ම භාණ්ඩයට කිහිප වරක් බදු අය කිරීමෙන් වැළකෙනවා. මෙය VATහි පවතින විශේෂ වාසියක් වුවත් මෙය තරමක් සංකීරණ ක්‍රියාවලියක් වීම එහි ඇති අවාසිසහගත තත්ත්වයක්.


භාණ්ඩයක එකතු කළ වටිනාකම මත පදනම් ව බදු මුදල තීරණය කිරීම VATහි පවතින මූලික ලක්ෂණය වන අතර මෙහි අනෙක් ලක්ෂණය වන්නේ සෑම විටෙක ම අවසන් පාරිභෝගිකයා විසින් බදු බර දැරීම. මේ අනුව භාණ්ඩයක කිසියම් නිෂ්පාදන අවස්ථාවකදී එකතු කළ අගය මත පනවන බද්දෙන් නිදහස් වුව ද අවසන් අවස්ථාවේදී භාණ්ඩය පරිභෝජනය කරන්නා එම බදු මුදල ගෙවිය යුතු වනවා. මේ නිසා භාණ්ඩයක් පරිභෝජනය කරන සෑම අවස්ථාවක ම එකතු කළ අගය මත පනවන බද්දෙන් රජයට ලැබෙන ආදායම තහවුරු වනවා. එය අපේක්ෂිත බදු ඉලක්ක සපුරා ගැනීමේදී රජයට වාසියක්.

## VAT ඉහළ දැම්මේ ඇයි ?

රජයට අහිමි වී තිබූ අතිවිශාල ආදායම නැවත ලබාගැනීම VAT ඉහළ දැමීමේ ප්‍රධාන අරමුණ බව පෙන්වා දෙමින් මුදල් අමාත්‍යාංශයේ බදු උපදේශිකා තනුජා පෙරේරා ඒ පිළිබඳ අදහස් දක්වූයේ මෙලෙස. ඇය; "2019 වර්ෂය වන විට VAT සඳහා ලියාපදිංචි වීමේ සීමාව මිලියන 15ක්. 2020 ජනවාරි 01 දින සිට එම සීමාව මිලියන 300ක් දක්වා ඉහළ දැම්මා. එහි ප්‍රතිඵලයක් වශයෙන් VAT සඳහා ලියාපදිංචි වී තිබූ ලිපිගොනු විශාල සංඛ්‍යාවක්  අක්‍රීය වුණා. නැවතත් එම සීමාව මිලියන 80ක සීමාව දක්වා පහත හෙළනු ලැබූ අතර නව සංශෝධනයෙන් 2024 ජනවාරි 01 සිට VAT සීමාව රුපියල් මිලියන 60ක් දක්වා තවදුරටත් පහතට ගෙනැවිත් තිබෙනවා. බදු නිදහස් කිරීම් විශාල සංඛ්‍යාවක් ඉවත් කිරීමට නව සංශෝධනයේදී පියවර ගෙන තිබෙනවා."



විවිධ කාලවල ශ්‍රී ලංකාවේ VAT අනුපාතයේ වෙනස් වීම





මූලාශ්‍රය - මුදල් අමාත්‍යාංශ වෙබ් අඩවිය

ඒ අනුව 2024 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා රජය VAT අනුපාතය 15% සිට 18% දක්වා ඉහළ දමා තිබෙනවා. එතෙක් එකතු කළ අගය මත පනවන බද්දෙන් නිදහස් ව තිබූ භාණ්ඩ රාශියක් ද ඊට යටත් කිරීමෙන් VAT සඳහා වන බදු පදනම ද පුළුල් කර තිබෙනවා. එයින් රජය අපේක්ෂා කළේ රාජ්‍ය ආදායම අපේක්ෂිත මට්ටමකින් ඉහළ දමා ගැනීම. මේ ආකාරයට රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීමට රජයට අවශ්‍ය වූ ප්‍රධාන කාරණා තිබෙන්නේ කිහිපයක් ම.

රටේ ඇති වූ අර්බුදකාරී තත්ත්වය සමග ශ්‍රී ලංකා රජයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගන්නවා හැර වෙනත් විකල්ප ක්‍රමයක් නොතිබුණු බවයි බොහෝ විශේෂඥයන්ගේ අදහස. ඒ අනුව ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් යටතේ ණය මුදලක් සඳහා ඉල්ලුම් කර තිබුණා. අර්බුදයෙන් ගොඩ ඒමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගැනීමේදී ඔවුන් විසින් කොන්දේසි කිහිපයක් ඉටු කිරීමටත් ඒ අනුව ඩොලර් බිලියන 2.9ක මුදලක් වාරික කිහිපයකදී ලබා දීමටත් එකඟතාවක් ඇති කර ගත්තා. එහි පළමු වාරිකය ලබා ගැනීමෙන් පසුව දෙවැනි වාරිකය ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසි සපුරාලීමට අපොහොසත් වී ඇති බවකුයි ප්‍රකාශ වුණේ. විශේෂයෙන් ම රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීම සහ බදු ආදායම ඉහළ නංවා ගැනීම IMF නිර්දේශ කර තිබුණත් රජය අපේක්ෂා කරන ලද මට්ටමින් එය ඉටු කර ගැනීමට හැකියාවක් ලැබුණේ නැහැ. VAT අනුපාතය ඉහළ නැංවීමටත් මෙතෙක් VAT සඳහා යටත් නොවූ භාණ්ඩ හා සේවා ද VAT සඳහා යටත් කිරීමටත් රජය තීරණය කළේ ඒ අනුව. එහෙත් අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා තවදුරටත් එකතු කළ අගය මත පනවන බද්දෙන් නිදහස් කිරීමටත් රජය පියවර ගෙන තිබෙනවා. මෙයට පෙර ආදායම් බදු සීමා පහළ දැමීමෙන් රජය බලාපොරොත්තු වූයේ ද මෙය. ආදායම් බදු පදනම පුළුල් කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමටත් ආදායම් බදු ප්‍රමාණය ඉහළ නංවා ගැනීමටත් රජය බදු ගෙවන්නා හඳුනා ගැනීම සඳහා වන අංකයක් (TIN - Taxpayer Identification Number) හඳුන්වා දී තිබෙනවා. මෙය බදු අය කිරීම සම්බන්ධයෙන් ඉතාමත් ධනාත්මක ප්‍රවේශයක් බවයි බොහෝ විද්වතුන්ගේ මතය.

රාජ්‍ය ආදායම ඉහළ දමා ගැනීමෙන් රජය අපේක්ෂා කරන තවත් අරමුණක් වන්නේ හිඟ අයවැය නිසා ආර්ථිකය මත ඇතිවන පීඩනය අවම කර ගැනීම. "බදු අයකිරීමකින් තොර ව අයවැය හිඟය පියවා ගැනීමට නම් රජය ණය ලබා ගත යුතු වනවා. එහෙත් මේ වන විට එය කළ නොහැක්කක්. එම නිසා කළ යුතු වන්නේ බදු ආදායම ඉහළ දමා ගැනීම හෝ නැතහොත් වියදම් කපා හැරීම. එසේත් නොමැති නම් මේ කාර්ය දෙකෙහි ම මිශ්‍ර අවස්ථාවකට යාම. රජය මේ වන විට රාජ්‍ය වියදම් කාර්යක්ෂම ව භාවිත කිරීමටත් බදු ආදායම ඉහළ දැමීමටත් ක්‍රියා කරමින් සිටිනවා. පවතින අර්බුදයෙන් ගොඩඒමට නම් එසේ කළ යුතු වනවා. පසුගිය කාලයේදී බදු අනුපාත පහළ හෙළීම නිසා විශාල වශයෙන් රාජ්‍ය ආදායම පහළ ගියා" බදු උපදේශිකා තනුජා පෙරේරා පවසනවා. 2024 වර්ෂයේ අපේක්ෂිත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 9.1%ක් වන අතර අපේක්ෂිත රාජ්‍ය ආදායම රුපියල් බිලියන 4127ක්.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශය වූයේ ද රාජ්‍ය ආදායම ඉහළ නංවා ගන්නා අතරතුර අවදානම් පිරිස් සඳහා සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක කළ යුතු බවක්. බදු උපදේශිකා තනුජා පෙරේරා පවසන්නේ සහනාධාර ලබා දීම සඳහා බදු ක්‍රමය තෝරා ගැනීම තවදුරටත් නිවැරදි නොවන බව තහවුරු වී තිබෙන බැවින් ඒ සඳහා ප්‍රමුඛතාව මත පදනම් වූ ක්‍රමවේදයක් තිබිය යුතු බව.



## VAT ඉහළ යාමේ ප්‍රතිඵල

VAT අනුපාතය 15% සිට 18% දක්වා ඉහළ දැමීම නිසා බොහෝ භාණ්ඩ හා සේවාවල මිල 3%කින් පමණ ඉහළ යාමේ හැකියාවක් තිබෙනවා. මෙතෙක් එකතු කළ අගය මත පනවන බද්දෙන් නිදහස් ව තිබූ භාණ්ඩ සඳහා පමණක් එය 18%කින් ඉහළ යනු ඇති. එම බද්දෙන් නිදහස් භාණ්ඩවල මිල ඉහළ යාමක් සිදු වන්නේ නැහැ හෝ එය අවම මට්ටමකින් සිදු වන්නට පුළුවන්. ඒ අනුව ශ්‍රී ලංකා ආර්ථිකයේ භාණ්ඩ හා සේවාවල මිල යම් ප්‍රමාණයකින් ඉහළ යාමේ හැකියාවක් ද තිබෙනවා. භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාමක් වඩාත් ම බලපාන්නේ අඩු ආදායම්ලාභීන්ට. අවම ආදායම් තත්ත්වය නිසා අත්‍යාවශ්‍ය භාණ්ඩ පරිභෝජනයෙන් ඉවත් වීමට සිදු වුවහොත් මන්දපෝෂණය හා වෙනත් සෞඛ්‍යමය ගැටලු හා සමාජීය ගැටලු නිර්මාණය වීමේ හැකියාවක් ද පවතිනවා. මෙයට විකල්ප විසඳුමක් වශයෙන් රජය 2024 අයවැයේදී සමාජ ආරක්ෂණ ක්‍රම සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය ඉහළ දමා තිබෙනවා. ප්‍රමුඛතාව මත පදනම් ව සමාජ සුභසාධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ද සැලසුම් කර තිබෙනවා. අස්වැසුම, වැඩිහිටි දීමනාව, ගර්භණී මව්වරුන්ට ලබාදෙන පෝෂණ මල්ල, විවිධ රෝගාබාධ සඳහා ලබාදෙන සහනාධාර, පොහොර සහනාධාර ඊට අයත්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශ්‍ය වූයේ ද රාජ්‍ය ආදායම ඉහළ නංවා ගන්නා අතරතුර අවදානම් පිරිස් සඳහා සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක කළ යුතු බවක්. බදු උපදේශිකා තනුජා පෙරේරා පවසන්නේ සහනාධාර ලබා දීම සඳහා බදු ක්‍රමය තෝරා ගැනීම තවදුරටත් නිවැරදි නොවන බව තහවුරු වී තිබෙන බැවින් ඒ සඳහා ප්‍රමුඛතාව මත පදනම් වූ ක්‍රමවේදයක් තිබිය යුතු බව.

> රටේ ඇති වූ අර්බුදකාරී තත්ත්වය සමග ශ්‍රී ලංකා රජයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගන්නවා හැර වෙනත් විකල්ප ක්‍රමයක් නොතිබුණු බවයි බොහෝ විශේෂඥයන්ගේ අදහස. ඒ අනුව ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් යටතේ ණය මුදලක් සඳහා ඉල්ලුම් කර තිබුණා.

VAT ඉහළ දැමීමෙන් ආර්ථිකය සංකෝචනය විය හැකි බව කැලණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය නවරත්න බණ්ඩා පෙන්වා දෙනවා. එම නිසා කළ යුත්තේ වර්ධනයේ ඇන්ජිම ලෙසින් සැලකෙන සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම. ආර්ථික අවපාතයකදී බදු අයකිරීමෙන් ඉල්ලුමට බලපෑම් කර ආර්ථිකය සංකෝචනය කරනවාට වඩා ආර්ථිකය ප්‍රසාරණය වන සැලසුමකට යායුතු බවයි ඔහුගේ අවධාරණය. බදු අයකිරීම කළ යුත්තේ ආර්ථිකයේ වර්ධනයට අනුගාමී ව බවත් ඔහු පෙන්වා දෙනවා.

අත්‍යාවශ්‍ය රාජ්‍ය වියදම් පවත්වා ගැනීමටත් ආර්ථිකයේ ප්‍රසාරණයට අවශ්‍ය තල්ලුව ලබා දීමටත් හැකි වන පරිදි රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීම අත්‍යාවශ්‍ය සාධකයක් බව නොරහසක්. එහෙත් ශ්‍රී ලංකාවේ මුළු බදු ආදායමෙන් ඉහළ ප්‍රතිශතයක් වක්‍ර බදු වන නිසා බදු සංයුතිය සහ බදු පදනම පිළිබඳ අවධානය යොමු කරමින් බදු ක්‍රමය සකස් කිරීම වැදගත්. ඒ සඳහා බදු ගෙවන්නා හඳුනා ගැනීම සඳහා වන අංකය (TIN) ද වැදගත් කාර්ය කොටසක් ඉටු කරනු ඇති.



# බදු ගෙවීම යුතුකමක්






**දුශානි චන්ද්‍රසිරි**
ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්
දේශීය ආදායම් දෙපාර්තමේනතුව

2024 ජනවාරි මස 01 දින සිට එකතු කළ අගය මත අය කරන බද්ද 15% සිට 18% දක්වා ඉහළ දැමීමටත් බද්දෙන් නිදහස් කර තිබූ ඇතැම් භාණ්ඩ සඳහා බදු අය කිරීමටත් රජය ප්‍රතිපත්තිමය තීරණයකට පැමිණියා. අත්‍යාවශ්‍ය යැයි සැලකෙන භාණ්ඩ වර්ග කිහිපයක් තවමත් එකතු කළ අගය මත අය කෙරෙන බද්දෙන් නිදහස්. එලෙස බද්දෙන් නිදහස් භාණ්ඩ හා සේවා අතර ඉන්ධන, සෞඛ්‍ය සම්බන්ධ උපකරණ, කෘෂිකාර්මික උපකරණ, රසායනික පොහොර, ස්වර්ණාභරණ, මැණික් ආදිය අයත් ව තිබුණා. ඒ සියල්ල VAT සඳහා යටත් කර තිබෙනවා. එයින් බද්දට යටත් වන පිරිස් ඉහළ මට්ටමක පවත්වා ගැනීමෙන් සහ බදු අනුපාතය ඉහළ දැමීමෙන් රජය බලාපොරොත්තු වන්නේ රාජ්‍ය ආදායම ඉහළ දමා ගැනීම. හිඟ අයවැයක් පවතින රටක් වශයෙනුත් අයවැය පරතරය පියවා ගැනීමේ ගැටලුවකට මුහුණ දී ඇති රටක් වශයෙනුත් ශ්‍රී ලංකාවට රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක්. රජයේ ප්‍රධානතම ආදායම් මාර්ගය බදු ආදායම වීමෙන් එය වඩාත් තහවුරු වනවා.

එකතු කළ අගය මත බද්ද වක්‍ර බද්දක්. ශ්‍රී ලංකාව ඇතුළත භාණ්ඩ හා සේවා ගනුදෙනුවලදී මෙන් ම ආනයනය කරන භාණ්ඩ මත රේගුවේදීත් VAT අය කෙරෙනවා. භාණ්ඩයක් හෝ සේවාවක් අවසාන පාරිභෝගිකයා වෙත ලැබෙන අවස්ථාව තෙක් එක් එක් අධියරයේදී එක් වන අගය මත VAT අය වන අතර එම බද්ද අවසන් පාරිභෝගිකයා මතයි පැනවෙන්නේ. වෙනත් ලෙසකින් සඳහන් කරනවා නම් බදු බර අවසන් පාරිභෝගිකයා විසිනුයි දැරිය යුතු වන්නේ. එයට හේතුව නිෂ්පාදකයාට තමන් විසින් භාණ්ඩයට එකතු කළ වටිනාකමට පැනවෙන බද්ද ඊළඟ පාරිභෝගිකයා වෙත විතැන් කිරීමේ හැකියාවක් තිබීම. මේ ආකාරයට භාණ්ඩ හෝ සේවා සැපයීම මත එකතු කළ අගය මත බද්ද අය කිරීමේ හැකියාව තිබෙන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ පුද්ගලයන්ට හෝ ආයතනවලට පමණයි.

VAT සඳහා ලියාපදිංචි වීමේදී සිදු වන්නේ ඕනෑ ම පුද්ගලයකු සඳහා ලබාගත හැකි බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN - Tax Identification Number) සමග VAT හඳුනා ගැනීමේ කේතය වන 7000 ඇතුළත් කිරීමෙන්. මේ ආකාරයට TIN සහ VAT කේතය ඇතුළත් සහතිකයක් අදාළ පුද්ගලයාට හෝ ව්‍යාපාරයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලබා දෙනවා. එවැනි සහතිකයක් ලබා ගත් අයකුට පමණයි තමන්ගේ පාරිභෝගියන්ගෙන් තමන්ගේ සේවාව හෝ භාණ්ඩය මත වන VAT අය කර ගැනීමේ නීත්‍යානුකූල හැකියාව පවතින්නේ.

VAT සඳහා සියලු දෙනා ලියපදිංචි විය යුතු නැහැ. පුද්ගලයකු හෝ ව්‍යාපාරයක් හෝ කාර්තුවකට රුපියල් මිලියන 20ක් හෝ

වසරකට රුපියල් මිලියන 80 ඉක්මවන විට හෝ එම වටිනාකම් ඉක්මවීමට ආසන්න තත්ත්වයේ පසුවෙනවා නම් ඔවුන් VAT සඳහා ලියාපදිංචි විය යුතු වනවා. කිසියම් පුද්ගලයකු මේ සඳහා ලියාපදිංචි නොවෙනවා නම් සහ එම පුද්ගලයා ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබෙනවා නම් දොපාර්තමේන්තුව සතු තොරතුරු හෝ ලැබෙන තොරතුරු මත පදනම් ව ඒ සඳහා ලියාපදිංචි කරවා ගැනීමේ නීති ප්‍රතිපාදන තිබෙනවා. VAT සඳහා ලියාපදිංචි වූ පුද්ගලයකු හෝ ආයතනයක් හෝ තමන්ගේ ව්‍යාපාරික ස්ථානයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලබාදෙන සහතිකය ප්‍රදර්ශනය කළ යුතුයි. එයින් ඔහුගේ පාරිභෝගිකයන්ට හැකියාව ලැබෙනවා එම පුද්ගලයාට හෝ ආයතනයට හෝ VAT අය කරගැනීමේ නීත්‍යානුකූල තත්ත්වයක් ලැබී ඇති බව දැන ගැනීමට. මේ ආකාරයට VAT සඳහා ලියාපදිංචි වූ පුද්ගලයකු තවත් එවැනි ම ලියාපදිංචි වූ අයකුට තම භාණ්ඩය හෝ සේවාව හෝ අලෙවි කරන විට භාණ්ඩයේ වටිනාකම් සහ අය කරන බද්ද සඳහා බදු ඉන්වොයිස්පතක් ලබා දිය යුතු වනවා. VAT සඳහා ලියාපදිංචි නොවූ අයකුට ඒ ආකාරයට බදු මුදල සහ භාණ්ඩයේ වටිනාකම සඳහා වෙන් වෙන් ව ඉන්වොයිස් පතක් නිකුත් කිරීම අත්‍යාවශ්‍ය නැහැ. බදු මුදල ද ඇතුළත් භාණ්ඩයේ මිල සඳහන් වාණිජ ඉන්වොයිස්පතක් ලබා දීම එහිදී ප්‍රමාණවත්.

VAT සඳහා ලියාපදිංචි වූ අයකු මේ ආකාරයට භාණ්ඩ අලෙවිය හෝ මිලදී ගැනීම් හෝ සම්බන්ධ ව ගිණුම් වාර්තා පවත්වා ගැනීම අඛණ්ඩ ව කළ යුත්තක්. කාර්තුවක් අවසානයේ එම පුද්ගලයා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අදාළ වාර්තා ලබා දිය යුතුයි.

මේ ගිණුම් වාර්තා VAT සඳහා ලියාපදිංචි වූ පුද්ගලයකු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන්නේ ස්ව තක්සේරුවකින් යුතු ව. රටේ සියලු ම VAT ලියාපදිංචි පුද්ගලයන් මේ ආකාරයට ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමෙන් භාණ්ඩ සැපයුම් ජාලයේ සිදුවන වටිනාකම් පිළිබඳ ව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හරස් පරීක්ෂාවක් (Cross Checking) කිරීමේ හැකියාව තිබෙනවා. ඒ, සැපයුම් ජාලයේ එක් විකුණුම්කරුවකුගේ සැපයුම තවත් අයකුගේ මිල දී ගැනීමක් වන නිසා. එක් මිල දී ගැනීමක් තවත් අයකුගේ සැපයුමක්. මේ නිසා සෑම පුද්ගලයකු ම තමන්ගේ විකුණුම් හා මිල දී ගැනීම් සම්බන්ධ නිවැරදි තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි. රජයේ ආයතනයක් සෑම කාර්තුවකට ම වරක් තමන්ගේ මිල දී ගැනීම් සඳහා ගෙවන ලද එකතු කළ අගය මත බද්ද සම්බන්ධ ව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තොරතුරු ඉදිරිපත් කරන අතර එම ගෙවීම් දෙපාර්තමේන්තුවට නිසි පරිදි ලැබී ඇතිදැයි පරීක්ෂා කෙරෙනවා. ඕනෑ ම පුද්ගලයකුට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තොරතුරු අංශයට තොරතුරු ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙන නිසා ඒ අනුවත් VAT සඳහා ලියාපදිංචි නොවූ අයකු සිටිනවා නම් හඳුනා ගැනෙනවා.

ඍජු ආදායම් බද්දක් අය කිරීමේදී පුද්ගලයාගේ ගෙවීමේ හැකියාව මත බදු අය කිරීම පදනම වුවත් VAT වැනි වක්‍ර බද්දකදී එවැන්නක් සිදු වන්නේ නැහැ. එය සෑම පාරිභෝගිකයකු ම ගෙවිය යුතුයි. ස්ථාවර ආදායම් තත්ත්වයකදී VAT නිසා භාණ්ඩ හා සේවා මිල යම් ආකාරයකින් ඉහළ යාමේ හැකියාවක් තිබෙන නිසා පාරිභෝගිකයන් අත්‍යාවශ්‍ය භාණ්ඩවලට පමණක් පෙළඹීමේ නැඹුරුවක් ද තිබෙනවා. එහෙත් මෙවැනි අර්බුදකාරී අවස්ථාවකදී මහජන ආරක්ෂාව, සෞඛ්‍යය, අධ්‍යාපනය හා යටිතල පහසුකම් පමණක් නොව අඩු ආදායම්ලාභීන්ට සමාජ ආරක්ෂණ ක්‍රම වැනි අත්‍යාවශ්‍ය සේවා රැසක් රජයක් පවත්වා ගත යුතුයි. ඒ සඳහා වියදම් දරන්නේ රජයේ බදු ආදයමෙන්. අර්බුදකාරී තත්ත්වයෙන් ගොඩ ඒමටත් රටේ ඉදිරි සංවර්ධන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමටත් රජයට දේශීය ව පවතින ප්‍රධාන මූලාශ්‍රයක් බදු ආදායම. වර්තමානයේ දෛනික ක්‍රියාවලිය පවත්වාගෙන යන්නේ ද රජය මහජනතාවගෙන් රැස් කරන බදු මුදල් යොදවා සිදු කරන පහසුකම් භුක්ති විඳිමින්. එයින් අදහස් වන්නේ මහජනතාවගෙන් රැස් කරන බදු මුදල් නැවත මහජනතාවගේ ම යහපතට යෙදවෙන බව.

අප, අතීතයේ මුතුන් මිත්තන් ගෙවන ලද බදු මුදල් නිසා වත්මන් තත්ත්වයට සංවර්ධනය වූ පිරිසක්. ඒ ආකාරයට ම අපේ ඉදිරි පරපුර ගොඩනැගෙනු ඇත්තේ ද වර්තමානයේ අප ගෙවන බදු මුදලින්. ඒ නිසා අනාගත පරපුර සුරක්ෂිත කිරීම සඳහාත් ඔවුන්ගේ ජීවනෝපාය ස්ථාවර ව පවත්වා ගැනීම සඳහාත් අප සැමට පැහැර හැරිය නොහැකි යුතුකමක් සහ වගකීමක් තිබෙනවා.

අප, අතීතයේ මුතුන් මිත්තන් ගෙවන ලද බදු මුදල් නිසා වත්මන් තත්ත්වයට සංවර්ධනය වූ පිරිසක්. ඒ ආකාරයට ම අපේ ඉදිරි පරපුර ගොඩනැගෙනු ඇත්තේ ද වර්තමානයේ අප ගෙවන බදු මුදලින්. ඒ නිසා අනාගත පරපුර සුරක්ෂිත කිරීම සඳහාත් ඔවුන්ගේ ජීවනෝපාය ස්ථාවර ව පවත්වා ගැනීම සඳහාත් අප සැමට පැහැර හැරිය නොහැකි යුතුකමක් සහ වගකීමක් තිබෙනවා.

# සහන දීමට බදු ක්‍රමය යොදා නොගත යුතුයි

පසුගිය කාලයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම පහළ ගොස් තිබුණේ නිරන්තරයෙන් සිදු වූ බදු සංශෝධන සහ වෙනත් හේතු නිසා. 2022 වර්ෂය වන විට රජයේ සමස්ත බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් 7.3%ක් වුවත් එය රජයේ වියදම් පියවා ගැනීම සඳහා කිසිසේත් ම ප්‍රමාණවත් වූයේ නැහැ. මේ නිසා විශාල අයවැය හිගයක් ඇතිවුණා. එය පියවා ගැනීමට ණය ලබා ගැනීමේ හැකියාවක් හෝ මුදල් අච්චු ගැසීම වැනි ක්‍රම අනුගමනය කිරීමේ හැකියාවක් හෝ වර්තමානයේ ශ්‍රී ලංකා රජයට නැහැ. එම නිසා අයවැය පරතරය පියවා ගත යුතු එක ම මාර්ගය වන්නේ රජයේ ආදායම් ඉහළ දමා ගැනීම හෝ රාජ්‍ය වියදම් අවම මට්ටමක පවත්වා ගැනීම.

රජයක වියදම් සීමා කිරීමේ සීමා ද තිබෙනවා. අත්‍යාවශ්‍ය සේවා සඳහා රජය දරන වියදම් විශාල වශයෙන් හෝ සම්පූර්ණයෙන් හෝ කපා දමන්නට බැහැ. එසේ වුවත් එම වියදම් යම් පමණකින් සීමාවලට යටත් කිරීමේ හැකියාව පවතිනවා. එම නිසා පසුගිය කාලයේ රාජ්‍ය ආයතනවල වියදම් අත්‍යාවශ්‍ය කාරණාවලට පමණක් සීමා කෙරුණා. එහෙත් පවතින අයවැය පරිතරය අවම කර ගැනීමට එවැනි සීමා කිරීමකින් ලැබෙන ප්‍රතිපල අවමයි. මේ නිසා රජයට සිදු වුණා රාජ්‍ය ආදායම ඉහළ දමා ගැනීම කෙරෙහි යොමු කිරීමට.  ඒ සඳහා රජයේ ප්‍රධානතම ආදායම් මාර්ගය බදු ආදායම බැවින් සෘජු හා වක්‍ර බදු සීමා සහ බදු පදනම පුළුල් කිරීමට සිදු වුණා. එහි ප්‍රතිඵලයක් ලෙසයි භාණ්ඩ හා සේවා සඳහා වූ එකතු කළ අගය මත අය කෙරෙන බද්ද (Value Added Tax - VAT) 2024 ජනවාරි 01 දින සිට ඉහළ දැමීමට රජය ක්‍රියා කළේ.

VAT අය කිරීම ආරම්භයේදී පැවතියේ 20% වැනි මට්ටමක. VAT සඳහා බදු අනුපාතය විවිධ මට්ටමින් කලින් කලට වෙනස්වීම්වලට භාජනය වුණා. අවසාන වශයෙන් 8% දක්වා එය අවම මට්ටමකට



**තනුජා පෙරේරා**
බදු ප්‍රතිපත්ති උපදේශිකා
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

වෙනස් කර තිබුණා. එය 15% දක්වා ඉහළ දැමුවත් රජය අපේක්ෂා කළ බදු ආදායම නොලැබුණු නිසා යළි එය 18% දක්වා ඉහළ දැමීමට සිදු වුණා.

මෙවැනි පසුබිමක VAT නිදහස් කරන ලද ඇතැම් භාණ්ඩ සඳහා VAT අයකිරීමට ද රජය පියවර ගෙන තිබෙනවා. 2002 වර්ෂයේ සිට මේ දක්වා ඇතැම් භාණ්ඩ හා සේවා එකතු කළ අගය මත අය කෙරෙන බද්දෙන් නිදහස් කොට තිබෙනවා. ඇතැම් කාලවලදී VAT නිදහස් කරන ලද භාණ්ඩවලින් කිසිදු ප්‍රතිඵලයක් නැහැ. මේ ආකාරයට ඉතා විශාල බදු නිදහස් කිරීම් තිබුණා. මේ නිසා රජයට අහිමි වූ බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් 2%ක් පමණ වන බවට ගණනය කර තිබුණා. එයින් පෙනී අයනවා බදු අනුපාතය ඉහළ දැමීම මෙන් ම බදු නිදහස් කිරීම් අවම කිරීමෙනුත් රාජ්‍ය බදු ආදායම ඉහළ දමා ගැනීමේ හැකියාවක් තිබෙන බව.

බොහෝ රටවල් ඉතා ඉහළ බදු අනුපාතයක් පවත්වාගෙන යනවා. ඉන්දියාවේ බදු අනුපාත 04ක් ක්‍රියාත්මක වන අතර එක් බදු අනුපාතයක් 28% දක්වා ඉහළ මට්ටමකයි පවත්වාගෙන යන්නේ. බටහිර රටවල් වැනි ඉතා ඉහළ බදු අනුපාතයක් පවත්වාගෙන යන රටවල් මෙන් ම සිංගප්පූරුව වැනි 8% සහ 10% මට්ටමේ අවම බදු අනුපාතයක් පවත්වාගෙන යන රටවල් ද තිබෙනවා. ඒ, එම රටවල ආර්ථික අරමුණු සහ අවශ්‍යතා අනුව. ශ්‍රී ලංකාවේ VAT බදු අනුපාතය වන 18% මෙයට පෙර

> රජයක වියදම් සීමා කිරීමේ සීමා ද තිබෙනවා. අත්‍යාවශ්‍ය සේවා සඳහා රජය දරන වියදම් විශාල වශයෙන් හෝ සම්පූර්ණයෙන් හෝ කපා දමන්නට බැහැ. එසේ වුවත් එම වියදම් යම් පමණකින් සීමාවලට යටත් කිරීමේ හැකියාව පවතිනවා. එම නිසා පසුගිය කාලයේ රාජ්‍ය ආයතනවල වියදම් අත්‍යාවශ්‍ය කාරණාවලට පමණක් සීමා කෙරුණා. එහෙත් පවතින අයවැය පරිතරය අවම කර ගැනීමට එවැනි සීමා කිරීමකින් ලැබෙන ප්‍රතිපල අවමයි. මේ නිසා රජයට සිදු වුණා රාජ්‍ය ආදායම ඉහළ දමා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමට.  ඒ සඳහා රජයේ ප්‍රධානතම ආදායම් මාර්ගය බදු ආදායම බැවින් සෘජු හා වක්‍ර බදු සීමා සහ බදු පදනම පුළුල් කිරීමට සිදු වුණා.

තත්ත්වය හා සංසන්දනය කිරීමේදී යම් ඉහළ අගයක් වුවත් එය අසාමාන්‍ය බදු අනුපාතයක් නොවෙයි.

VAT අනුපාතය ඉහළ දැමීමේදීත් VAT සඳහා යටත් වන භාණ්ඩ හා සේවා ලැයිස්තුව සකස් කිරීමේදීත් එකතු කළ අගය මත අය කෙරෙන බද්දෙන් අත්‍යාවශ්‍ය භාණ්ඩ තවදුරටත් නිදහස් වන පරිදියි ක්‍රියා කර තිබෙන්නේ. ඒ අනුව සහල්, පාන්පිටි, පාන්, පලතුරු වැනි භාණ්ඩ සහ අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි සේවා ද තවදුරටත් එම බදුවලින් නිදහස්. මේ නිසා සමාජයේ අඩු ආදායම්ලාභීන්ට තවදුරටත් එම භාණ්ඩ එකතු කළ අගය මත පැනවෙන බදුවලින් ඉහළ ගිය මිලකට පරිභෝජනය කිරීමට සිදුවන්නේ නැහැ.

සමස්ත ජනගහනයෙන් 5%ක්වත් බදු සඳහා ලියාපදිංචි වී නැහැ. විශාල පිරිසකගේ සුභසාධනය තහවුරු කිරීමට 5%ක් වැනි සුළු පිරිසට හැකියාවක් නැහැ. බදු ගෙවිය යුතු සෑම අයකු ම තමන් ම බදු ක්‍රමයට ඇතුළත් වනවා නම් එක් එක් පුද්ගලයා වෙත පැටවෙන බදු බර අවම කිරීමේ හැකියාවක් තිබෙනවා. එසේ නොවුණහොත් පවතින අර්බුදයෙන් ගොඩඒමට හැකියාවක් ලැබෙන්නේ නැහැ.

අඩු ආදායම්ලාභීන් සහ සමාජ ආරක්ෂණ ක්‍රමයක අවශ්‍යතාව පවතින පිරිස් සඳහා රජයේ ඉලක්කගත වැඩසටහන් හඳුන්වා දී තිබෙනවා. අස්වැසුම, වැඩිහිටි දීමනා, වකුගඩු රෝගීන් සඳහා සහනාධාර ආදී සමාජ ආරක්ෂණ ක්‍රම රාශියක් ද මේ වන විටත් ක්‍රියාත්මකයි. මේ නිසා VAT ඉහළ දැමීමෙන් එවැනි කාණ්ඩවලට සිදුවන අහිතකර බලපෑම අවම කිරීමටත් රජය ක්‍රියා කර තිබෙනවා.

එකතු කළ අගය මත පැනවෙන බදු අය කිරීමේ ක්‍රියාවලිය තරමක් සංකීර්ණ ක්‍රියාවලියක්. භාණ්ඩයක් අවසන් පරිභෝජනය දක්වා නිෂ්පාදනය කරන විට පියවර රාශියක් පසු කළ යුතු වනවා. මේ ආකාරයට පියවර ගණනාවක් පසු කිරීමේදී යම් අවස්ථාවක එකතු කළ අගය මත පැනවෙන බදුවලින් නිදහස් වූවා කියා අවසන් භාණ්ඩයේ මිලට හෝ ගෙවිය යුතු බද්දට එයින් බලපෑමක් වන්නේ නැහැ. VAT නිසා භාණ්ඩයක මිල ඉහළ යාමෙන් ආදේශක භාණ්ඩ මත පෙළඹුණා යැයි කියා එයින් VAT නොගෙවා සිටීමේ හැකියාවක් නැහැ. ඒ, එකතු කළ අගය මත පැනවෙන බදුවලින් තොර ආදේශක භාණ්ඩ පැවතීම අවම නිසා. එහෙත් භාණ්ඩ මිල ඉහළ යාම නිසා කිසියම් අයකු පරිභෝජනයෙන් ඉවත් වීමේ යම් හැකියාවක් තිබෙනවා.




ඇතැමුන්ගේ අදහස VAT සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ට තදින් ම බලපාන බව. භාණ්ඩයේ මිල VAT නිසා ඉහළ යාමෙන් ඔවුන්ට තරග කිරීමේ හැකියාව අවම වන බවයි ඔවුන් ප්‍රකාශ කරන්නේ. එහෙත් 2019-20 කාලයේ VAT සඳහා ලියාපදිංචි වන ආදායම් සීමාව ඉහළ දැමූ විට බොහෝ ව්‍යාපාරිකයන් ඉල්ලා සිටියේ තමන්ගේ ආදායම් සීමාව යටතේ VAT සඳහා ලියාපදිංචි වීමට අවස්ථාව දෙන ලෙස. ඒ අවස්ථාවේ රජය තීරණය කළා අදාළ ආදායම් සීමාවට වඩා අඩු ආදායම් සීමාවක් සහිත පුද්ගලයන්ටත් VAT සඳහා ලියාපදිංචි වීමේ අවස්ථාව ලබා දීමට. ඒ අනුව ඔවුන්ට හැකියාව ලැබුණා භාණ්ඩ නිෂ්පාදනයේ යම් යම් අවස්ථාවලදී VAT සඳහා ගෙවන ලද මුදල් නැවත ලබා ගැනීමට. ඒ ආකාරයට ම මෙවර ද ආදායම් සීමාව නොසලකා යමකුට අවශ්‍ය නම් VAT සඳහා ලියාපදිංචි වීමේ අවස්ථාව තිබෙනවා.

සත්‍ය වශයෙන් ම රටක අවදානම් කොටස් වෙත සහන ලබා දීම සඳහා බදු ව්‍යුහය හෝ බදු සහන ලබා දීමට තෝරා ගැනීම එතරම් සුදුසු නැහැ. බදු අයකිරීම සාධාරණ හා සමාන ලෙස සිදු කරන අතර ම අවදානම් පිරිස් වෙත සහනාධාර ලබා දීම ප්‍රමුඛතාව මත පදනම් ව සිදු කිරීම රජයේ වගකීමක්. එයයි සාමාන්‍ය සම්මත ක්‍රියා පිළිවෙළ. ශ්‍රී ලංකාවේ ඉදිරියට එයයි විය යුත්තේ. බදු බර අවම කිරීම සඳහා වන ක්‍රියාමාර්ගය වන්නේ බදු ගෙවිය යුතු සියලු ම දෙනා බදු ගෙවීමෙන් බදු බර සියලු දෙනා අතර බෙදා ගැනීම. ඒ සඳහා බදු ගෙවීමට ඉදිරිපත් වීමත් රජයට නිවැරදි තොරතුරු ලබා දීමත් මහජනතාවගේ යුතුකමක් සහ වගකීමක්.

සමස්ත ජනගහනයෙන් 5%ක්වත් බදු සඳහා ලියාපදිංචි වී නැහැ. විශාල පිරිසකගේ සුභසාධනය තහවුරු කිරීමට 5%ක් වැනි සුළු පිරිසට හැකියාවක් නැහැ. බදු ගෙවිය යුතු සෑම අයකු ම තමන් ම බදු ක්‍රමයට ඇතුළත් වනවා නම් එක් එක් පුද්ගලයා වෙත පැටවෙන බදු බර අවම කිරීමේ හැකියාවක් තිබෙනවා. එසේ නොවුණහොත් පවතින අර්බුදයෙන් ගොඩඒමට හැකියාවක් ලැබෙන්නේ නැහැ.

# බදු පදනම පුළුල් කළ යුතුයි



මහාචාර්ය
**එච්. එම්. නවරත්න බණ්ඩා**
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

2019 වසර අගභාගය වන තුරු ශ්‍රී ලංකාවේ ආර්ථිකය කිසියම් ආකාරයක යහපත් මට්ටමක පැවතුණා. එහෙත් කොවිඩ් 19 වසංගතයත් සමග ම ආර්ථිකය කඩා වැටුණේ නොසිතූ විරූ ලෙස. සංචාරක කර්මාන්තය, විදේශ ප්‍රේෂණ ලැබීම ක්ෂණික ව ඇනහිටියා. එතෙක් අපට ලැබුණු ආදායම් එදිනෙදා පරිභෝජනය සඳහායි වැය කළේ. ඒ වන විට ශ්‍රී ලංකාව සතු ව ඩොලර් බිලියන 7ක පමණ විදේශ සංචිත ප්‍රමාණයක් තිබුණා. එය ද කිසිඳු කළමනාකරණයකින් තොර ව වියදම් කළා. රටක විදේශ සංචිත ප්‍රමාණය මාස තුනක හෝ වියදම් සඳහා පවත්වා ගත යුතු ය යන්නයි සාමාන්‍ය පිළිගැනීම. එහෙත් ශ්‍රී ලංකාව විදේශ සංචිත ප්‍රමාණය ශූන්‍ය වනතුරු ම වියදම් කළා. මේ නිසා රටේ පෝලිම් ක්‍රමයක් ඇති වුණා. එය මහජනතාවගේ වරදක් නොව එම කාලයේ අදූරදර්ශී ආර්ථික කළමනාකරණයේ ප්‍රතිඵලයක්.

අර්බුදයේ ආරම්භය වන විටත් ශ්‍රී ලංකාව ඩොලර් බිලියන 55ක පමණ ණය ගෙවීමට තිබුණා. ඒ අනුව වසරකට ඩොලර් බිලියන 5ක් පමණ ණය ගෙවිය යුතු ව තිබුණා. ඒ වන විට එම ණය ගෙවා ගැනීමට ද ශ්‍රී ලංකාවට හැකියාවක් තිබුණේ නැහැ. මේ නිසා ජාත්‍යන්තර ප්‍රජාව පිළිගත්තේ ශ්‍රී ලංකාව බංකොලොත් රටක් ලෙසින්. අවසානයේ මධ්‍යම බැංකුව ද ණය ගෙවීමට නොහැකි බව ප්‍රකාශ කළා. මේ තත්ත්වය හමුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ඉල්ලා සිටීමට ශ්‍රී ලංකාවට සිදු වුණා. ඔවුන් විසින් ප්‍රකාශ කරනු ලැබුවේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම ප්‍රමාණවත් නොවන නිසා රාජ්‍ය ආදායම ඉහළ දමා ගැනීමට කටයුතු කළ යුතු බවක්. එහෙත් ඔවුන් පෙන්වා දුන්නේ නැහැ රාජ්‍ය ආදායම ඉහළ දමා ගන්නා ආකාරය පිළිබඳ ව.

රටක ආදායම ඉහළ නංවා ගැනීම සඳහා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, විදේශ රැකියා අවස්ථා පුළුල් කර ගැනීමෙන් විදේශ ප්‍රේෂණ ඉහළ දමා ගැනීම ආදී ක්‍රමවේද රාශියක් තිබෙනවා. ඒ අනුව බදු පදනම පුළුල් කර ගැනීමේ හැකියාව ද තිබෙනවා. මේ වන විට ශ්‍රී ලංකාවේ ඍජු බදු ගෙවන සංඛ්‍යාව ලක්ෂ 14ක් පමණ වනවා. බදු පැහැර හරින ලද සංඛ්‍යාවත් විශාලයි. ඒවා නැවත අය කර ගැනීමේ ක්‍රියාවලියකට යොමු වීමේ හැකියාව තිබෙනවා.

රටක ආදායම ඉහළ නංවා ගැනීම සඳහා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, විදේශ රැකියා අවස්ථා පුළුල් කර ගැනීමෙන් විදේශ ප්‍රේෂණ ඉහළ දමා ගැනීම ආදී ක්‍රමවේද රාශියක් තිබෙනවා. ඒ අනුව බදු පදනම පුළුල් කර ගැනීමේ හැකියාව ද තිබෙනවා. මේ වන විට ශ්‍රී ලංකාවේ ඍජු බදු ගෙවන සංඛ්‍යාව ලක්ෂ 14ක් පමණ වනවා. බදු පැහැර හරින ලද සංඛ්‍යාවත් විශාලයි. ඒවා නැවත අය කර ගැනීමේ ක්‍රියාවලියකට යොමු වීමේ හැකියාව තිබෙනවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි අනුව රාජ්‍ය ආදායම ඉහළ දැමීම සඳහා රජය ඍජු බදු සහ වක්‍ර බදු ඉහළ දැමීමට තීරණය කළත් අපේක්ෂිත ප්‍රමාණයේ ආදායම් ඉහළ යාමක් සිදු වූයේ නැහැ. මේ නිසයි 2024 ජනවාරි 01 දින සිට VAT අනුපාතය සියයට 15% සිට 18% දක්වා ඉහළ දැමීමටත් එකතු කළ අගය මත අය කෙරෙන බද්දෙන් නිදහස් ව තිබූ ඇතැම් භාණ්ඩ බද්දට යටත් කිරීමටත් ඒ අනුව රාජ්‍ය ආදායම ඉහළ දමා ගැනීමටත් ශ්‍රී ලංකා රජය තීරණය කළේ.

එසේ වුවත් රජයේ අරමුණ බදු ඉහළ දැමීමෙන් රටේ ආර්ථික සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම නම් සත්‍ය වශයෙන් ම එය සිදු වන්නේ නැහැ. ඒ, බදු ඉහළ දැමීමෙන් භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම අනිවාර්යෙන් ම සිදු වන නිසා.



නැවත උද්ධමනකාරී තත්ත්වයක් ඇති වන්නටත් පුළුවන්. මේ නිසා සමස්ත පරිභෝජනය අවම වීමෙන් ව්‍යාපාරිකයන්ගේ ලාභ මට්ටම පහළ යා හැකියි. ව්‍යාපාරික පංතිය ද මේ නිසා අධෛර්යමත් වුවහොත් ආර්ථිකය තවදුරටත් සංකෝචනය විමේ අවදානමක් තිබෙනවා.

VAT ඉහළ යාම නිසා රජය අපේක්ෂා කරන ආදායම ඒ ආකාරයෙන් ම ලැබෙයි ද? එය තීරණය වන්නේ VAT අය කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පවතින ක්‍රමවේදයේ සාර්ථකත්වය මත. VAT සඳහා ලියාපදිංචි විය යුතු සියලු ම දෙනා ලියාපදිංචි වී තිබෙනවා ද? VAT සඳහා ලියාපදිංචි නොවෙන පිරිස් ලියාපදිංචි කර ගැනීමට ක්‍රමවේදයක් පවතිනවා ද? යන්න වැදගත්. මේ නිසා VAT ඉහළ දැමීමෙන් අපේක්ෂිත රාජ්‍ය ආදායම ලබා ගැනීමට කාර්යක්ෂම ක්‍රමවේදයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු ව පැවතිය යුතුයි.

VAT ඉහළ දැමීම න්‍යායාත්මක වූවක් නිසා සිදුවිය හැකි ධනාත්මක ප්‍රතිඵලයක් ලෙසින් අප දකින්නේ රාජ්‍ය ආදායම ඉහළ දැමීමෙන් රාජ්‍ය ආයෝජන ඉහළ ගොස් රටේ සමස්ත නිෂ්පාදනය ඉහළ යා හැකි වීම. එහෙත් ඉහළ ගිය රාජ්‍ය ආදායමේ කොටස දෛනික පරිභෝජනය සඳහා වැය කළහොත් එසේ වන්නේ නැහැ. එම නිසා එම මුදල් නිසි පරිදි කළමනාකරණය කිරීමෙන් කොටසක් හෝ ආයෝජනය කිරීමෙන් ඊළඟ පරම්පරාවේ බදු බර අවම කිරීමේ හැකියාවක් පවතිනවා.

බදු අය කර ගැනීමට පෙර බදු පදනම පුළුල් කර ගැනීම ශ්‍රී ලංකාව කළ යුතු ව තිබෙනවා. එවිට සාමාන්‍ය ජනතාව වෙත ඇති වන බදුබර අවම කර ගැනීමට පුළුවන්. බදු ගෙවන ජනතාවට බදු ගෙවීම

**විදේශ ප්‍රේෂණ ඉපයීම් සඳහා විදේශ රැකියාවලට යොමු වන පිරිස ඉහළ දැමීමත් පුහුණු ශ්‍රමිකයන් සහ ලෝකයේ දියුණු රටවල් ඉලක්ක කර ගත් රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් යොමු කිරීමේ හැකියාව පිළිබඳවත් අවධානය යොමු කළ යුතු ව තිබෙනවා. නව අපනයන වෙළඳපොළ සොයා යාම සහ අපනයන විවිධාංගිකරණය පිළිබද ව අවධානය යොමු කරන්නටත් පුළුවන්. මේ ඔස්සේ සාමාන්‍ය ජනතාවට අවම බරක් වන අයුරින් රටේ ආදායමත් රාජ්‍ය ආදායමත් ඉහළ නංවා ගත හැකියි.**

නිසා ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීමත් කළ යුත්තක්. වෙනත් රටවල එය සිදු වනවා. බදු අය කර සහනාධාර ලබා දීම සුදුසු නැහැ. එයින් යැපීම් මානසිකත්වය ඇති වීමෙන් වන්නේ රටේ නිෂ්පාදනයට දායක කර ගත යුතු ශ්‍රම බලකාය ඵලදායි ලෙස යොදවා ගැනීමට නොහැකි වීම. එම නිසා සමාජ ආරක්ෂණ ක්‍රම පැවතිය යුත්තේ ඉලක්කගත පිරිස් වෙනුවෙන්.

සත්‍ය වශයෙන් ම පවතින අර්බුදකාරී තත්ත්වයෙන් ගොඩ ඒමට සහ ආර්ථික සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාව අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර කිහිපයක් ම තිබෙනවා. සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම සහ ප්‍රවර්ධනය එක් ක්ෂේත්‍රයක්. මෙහිදී ශ්‍රී ලංකාවේ තානාපතිවරුන්ගේ සහයෝගය ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. ඔවුන් අවධානය යොමු කළ යුතුයි ඒ ඒ රටවලින් සංචාරකයන් ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීමට සුදුසු ක්‍රම පිළිබඳ ව. විදේශ ප්‍රේෂණ ඉපයීම් සඳහා විදේශ රැකියාවලට යොමු වන පිරිස ඉහළ දැමීමත් පුහුණු ශ්‍රමිකයන් සහ ලෝකයේ දියුණු රටවල් ඉලක්ක කර ගත් රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් යොමු කිරීමේ හැකියාව පිළිබඳවත් අවධානය යොමු කළ යුතු ව තිබෙනවා. නව අපනයන වෙළඳපොළ සොයා යාම සහ අපනයන විවිධාංගිකරණය පිළිබද ව අවධානය යොමු කරන්නටත් පුළුවන්. මේ ඔස්සේ සාමාන්‍ය ජනතාවට අවම බරක් වන අයුරින් රටේ ආදායමත් රාජ්‍ය ආදායමත් ඉහළ නංවා ගත හැකියි.



# යළි හිස ඔසවන සරම්ප

**නිරෝෂි දොඹගහගේ**

සරම්ප රෝගය වැළඳීම වැළැක්වීම සඳහා මෙරට වයස මාස 6-9ත් අතර දරුවන්ට අමතර එන්නත් මාත්‍රාවක් ලබා දීමේ වැඩසටහනක් නොබෝදා (ජනවාරි 06) සෞඛ්‍ය අමාත්‍යාංශය මූලිකත්වයෙන් ආරම්භ කෙරුණා. ජනවාරි 06 සිට පෙබරවාරි 03 දින දක්වා සති 05ක් සෙනසුරාදා දිනවල දිවයිනේ දිස්ත්‍රික්ක 09ක මේ එන්නත්කරණ වැඩසටහන ක්‍රියාත්මක කෙරෙනු ඇති.

මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට හේතුව වන්නේ 2023 වර්ෂයේ මැයි මාසයේ සිට මෙරටින් සරම්ප රෝගීන් 800ක් පමණ වාර්තා වීම බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය පාලිත මහීපාල පවසනවා. ඔහු පවසන පරිදි මේ අතිරේක එන්නත් මාත්‍රාව ලබා දීමට තීරණය කර තිබෙන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් මත යුනිසෙෆ් ආයතනයේ එකඟතාව අනුව. ඒ පිළිබඳ අදහස් දක්වන ලේකම්වරයා; "ශ්‍රී ලංකාවේ විද්වත් කමිටුවක් සම්බන්ධ කරගෙන දත්ත විශ්ලේෂණය කළ විට අපට නිරීක්ෂණය වුණා පසුගිය කාලයේ සරම්ප රෝගීන් වාර්තා වුණේ ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික්ක 09ක බව. එම දිස්ත්‍රික්ක වන කොළඹ, ගම්පහ, කළුතර, මාතර, ගාල්ල, කුරුණෑගල, මහනුවර, යාපනය සහ අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ ප්‍රදේශය ආවරණය වන අයුරින් මාස 06-09ත් අතර දරුවන්ට අතිරේක එන්නත් මාත්‍රාවක් ලබා දීමට තීරණය කළේ ඒ අනුව. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් මාර්ගයෙන් මේ එන්නත ලබා දීමේ වැදගත්කම පිළිබඳ සියලු ම නිවෙස්වලට අත්පත්‍රිකාවක් බෙදා හැරීමෙන් ජනතාව දැනුවත් කරමින් වැඩසටහන ක්‍රියාත්මක කළා. දිවයිනේ එන්නත්කරණයට ලක් නොවී සිටි මාස 09ත් අවුරුදු 15ත් අතර දරුවන්ටත් සාමාන්‍ය සායනවලදී සරම්ප එන්නත ලබා දුන්නා."

> ලෝක සෞඛ්‍ය සංවිධානය දක්වන පරිදි ආසාදනයට ලක්වන රෝගියකුගේ කැස්ස, කිවිසුම් යනාදියෙන් රෝගය තවෙකකුට සම්ප්‍රේෂණය වන්නට පුළුවන්. සියලු වයස් කාණ්ඩවලට රෝගය වැළඳිය හැකි වුවත් එය සුලබ ව දැකගත හැකි වන්නේ දරුවන් අතර බවයි වෛද්‍යවරුන්ගේ අනාවරණය.

විශේෂ එන්නත්කරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද දෙවන දිනය, එනම් ජනවාරි 13 දිනය වන විට මේ ප්‍රදේශවල 89%ක ආවරණයක් ලැබී තිබූ බව සඳහන්. ළමයින් 30,357කින් 20,027ක පිරිසක් එන්නත ලබාගෙන තිබීම විශේෂත්වයක්. ඒ, යාපනයේ 97%,ක්, කල්මුණේ 93%ක්, කුරුණෑගල 95%ක්, නුවර 95%ක්, මාතර 91% ක් ලෙස. කොළඹ, කළුතර, ගම්පහ, ගාල්ල යන දිස්ත්‍රික්කවල සාපේක්ෂ ව එන්නත් ලබා දීමට ඉදිරිපත් වීමේ ප්‍රගතිය අඩු බවයි පැවසෙන්නේ. මීට සමගාමී ව ක්‍රියාත්මක වූ මාස 09ත් අවුරුදු 15ත් අතර 'එන්නත ලබා නොදුන් දරුවන් එන්නත් කිරීමේ වැඩසටහනින්' එවැනි දරුවන්ගෙන් 21% ක් නැවත එන්නත්කරණයට යොමුවී තිබීම විශේෂත්වයක් බවයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රජා වෛද්‍ය වසංගත රෝග විද්‍යා අංශයේ විශේෂඥ වෛද්‍ය අතුල ලියනපතිරණගේ සඳහන.

සරම්ප යනු වෛරසයකින් බෝවන රෝගයක්. ස්වසන පද්ධතිය ආශ්‍රිත ව වැළඳෙන මේ රෝගය බෝවීමේ ප්‍රවණතාව ඉතා ඉහළ මට්ටමක පවතින බව විශේෂඥ වෛද්‍ය අතුල ලියනපතිරණ පවසනවා. එනම් සරම්ප රෝගය බෝවීමේ අගය (R-Naught-$R_0$) 16ක්. රෝගියකුගෙන් තවත් පුද්ගලයන් 16 දෙනකුට මේ රෝගය බෝවිය හැකි

බවයි ඉන් පැවසෙන්නේ. කොවිඩ් 19 රෝගයේ මේ අගය 4ක්. සරම්ප රෝගය බෝවීමේ ප්‍රවණතාව වැඩි බවයි මින් පෙනී යන්නේ. ලෝක සෞඛ්‍ය සංවිධානය දක්වන පරිදි ආසාදනයට ලක්වන රෝගියකුගේ කැස්ස, කිවිසුම් යනාදියෙන් රෝගය තවෙකකුට සම්ප්‍රේෂණය වන්නට පුළුවන්. සියලු වයස් කාණ්ඩවලට රෝගය වැළඳිය හැකි වුවත් එය සුලබ ව දැකගත හැකි වන්නේ දරුවන් අතර බවයි වෛද්‍යවරුන්ගේ අනාවරණය.

1963 වසරේදී මේ එන්නත්කරණ වැඩපිළිවෙළ ආරම්භ වීමට පෙර වාර්ෂික ව වාර්තා වී ඇති මරණ සංඛ්‍යාව මිලියන 20.6ක් බව ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙනවා. ඇස්තමේන්තු කර ඇති ආකාරයට එන්නත්කරණය නිසා 2000 සිට 2021 වසර දක්වා ලෝකයේ වැළකී ඇති සරම්ප මරණ සංඛ්‍යාව මිලියන 56ක්. ගෝලීය වශයෙන් ගත් කල 2021 වර්ෂයේදී සරම්ප රෝගය නිසා සිදුවී ඇති මරණ සංඛ්‍යාව 128,000ක්. ඒ අතරින් වැඩි පිරිස අවුරුදු 05ට අඩු දරුවන්.

අතීතයේදී ගෘහාශ්‍රිත රෝගයක් ලෙස සුලබ ව දක්නට ලැබුණු 'සරම්ප රෝගය වැළැක්වීමේ එන්නත්කරණය' 1984 වසරේදී මෙරට ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනට හඳුන්වා දී තිබෙනවා. සරම්ප යනු ශ්‍රී ලංකාවෙන් තුරන් කරන ලද රෝගයක් බවට වන සහතිකය ලෝක සෞඛ්‍ය සංවිධානය ලබා දී ඇත්තේ 2019 වර්ෂය වන විට.

"කොවිඩ් 19 වසංගතය නිසා පසුගිය කාලයේ ම ලෝකයේ ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙළ අඩපණ වුණා. එහි ප්‍රතිඵලයක් හැටියටයි ලෝකයේ පාලනය වී තිබූ මේ රෝගය නැවතත් හිස ඔසවන්න පටන් ගත්තේ. මෙරට සුළුතර පිරිසක් සිටිනවා ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන විශ්වාස නොකරන. ඔවුන් තමන්ගේ දරුවන්ට එන්නත් ලබා දෙන්නේ නැහැ. ඒ අය අතරිනුයි රෝගය මුලින් ම වාර්තා වන්නට ගත්තේ". එලෙස අදහස් දක්වන්නේ විශේෂඥ වෛද්‍ය අතුල ලියනපතිරණ.

සාමාන්‍ය ක්‍රමවේදය අනුව සරම්ප සඳහා වන එන්නත ලබා දෙන්නේ දරුවකුට මාස 09දී සහ අවුරුදු 03දී. මේ එන්නත (MMR) ලබා දෙන්නේ

වෛරසවලින් පැතිර යන පෝලියෝ, කක්කල් කැස්ස, නව ජන්ම පිට ගැස්ම යනාදී රෝග වළක්වාගෙන ඇත්තේ ප්‍රතිශක්තිකරණ එන්නත් නිසා බව අමතක නොකළ යුතු අතර ම යම් හෙයකින් ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙළ අඩපණ වුවහොත් මේ රෝග කාරක නැවත හිස එසවීම සිදුවන බවත් දැනුවත් වීම වැදගත්.

වෛරස්වලින් ආසාදනය වන සරම්ප, කම්මුල්ගාය, රුබෙල්ලා (Measles, Mumps, Rubella) යන රෝග වෙනුවෙන්. රෝගයෙන් වැළකීමට නම් එන්නත් මාත්‍රා දෙක ම ලබා ගැනීම අත්‍යාවශ්‍ය වනවා. රෝගයට එරෙහි ව 98%කින් එහා ගිය ආරක්ෂාවක් සහතික කළ හැකි වන්නේ එවිට. උපතේ සිට මාස 09ක් දක්වා දරුවන්ට සරම්ප රෝග යෙන් ආරක්ෂා වීමට මවගෙන් ලැබෙන ප්‍රතිදේහ ප්‍රමාණවත් වුවත් මාස 06-09ත් අතර දරුවන්ට ලැබෙන ප්‍රතිදේහ ප්‍රමාණවත් නැහැ. පසුගිය කාලයේ මෙරට වාර්තා වූ සරම්ප රෝගීන්ගෙ න් වැඩි පිරිසක් මේ වයස් කාණ්ඩයට අයත් වූවන්. මේ අමතර මාත්‍රාව ලබා දෙන්නේ ඒ අනුව.

මාස 09 සම්පූර්ණ වීමට දින දෙකක් පමණක් තිබූ දරුවන්ට පවා අමතර මාත්‍රාව ලබා දී ඇති අතර නැවත සති 08කින් මාස 09 නියමිත මාත්‍රාව සහ අනතුරු ව අවුරුදු 03දී නියමිත මාත්‍රාවත් අනිවාර්යයෙන් ඔවුන්ට ලබා දිය යුතු වනවා. ඒ අනුව 2022 අප්‍රේල් 02 - ජූලි 05 අතර ඉපදුණු සියලු දරුවන්ට මේ එන්නත ලබා දීමයි සැලසුම.

තද උණ, වියලි කැස්ස, සොටු දියර ගැලීම, උගුරේ ආසාදන, ඇස් රතු වීම, මුඛය තුළ කුඩා සුදු ලප මතුවීම, මුහුණ සහ බෙල්ල අවටින් ආරම්භ වී කඳ සහ අත් පා ආශ්‍රිත ව සමෙහි බිබිලි මතු වීම යනාදිය සරම්ප රෝග ලක්ෂණ. මූලික ව වෛරස් රෝගයක ලක්ෂණ මෙලෙස පෙන්නුම් කළත් රෝගය නිසා සංකූලතා රාශියක් ඇති වන බවයි විශේෂඥ වෛද්‍ය අතුල ලියනපතිරණ පවසන්නේ. විශේෂයෙන් කුඩා දරුවන්ගේ ඇස් අන්ධ වීම, මැද කනෙහි ආසාදන ඇතිවීම, තද පාචනය, නිව්මෝනියාව, මොළයට බලපෑම තුළ එන්සෙපලයිටිස් යනාදී තත්ත්ව මෙන් ම රෝගය වැළඳී වසර 04-05ක් වැනි කාලයකට පසුව වුව ද මොළයේ රෝගී තත්ත්වයක් Subacute sclerosing panencephalitis (SSPE) හට ගැනීම එම සංකූලතා තත්ත්ව. මේ රෝගී තත්ත්වය සඳහා ලෝකයේ මෙතෙක් ප්‍රතිකාර සොයාගෙන නොමැති බවයි වාර්තා වන්නේ. ගැබිණි මව්වරුන්ට රෝගය වැළඳීමෙන් අඩු බර උපත් සහ නොමේරූ දරු උපත් ඇති වන්නට පුළුවන්. මේ නිසා සාමාන්‍ය වෛරස් රෝගයක් ලෙස ද සලකා සරම්ප රෝගය සම්බන්ධයෙන් ක්‍රියා කළ නොහැකි බවයි වෛද්‍ය මතය. සාමාන්‍යයෙන් වෛරසය ශරීරයට ඇතුළු වී දින 07-21ත් අතර කාලයේ සමේ බිබිලි සහ උණ යන රෝග ලක්ෂණ දක්නට පුළුවන්. සමේ බිබිලි මතු වීමට දින 04කට පෙර සිට සමේ බිබිලි මතු වී දින 04ක් තෙක් කාලය රෝගය බෝ වන කාලය ලෙස සැලකෙනවා.

වෛරසවලින් පැතිර යන පෝලියෝ, කක්කල් කැස්ස, නව ජන්ම පිට ගැස්ම යනාදී රෝග වළක්වාගෙන ඇත්තේ ප්‍රතිශක්තිකරණ එන්නත් නිසා බව අමතක නොකළ යුතු අතර ම යම් හෙයකින් ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙළ අඩපණ වුවහොත් මේ රෝගකාරක නැවත හිස එසවීම සිදුවන බවත් දැනුවත් වීම වැදගත්.

එන්නත්කරණයට භාජනය නොවුණු අනාරක්ෂිත පුද්ගලයන්ට රෝග ආසාදනය වීමෙන් නැවතත් වෛරස් රෝග පැතිර යාමේ අවදානමක් පවතිනවා. මේ නිසා ඒ පිළිබඳ දැනුවත්භාවයයි වඩා වැදගත්.



# පුරාණ චින්තනයේ ඩිජිටල් හැඩය



ආචාර්ය
**ලැගුම්දෙණියේ පියරතන හිමි**

පුස්කොළපොත් සංරක්ෂණය කර ඩිජිටල්කරණය කිරීමේ වැඩපිළිවෙළක් කැලණිය විශ්වවිද්‍යාලය අරඹා තිබෙනවා. මේ සඳහා සමාජ විද්‍යා පීඨයේ පුස්කොළ පොත් සංරක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කර තිබෙන්නේ 2010 වසරේ. ඒ, එවක සිටි උපකුලපතිවරයාගේ සහ මහාචාර්යවරුන්ගේත් සංකල්ප මත.

විනාශ වී යන පුරාණ දේශීය දැනුම සංරක්ෂණය කිරීමයි මෙහි අපේක්ෂාව. ක්‍රමයෙන් විනාශ වී යන පුස්කොළ පොත් සාධිකාරී ග්‍රන්ථ ලෙස හඳුන්වන බවත් ගතවූ කාලයේ දිවයිනේ විවිධ ප්‍රදේශවල, විවිධ පුද්ගලයන්, විවිධ පූජනීය ස්ථාන සහ ආයතන සතු ව තිබූ පුස්කොළ පොත් 500කට ආසන්න සංඛ්‍යාවක් භෞතික වශයෙන් සංරක්ෂණය කළ බවත් ඒවායේ ඩිජිටල් පිටපත් සකසා ගැනීමට හැකි බවත් කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ලැගුම්දෙණියේ පියරතන හිමියන් සඳහන් කරනවා. ඒ අනුව පත්ඉරු ලක්ෂ 7-8ක් වැනි සංඛ්‍යාවක් දැනටමත් පිටපත් කර අවසන්.

අනුරාධපුර, පොළොන්නරු, දඹදෙනි හා කෝට්ටේ යුගවල පුස්කොළ පොත්වල ලියැවුණු බොහෝ සංදේශ කාව්‍ය ඩිජිටල්කරණය අවසන් කර තිබෙනවා. සැළලිහිණි, ගිරා, මයූර, හංස, කාව්‍යශේඛරය, ගුත්තිලය, සිදත් සඟරාව, සද්ධර්ම රත්නාවලිය, අමාවතුර, කව්සිළුමිණ, ලෝවැඩ සඟරාව, අමාවතුර, මුවදෙව්දාවත, සසදාවත, කව්මිණි මල්දම වැනි කෞතුක වටිනාකමකින් යුත් ඉපැරණි සාහිත්‍යයේ මුල් පිටපත් රාශියක් ඔවුන් සතු වීම මෙතෙක් ලබාගත් සාර්ථකත්වය කියාපාන්නක්. වත්මනෙහි මේ ග්‍රන්ථ සියල්ල ම පාහේ මුද්‍රිත ප්‍රකාශන ලෙස තිබුණත් ඒ ඕනෑ ම කෘතියක යම් සදොස් තැනක්, සැකසහිත තැනක් ඇත්නම් ඒවා නිදොස් කිරීමට යා යුත්තේ පුස්කොළ පොතට වීම සංරක්ෂණයේ ඇති තවත් වැදගත්කමක් බවයි උන් වහන්සේ පෙන්වා දෙන්නේ.

දුරාතීතයේ මුතුන් මිත්තන් සිය දැනුම හා තොරතුරු සටහන් කිරීමට ගල් පුවරු, මැටි පුවරු, පාච්මන්ට්, වෙලම් වැනි දේ සකසා ඒ මත අක්ෂරකරණය කළ බව නොරහසක්. යුරෝපාකරයේ ඇතැමුන් ඒ සඳහා පැපිරස් (පන්) ආදී දිගැටි ශාකපත්‍ර භාවිතයට ගත් අතර ආසියාතික රටවල පැරැන්නන් යොදා ගත්තේ තල් හා තලකොළ. අද ඒවා පුස්කොළපොත් නමින් හඳුන්වනවා. සියවස් 10කට පමණ පෙර තල්පත්‍ර මත ලියූ සටහන් ඉන්දියාවෙන් හමුවී ඇතත් ශ්‍රී ලංකාවේ මෙතෙක් හමුවී ඇත්තේ අවුරුදු 600-700ක් ඇතුළත ලියැවුණු පුස්කොළ පොත් පමණයි. 13 වැනි සියවසේ ලියූ චුල්ලවග්ගපාළියයි මෙරට පැරණි ම පුස්කොළ පොත ලෙස සැලකෙන්නේ. සතුරු ආක්‍රමණවලදී විනාශවීම, යටත්විජිත යුගයේ විදෙස් රටවලට රැගෙන යාම, නිසි ක්‍රමවේද අනුව සංරක්ෂණය නොවීම, ස්වාභාවික ව ම දිරාපත්වීම නිසා විවිධ විෂය යටතේ පැරැන්නන් අතින් ලියැවුණු අනගි වටිනාකමකින් යුත් අතිවිශාල දේශීය දැනුම් සම්භාරයක් කිසිදු ප්‍රයෝජනයකින් තොර ව අපට අහිමි වී අවසන්.







තල්කොළ මත සටහන් කිරීමේ කාර්යය සහ එය කොතරම් සියුම් හා දුෂ්කර ද යන වග පැහැදිලි කරමින් අදහස් දක්වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ලැගුම්දෙණියේ පියරතන හිමියන්: "ලංකාවේ එකල සිටි ප්‍රාඥයන් සතු ඥාන සම්භාරය, පාරම්පරික ව පැවත ආ දැනුම හා තොරතුරු ගබඩා වූ පරිහරණය කළ හැකි එක ම ලිඛිත සාක්ෂිය පුස්කොළ පොත. පුස්කොළ පොතේ ඇති තල්පත් හඳුන්වන්නේ පත්ඉරු නමින්. පත්ඉරු 30-50ත් අතර කුඩා පොත් මෙන් ම පත්ඉරු 500-600 පමණ වන විශාල පොත් අද අප සතු ව පවතිනවා. ත්‍රිපිටකය පමණක් පත්ඉරු 1300-1500කින් පමණ සමන්විත වනවා. අතීත මිනිසුන් තමන් සොයාගත් දෑ, අතීතයේ සිට පැවත එන පාරම්පරික දැනුම පුස්කොළ පොත්වල තැන්පත් කර ඇත්තේ මතු පරම්පරාවලට මේවා සම්ප්‍රේෂණය කරන අපේක්ෂාවෙන්. එක් විෂයකට පමණක් ලඝු නොවී ඔවුන්

විසල් දැනුම් පද්ධතියකට හිමිකම් කියූ බව අපට පෙනෙනවා. දේශීය වෛද්‍ය ක්‍රම, අත්බෙහෙත්, යන්ත්‍ර මන්ත්‍ර, තෙල් බෙහෙත්, බලි තොවිල් ක්‍රම, වාස්තු විද්‍යා, ජ්‍යොතිෂය, වාරි ක්‍රම, නිල ශාස්ත්‍රය හා නිල සටන් ක්‍රම, නිදන් වදුල, සංදේශ කාව්‍ය, සන්නස් පත්‍ර, ඔප්පු, කඩඉම් සීමා සහ තවත් එවැනි විශාල විෂය ප්‍රමාණයක වපසරියකයි ඔවුන් සැරිසැරුවේ."

පුස්කොළ පොත්වල ලිවීම විශේෂිත නාර්යයක්. එය පැහැදිලි කරන ආචාර්ය ලැගුම්දෙණියේ පියරතන හිමියන්: " බොහෝ පුස්කොළ පොත්වල ලිඛිත කාලය සටහන් වී තිබෙනවා. ඇතැම් ඒවායේ එහි අනුග්‍රාහකත්වය පවා සඳහන්. පිටු අංකනය කර ඇත්තේ 1, 2, 3 වශයෙන් නො ව අක්ෂර ක්‍රමයක් භාවිතයෙන්. මේවා පාලි, සංස්කෘත හා සිංහල භාෂාවලින් ලියා ඇත්තේ අක්ෂර වර්ග 4කින්. ඒවා හංස, ගජ, සිංහ හා කාක අක්ෂර ලෙස වෙන්





මහාචාර්ය එම්. කේ. වීරසිංහ



වනවා. රහස් භාෂා ක්‍රම ද, රහස් සංකේත ද ඇතැම් තැන්හි යොදා තිබෙනවා. පත්ඉරුවක ලියැවී ඇති පේළි ගණනත් වැදගත්.

දීර්ඝ ක්‍රියාදාමයකින් පසුවයි තල්කොළ මේ සඳහා යොදාගන්නේ. එහි ඇති ඉරටුව ඉවත් කර, රෝල් කර (වට්ටු දමා) තැම්බීම කරන්නේ ජලයට ද්‍රව්‍ය 4ක් මිශ්‍ර කිරීමෙන් පසුව. තම්බාගත් තල්කොළ පවනේ වේලාගන්නේ සිරස් අතට එල්ලා තැබීමෙන්. දින කිහිපයක් පින්නේ තැබීමයි ඊළඟ පියවර. මේවායේ ඇති දැඩි ගතිය මගහරවාගැනීමයි එහි අරමුණ. ඉන්පසු තිරස් අතට ඉහළ එල්ලූ පුවක් හෝ කිතුල් කොටයකට දමා දෙපසට ඇදීමෙන් මේවායේ සිනිඳු බව ඇතිකිරීමෙන් (මැදගැනීමෙන්) පසුවයි අවශ්‍ය ප්‍රමාණයට කොළ කපා ගන්නේ."

පන්හිඳකින් මෙහි සියුම් ව අකුරු ලියුව ද අත හුරුකර ගැනීම සිදුකරන්නේ උල් කටුවෙන්. විශේෂත්වය වන්නේ මේවා ලිවිය යුත්තේ මේසයක් වැනි සමතල පෘෂ්ඨයක් මත තබා නොව අත්ල මත තබාගෙන වීම. ගුඩුම අඟුරු, දුම්මල තෙල් යොදා මෙහි කළු මැදීම කළ පසුව කුරක්කන් පිටි යොදා පිරිසිදු කළ පසුවයි එහි සටහන් වූ දෑ පැහැදිලි වන්නේ.

කවරය හෙවත් කම්බය සඳහා බොහෝවිට කල්පවතින දැව පතුරු යොදාගත්තත් එයට රන් හා රිදියෙන් සැකසූ ඒවා ද තිබෙනවා. පත්ඉරු සියල්ල එකට සම්බන්ධ කිරීමට යොදන නූල 'හූය' ලෙසත් සිදුරට යොදන බොත්තම 'සකියා' ලෙසත් හඳුන්වනවා. 'රතගානවා' යන වදනින් හඳුන්වන දෙපස පිච්චීමෙන් අනතුරු ව මෙය අවසන් අදියරයට පැමිණෙන බවයි ආචාර්ය ලැගුම්දෙණියේ පියරතන හිමියන් සඳහන් කළේ.

පුස්කොළ පොත් හා පර්යේෂණ මධ්‍යස්ථානයේ අරමුණ වන්නේ දැනට ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සැඟ ව ඇති දේශීය දැනුම අන්තර්ගත පුස්කොළපොත් වර්ගීකරණ පහසුව තකා එක ම තැනකට ලබාදීම බව පුස්කොළපොත් සංරක්ෂණයේ පුරෝගාමී මෙහෙවරක යෙදෙන කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධානී මහාචාර්ය එම්. කේ. වීරසිංහ පවසනවා. ලැබෙන තොරතුරු අනුව ආගමික ස්ථාන, විවිධ පුද්ගලයන්, පර්යේෂකයන් සතු තැන්, පාරම්පරික ස්ථානවලට ගොස් ලබා ගත හැකි පුස්කොළපොත් භෞතික වශයෙන් මෙහි ගෙනැවිත් සංරක්ෂණය කරනවා. ලබාගත නොහැකි පුස්කොළපොත් ඒවා පවතින ස්ථානයට ම ගොස් එහිදී ම ඩිජිටල්කරණයට පත්කිරීම විශේෂත්වයක්. ඒ නිසා බොහෝ පුස්කොළපොත් හිමිකරුවන් මෙයට අනිසි බියක් නොදැක්විය යුතු බවත් සිදුකරන්නේ ඔවුන් සතු පොත්වල සටහන් වූ වියැකී යන ඥානය පිටපත් කරගැනීම පමණක් බවත් මහාචාර්ය වීරසිංහ සඳහන් කරන කාරණයක්.

මෙහි වැදගත්කම පෙන්වාදෙන ඔහු: "පැරණි දේශීය තාක්ෂණය, චින්තනය මුළුමනින් ම ගැබ් ව තිබෙන්නේ පුස්කොළපොත්වල. ඒ නිසයි ශ්‍රී ලංකාවේ එවැනි දෑ සොයා සංඛ්‍යාංකකරණය කර එහි පිටපතක් කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් හා පර්යේෂණ මධ්‍යස්ථානය සතු කරන්නේ. ඩිජිටල්කරණයෙන් පසු එම පිටපත් අදාළ විෂයට අනුව පෙළගස්වා නාමාවලියක් සකසා ඇත්තේ පර්යේෂකයන්ට පහසු වන ආකාරයෙන්. පුස්කොළ පොත් පර්යේෂකයන්ට විවිධ තැන්වල සැරිසැරීම, පත්ඉරු පෙරළමින් ඒවායේ අක්ෂර කියවීම දැන් අවශ්‍ය වන්නේ නැහැ. පරිගණකගත පුස්තකාලයේ ඩිජිටල් පිටපත්වලින් එක ම තැනකින් කෙටි වේලාවකින් අවශ්‍ය තොරතුරු වෙත පිවිසීමට හැකිවීම පුස්කොළ පොත් හා පර්යේෂණ මධ්‍යස්ථානයෙන් උදා වූ විශේෂ වරප්‍රසාදයක්. ඒ සඳහා අවශ්‍ය වටපිටාව සකසා තිබෙන්නේ ඊට සුදුසු ලෙස. මේ කාර්යයට විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරී උපරිම සහයෝගය ලබාදෙනවා."

මෙය ජාතික වැඩපිළිවෙළක් ලෙස ව්‍යාප්ත කිරීමයි කැලණිය විශ්වවිද්‍යාලයේ ඊළඟ අරමුණ. මෙරට වියැකී යන දේශිය ඥානය, දේශීය චින්තනය සුරක්ෂිත කර මතු පරපුරට දැනගැනීම පහසු කරවීමට කරන මේ ව්‍යායාමය සැබවින් ම අගය කළ යුත්තක්.

සටහන

**අනුහස් මහවලගේ**

සම්බන්ධීකරණය

**කීර්ති ජයලත්**

# GFU රූපමය පෙළහර

විදේශීය දෘෂ්ටිකෝණයකින් ලාංකේය පරිසරය හා ජන සමාජය විමර්ශනය කරන්නට දැරූ ප්‍රයත්නයක් ලෙස මෙරට වාර්තා සිනමාවේ ආරම්භය හඳුන්වා දෙන්නට පුළුවන්. අතිශය මානුෂික ස්වරූපයකින් රූප රාමු හසුකරගෙන ඇති මේ වාර්තා චිත්‍රපටවල අව්‍යාජ ස්වරූපය චිත්‍රපටයේ ආත්මය බවට පත් වී තිබෙනවා. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ නව දේශපාලනමය, සංවර්ධනමය ක්‍රියාදාම හා සෞඛ්‍යමය දැනුවත් කිරීම් උදෙසා ජනමාධ්‍යක් වශයෙන් වාර්තා චිත්‍රපටය භාවිතය 60% ඉක්මවා ගොස් තිබෙනවා.



මානව වංශකතාවේ එක් කාල පරාසයක පරිණාමීය අංග ලක්ෂණ විදහාපාන මෙවැනි රූප රාමු යනු මෙරට ඉතිහාසය රූපමය මාධ්‍යයෙන් ලිවීමක්. රජයේ චිත්‍රපට අංශයේ සංරක්ෂණය වී ඇත්තේ එවැනි වාර්තා චිත්‍රපට විශාල සංඛ්‍යාවක්. මේ අතරින් බොහෝ වාර්තා චිත්‍රපට ඩිජිටල්කරණය කර ඇති අතර තෝරා ගත් චිත්‍රපට සංඛ්‍යාවක් රජයේ චිත්‍රපට අංශයේ යූ ටියුබ් නාලිකාව ඔස්සේ නැරඹීමේ පහසුකම සලසා තිබෙනවා. ගෙවුණු වසරේ (2023) සමරන්නට යෙදුණු රජයේ චිත්‍රපට අංශයේ 75 වැනි සංවත්සරයට සමගාමී ව ජාතික වැදගත්කමක් දරන මේ චිත්‍රපට නව පරපුර වෙත සමීප කරවීම කාලීන අවශ්‍යතාවක් බව හඳුනා ගත් රජයේ



ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව දෙසතිය පුවත් සඟරාවේ ඉදිරි කලාපවලින් එම චිත්‍රපට පිළිබඳ පසුබිම් කතා ඇතුළත් කෙටි විමසුමක් ගෙන ඒමට සූදානම්. රජයේ චිත්‍රපට අංශයේ යූ ටියුබ් නාලිකාවට පිවිසීමෙන් එම චිත්‍රපට නරඹා ඔබගේ රසඥතාව වර්ධනය කර ගැනීමටත් ඉතිහාසය යළි කියවා ගැනීමටත් ඒ ඔස්සේ අවකාශ සැලසෙනු ඇති.

සටහන
**චානුද දුල්ශාන් ද මැල්**
(රජයේ චිත්‍රපට අංශය)



# කොඩි ගහ යට

**තුසිත ජයසුන්දර**





ජගත් මනුවර්ණ නිර්මාණය කළ ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ විකාශය වූ 'කොඩි ගහ යට' ටෙලි නාටකය නිසැක වශයෙන් ම විවාදාත්මක වූවක්. හේතු කිහිපයකින් ම මෙකරුණ නිශ්චය කර ගන්නට පුළුවන්.

පළමුකොට ම උපයුක්ත තේමාව සතු තැති ගන්නා සුළු බව හා සිත් ඇද ගන්නා සුළු බව. දෙවැනි ව දුලබ ලකුණු සහිත සුලබ චරිත ප්‍රතිනිර්මාණය කෙරෙහි උනන්දු වීම. තෙවැනි ව රූප රචනයේ අපූර්වත්වය. සිව්වැනි ව නිර්භය හා විකල්ප සිදුවීම් අවධාරණයට දැක්වූ මනාපය. පස්වැනි ව ටෙලිනාටක අනන්‍යතාව සම්බන්ධයෙන් සැලකිලිමත් වීම. සයවැනි ව නව රසික කණ්ඩායම් ආසක්ත කර ගැනීමට උත්සුක වීම.

ටෙලිනාටක රසිකාගාරය වඩාත් ම ඇලුම් කරන මොහොතක විකාශය වීමේ අවස්ථාව ලැබීම ද මෙතැනදී අත්හල නොහැකි තවත් හේතුවක් වනවා. බොහෝ විට පවුලේ සැමට 'විනීත' ආස්වාදයක් සපයන ටෙලි නාටක විකාශය වන මොහොතක එබඳු ආකාරයක් ම නොපෙන්වන 'කොඩි ගහ යට' වැනි ටෙලි නාටකයක් විකාශය වීම ඇතැම් පාර්ශ්වයන්ගේ නොකැමැත්තට ලක්වන කාරණයක්. එනමුදු බලධාරීන් මෙතැනදී පිහිටි පිළිවෙත අතිශයින් ම සාධනීය බව පැහැදිලි වන්නක්. ඔවුන් මේ මොහොත නොව මීළඟ මොහොත අරභයායි වැඩිපුර ම සැලකිලිමත් වූයේ. එනම් ලාංකේය ටෙලි නාටකයේ අභිවර්ධනය උදෙසා පෙනී සිටින විදග්ධ රසික ප්‍රජාවගේ සංඛ්‍යාත්මක වර්ධනයක් අපේක්ෂා කිරීම.

'කොඩි ගහ යට'හි සමස්තය ඒකාකාර රිද්මයකින් සමන්විත කිරීමට ජගත් පියවර ගන්නේ නැහැ. මෙය 'කොඩි ගහ යට' වෙත සුවිශේෂත්වයක් ගෙන එන බවයි දත හැක්කේ. කිසිදු පූර්ව හඳුන්වා දීමකින් තොර ව මෙය සනිටුහන් කිරීමෙන් යම් නොපැහීමක් ජනිත නොවනු පිණිස ජගත් කල්පනාකාරී වනවා. කෙමෙන් ගලා යන පුවතක් නිස්කලංක ව නිරූපණය ජගත්ගේ වුවමනාව සේ හඳුන්වා දෙන්නට බැහැ. ඛණ්ඩනය වීම් බහුල පුවතක් ඔහු විසින් සකසා ගනු ලබන්නේ අතීතාවර්ජන හෝ උපකල්පන නොපැමිණෙන පරිදි. මේ අනුව 'කොඩි ගහ යට' ටෙලි නාටකය එක ම තලයක දිවෙන වග දැක ගන්නට පුළුවන්. එසේ ම නිසි එල්ලයකින් තොර ව සිදුවීම් විකාශයට ජගත්ට මහත් කැමැත්තක් ඇති බව ද පෙනී යනවා. එක ම චරිතයක් හෝ චරිත කිහිපයක් සමග දිගින් දිගට ම ගමන් කිරීමට ඔහුට උනන්දුවක් නොමැති බවත් 'කොඩි ගහ යට' පවසන්නේ විද්වත් රසිකයාට වුව තාර්කික ව මැදහත්වීමේ අවකාශයක් පාදා නොදෙමින්. විද්වත් රසිකයා විනිසුරුවකු බවට පත් කරලීම ද ජගත්ගේ අභිලාසයක් බවයි විටෙක හැඟෙන්නේ.

'කොඩි ගහ යට'හි නිමා කෙරෙන සමයේ චරිත දෙක තුනක් මඳක් ඉහළට ඔසවනු පිණිස ජගත් දරන ප්‍රයත්නය රසික බහුතරයකට වටහා ගන්නට පුළුවන්. මෙය යම් උපක්‍රමයක් ලෙසිනුයි සඳහන් කළ යුතු වන්නේ. ටෙලි නාටකය නිමා කරලීම උචිතම අවස්ථාවේදී සිදු කිරීමට නම් මෙවැනි තීරණයක් ගත යුතු ම වනවා. ඊට පෙරාතුව නිරූපිත සුළු චරිත ප්‍රමුඛ චරිත බවට පත් කරලීමේ විලාසය ටෙලි නාටකයේ අනන්‍යතාව සලකුණු කෙරෙන අවස්ථාවක් සේ තේරුම් ගන්නටයි රසිකයාට සිදුවන්නේ.

වත්මන් ලාංකේය සමාජයේ අඳුරු අහුමුලු කරා ආලෝක කදම්බයක් එල්ල කිරීම 'කොඩි ගහ යට' හිදී පෙරට එන ජගත්ගේ වුවමනාව සේ නිර්වචනය කරන්නට පුළුවන්. මේ අඳුරට හේතු වූ දෑ වරින් වර පැවසීමට ඔහු සූදානම්. එහෙත් විසඳුම් හෝ අන්‍ය අවස්ථා හඳුන්වා දීමට ඔහු පියවර ගන්නේ නැහැ. මෙය විද්වත් රසිකයා විසින් විනිශ්චය කළ යුතු බවයි ඔහුගේ අදහස සේ ගම්‍ය වන්නේ. සෙසු රසික පාර්ශ්ව දැනුවත් කිරීම අවශ්‍ය බව ද ඒ ඔස්සේ විද්‍යමාන කෙරෙනවා. මේ අනුව

'කොඩි ගහ යට' යනු ටෙලි නාටකය හා සමාජය අතර ගමන් කරන නිර්මාණයක් සේ අවධානයට ලක් කරන්නට පුළුවන්.

අග නගරයට වඩා සමීපවීමක් සමස්ත ටෙලි නාටකය වෙතින් දැක ගත හැකි ලකුණක්. පිටිසර ගම වරෙක නිරූපණය කෙරෙන්නේ අග නගරයට යටත් ව. අග නගරයේ ප්‍රමුඛත්වයට හානියක් හෝ අභියෝගයක් නොවන පරිදි, පිටිසර ගම පිළිබඳ තවමත් රජයන පටු කියවීම පරයා යන්නට ද ජගත් මෙතැනදී සමත් වනවා. මේ රුදුරු හා බිහිසුණු ගමක්. ප්‍රචණ්ඩත්වය පිරුණු ඉසව්වක්. ඊට ප්‍රතිපක්ෂ ව අග නගරය පිළිබිඹු කිරීමේදී ද ජගත් පිහිටන්නේ එය රුදුරු, බිහිසුණු හා ප්‍රචණ්ඩත්වය පිරුණු ඉසව්වක් ලෙස. එහෙත් විසඳුම් ඇත්තේ අග නගරයේ ම බව ඔහු ඉඟි කරන්නේ ගම හා නගරය පිළිබඳ විවෘත කියවීමකට අවකාශ සලසා දෙමින්. පිටිසර ගමක සිට නගරයේ රැකියා සොයා එන තරුණයකු හා ඔහුගේ සොහොයුරිය සමග සනිටුහන් කරන මෙකරුණ ටෙලි නාටකයේ හරය තහවුරු කරනවා.

අග නගරයේ තතු සේ නිරූපණය කෙරෙන පාතාල සමාජයේ ඇතැම් චර්යා රසික බහුතරයකට ආගන්තුකය යන්න නොරහසක්. මෙහි එන මිනිස් සබඳතා දෙස ජගත් නෙත් යොමන්නේ දයාබර ව. කෙමෙන් ප්‍රමුඛ චරිතය බවට පත් වන මහේෂ් නැමැති පාතාල තරුණ පුරුෂයා සිය රූබර බිරිඳ සමීපතමයකුගේ පෙම්වතිය වනු දැක ඉවසා සිටින්නේ විශ්වාසනීයත්වයට කිසිදු පළුදු කිරීමක් නොකරමින්. අවිහිංසකයන් අනතුරේ වැටෙන පාතාල මෙහෙයුම් වෙත එක්වීමට ද ඔහු අදිමදි කරන්නෙක්. සෙසු චරිත වෙතින් ද මේ කළු සුදු මුසු ලකුණු හසු කර ගැනීමේ හැකියාව පවතිනවා. අත්වැරදීමකින් තමා අතින් මිය යන මිතුරාගේ බිරිඳට රැකවරණය සලසන තරුණයා එවැන්නෙක්. මහේෂ්ගේ සමීපතමයාගේ දිවි සැරිය ජගත්ට විෂය වන්නේ ද මේ ආකාරයෙන් ම. මොහුගේ

සමීප රූප භාවිතයට ලබාදෙන ප්‍රමුඛත්වය 'කොඩි ගහ යට'හි දක්නට ලැබෙන ටෙලි නාටක අනන්‍යතාව තහවුරු කරන්නක්. ඇතැම් රසිකයකු මෙය සිනමාවට නෑකම් කියන්නක් සේ පවසන්නට ද ඉඩ තිබෙනවා. එහෙත් විවිධ සිදුවීම් හා චරිත හඳුන්වා දීම හා ඒවා නිරූපණය කරන විලාසය මෙහි සිනමානුරූපී බව යටපත් කරන බවයි පෙනී යන්නේ.







මව, සොහොයුරිය තවත් අතුරු පුවත් ප්‍රමුඛ පුවත කරා රැගෙන එන්නේ රසික සහභාගිත්වය තීව්‍ර කරමින්.

බන්ධනාගාර දිවිය ප්‍රතිනිර්මාණයට සැලකිය යුතු ඉඩක් වෙන් කර දීමට ජගත් සූදානම්. බැලූ බැල්මට නම් මේ වත්මන් බන්ධනාගාර දිවිය නොවන්නට ද පුළුවන්. රැඳවූවන් බන්ධනාගාර වපසරියේ අපමණ නිදහසක් භුක්ති විඳින අයුරු ජගත් නොපැකිළ ව නිරූපණය කරනවා. ඔහු 'කොඩි ගහ යට' සම්මත තාත්වික තලයෙන් බැහැර කරලන්නට වෑයම් කරන බවයි මෙහිදී රසිකයාට වැටහෙන්නේ.

පාතාල නයුවන්ගේ චරිත ගෙන එමේදී ද ජගත් උක්ත පිළිවෙතේ ම පිහිටා සිටින බව දක්නට පුළුවන්. නාගරික සමරිසි දිවිය, රාත්‍රී සාද, සම්බාහන සේවා, සුරාව හා වෙනත් මත් වන දෑ, අවි ආයුධ මෙන් ම විලාසිතා ද ටෙලි නාටකයේ දෘෂ්‍යමානය ආකර්ෂණීය කරනවා. නාගරික අඩු අහසුකම් සහිත ජන දිවිය නිරූපණයේදීත් අදාළ හා සුදුසු ආකර්ෂණීය බවක් සාක්ෂාත් කර ගන්නට ඔහු පසුබට වන්නේ නැහැ.


දේශපාලනික හා ආරක්ෂක අංශ පිළිබඳවත් නීතියේ ආධිපත්‍යය පිළිබඳවත් තරමක කර්කශ විවරණයක් කරා 'කොඩි ගහ යට' ගමන් කරන්නේ විදග්ධ රසික ප්‍රතිචාර ම ඉලක්ක කර ගනිමින්. පශ්චාත් යුද සමයේ උතුරුකරයේ හැඩරුව හසු කර ගන්නට ද මේ අතරවාරයේ ම ජගත් වෙහෙස වනවා.

සමීප රූප භාවිතයට ලබාදෙන ප්‍රමුඛත්වය 'කොඩි ගහ යට'හි දක්නට ලැබෙන ටෙලි නාටක අනන්‍යතාව තහවුරු කරන්නක්. ඇතැම් රසිකයකු මෙය සිනමාවට නෑකම් කියන්නක් සේ පවසන්නට ද ඉඩ තිබෙනවා. එහෙත් විවිධ සිදුවීම් හා චරිත හඳුන්වා දීම හා ඒවා නිරූපණය කරන විලාසය මෙහි සිනමානුරූපී බව යටපත් කරන බවයි පෙනී යන්නේ. සිනමාව හා ටෙලි නාටකය අතරැති වෙනස සම්බන්ධයෙන් ජගත්ට වැටහීමක් තිබෙන බව ද මෙතැනදී පැහැදිලි වනවා.


රූපණ කාර්යයට එක්වන හැම කෙනකු ම ප්‍රමාණවත් සාධාරණයක් ටෙලි නාටකයට හිමි කරදෙන බව විශේෂයෙන් කිව යුත්තක්. කිසිවකුත් ටෙලි නාටකයේ සමස්තය වෙතින් සෙස්සන් පරයා කැපී පෙනෙන්නේ නැහැ. ඊට එක් හේතුවක් වන්නේ සෑම කෙනකු ම කවර අවස්ථාවකදී හෝ ප්‍රධාන චරිතයක් බවට පත් වීම.

# හයිකු


නුවන් කුමාර කටුගම්පල





ඉරි පහනක එළියෙන්
පවුලේ සැම එකට එක් ව
සතුටු සාමීචි කතා
(66 පිටුව)




එකම හිම
වෙනස් වෙනස්
හිම කබා
(32 පිටුව)




කුහුඹියෙක් ගොඩවෙයි
කඩදාසි බෝට්ටුවට
(37 පිටුව)




විදුලි රැහැනට බර දී
පරෙවි රැනක්
පැද්දෙන ආලිංගන නැටුමක
(75 පිටුව)

ශ්‍රී ලංකා හයිකු සමාජය එහි සභාපති පාලිත සේනාරත්න කිවිඳුන්ගේ උපදේශකත්වයෙන් සංවිධාන කළ ශ්‍රී ලංකා හයිකු කවි මහා සම්මේලනය මෙවර පැවැත්වුණේ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩල ශ්‍රවණාගාරයේදී. මෙහි විශේෂතම කාර්යද්වය වූයේ ශ්‍රී ලංකා හයිකු බ්ලොග් පිටුව සහ ජපන් හයිකු සම්ප්‍රදායට අයත් නවතම සිංහල කාව්‍ය ග්‍රන්ථ 08ක් එකවර ජනගත කිරීම.

හයිකු අනන්තය-පාලිත සේනාරත්න, නොවැටුණු වැහි බිඳු-උදාරා තම්බපණ්ණි දික්කුඹුර, රෑ පානේ ලියූ කවි-නලිනි ද සිල්වා, වන අරණක සඳ පහන-සමන්ති රණමුකගේ, සුසුම් හෙළන කඳු-අනුෂා ගමඇතිගේ, සිතිජය සිසාරා-සුභාෂිණී ජයතිලක, හිම මත තනි ව විලෝපත-ඉනෝකා රාජපක්ෂ, තීර්ථ යාත්‍රා-සුදර්ශනී කුරුප්පු එම ග්‍රන්ථ හා රචක රචිකාවියන්.

ජපන් ජන සංස්කෘතියේ අවියෝජනීය නියෝජනයක් හයිකු. එය ඔවුන්ගේ නිවුණු මානසිකත්වයේ සහ සැහැල්ලු ආකල්පවල පිළිබිඹුවක්. සෙන් බුදුදහම, එදිනෙදා දිවිපෙවෙත, පරිසරය, දාර්ශනික චින්තන යනාදිය මානව හැඟීම් සමග සංයමයෙන් ගළපා ගැඹුරු සත්‍ය සරල සුමට ලෙස ඉදිරිපත් කරන ආකර්ෂණීය ප්‍රබන්ධ විධියක්.

ජපන් ජන සංස්කෘතියේ අවියෝජනීය නියෝජනයක් හයිකු. එය ඔවුන්ගේ නිවුණු මානසිකත්වයේ සහ සැහැල්ලු ආකල්පවල පිළිබිඹුවක්. සෙන් බුදුදහම, එදිනෙදා දිවිපෙවෙත, පරිසරය, දාර්ශනික චින්තන යනාදිය මානව හැඟීම් සමග සංයමයෙන් ගළපා ගැඹුරු සත්‍ය සරල සුමට ලෙස ඉදිරිපත් කරන ආකර්ෂණීය ප්‍රබන්ධ විධියක්.

ආධ්‍යාත්මික සුවය විඳීම, ප්‍රකාශ කරනවාට වඩා වටහා ගැනීමට හෝ ගවේෂණය කිරීමට මග පෑදීම මේ කවි ප්‍රභේදයේ සුවිශේෂ ලක්ෂණයක්. වසන්ත (හරු/spring), ගිම්හාන (නත්සු/summer), වස්සාන (අකි/autumn) සහ ශීත (ෆුයු/winter) යන ඍතු හෝ සොබාදහම පිළිබඳ සඳහනක් (කිගෝ) ඇතුළත් වීම, අනිත්‍ය බව නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම, පෞද්ගලික හැඟීම් පොදු ආකාරයෙන් ප්‍රකාශ කිරීම, ධ්වනිතාර්ථ ගැබ් වීම, හැඟීම් මුල්කොටගෙන බුද්ධියට ගෝචරවනසුළු අදහසක් ප්‍රකාශ කිරීම, කථන ව්‍යවහාර භාෂාව ම කාව්‍යකරණයට යොදා ගැනීම, වචන ස්වල්පයකින් සහෘදයා තුළ නොමැකෙන මතකයක් විචිත්‍රණය කිරීම, අදහස් හෝ රූප දෙකකින් සමන්විත ව ඒවා එකිනෙක වෙන් කිරීමට සහ කවියේ මුඛ්‍යාර්ථය නිරූපණය කරමින් ශබ්ද රසය රඳා පවත්වා ගැනීමට කෙටි වචනයක් (කිරෙජි) යොදා ගැනීම, පද පේළි අතර හුස්මට ඉඩක් තැබීම එහි තවත් ලක්ෂණ. හයිකුවලින් ගැඹුරු අරුත් මතු වුවත් රචනයේදී යටි පෙළ, සැඟවුණු අරුත්, සමාජ පණිවිඩ, උත්ප්‍රාසය වැනි අලංකාර හිතාමතා අඩංගු නොකරන අතර 'හයිකු මොහොත' නම් වූ එක් ක්ෂණික සිදුවීමකින් ඇතිවන චිත්ත සංඥාවක් එලෙස ම ප්‍රකාශයට පත් කිරීම සිදු වනවා. හයිකුවල මානසික චික්ත්සක ගුණය අවබෝධකර ගැනීම ද වැදගත්.

හයිකු කවියට තිබෙන්නේ ඊට ම සුවිශේෂ අච්චුවක් නොහොත් අකෘතියක් (Structure,

Pattern). පළමු පදයට ජපන් භාෂාවෙන් 'ඔන්' නම් වන ශබ්ද එනම් අක්ෂර එසේත් නැත්නම් මාත්‍රා (Syllables, Sounds) 5ක්, මැද පදයට 7ක්, අවසන් පදයට 5ක් වශයෙන් ශබ්ද 17ක පිඬුවක් එය. සියලු ම නීති රීති සහ ලක්ෂණ අකුරට ම ආරක්ෂා වන පබැඳුම් ස්ථාවර ක්‍රමය (තෙයිකෙයි) ලෙසත් එසේ නොවන යම් යම් වෙනස්කම් සහිත ව රචනා කරන හයිකු නිදහස් ක්‍රමය (ජියුරිත්සු) ලෙසත් හඳුන්වනවා.

සාමාන්‍ය ජපන් කවියක් 'රෙංගා' හෝ 'රෙංකු' නමින් හැඳින්වෙන අතර ඕනෑ ම කවි පන්තියක පළමු කවිය හැඳින්වුණේ 'හොක්කු' නමින්. එහි අදහස 'පළමු කවිය' යන්න. අතීත ජපන් කවියන් කවි පන්තියක පළමු කවිය තනි කාව්‍යයක් ලෙස භාවිතයට ගැනීම දැරූ උත්සාහය නිසා 'හොක්කු' යන්නෙන් බිඳී විත් 'හයිකු' යනුවෙන් සම්මත වුණායි පැවසෙනවා. හයිකු බිහි කිරීමේ පුරෝගාමියා ලෙස සැලකෙන්නේ "මත්සුවෝ බෂෝ". ඒ, 1670දී පමණ. ඔහු පිළිගැනෙන්නේ හයිකු කවියේ පියා මෙන් ම ලොව විශිෂ්ඨතම හයිකු කවියා ද ලෙස. අරික්කිඳ මොරිතකී, බූසන්, ඊසා, ටකාහාමා කියෝෂි වැනි කවියන් ද ප්‍රකට පැරණි හයිකු කවියන්.

ජපානයේ පහළ වුවත් හයිකු කාව්‍ය අද වන විට ලෝක ප්‍රචලිත සාහිත්‍ය ශානරයක්. ඇමරිකාව, බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, රුසියාව, රුමේනියාව යනාදී රටවල ද සුප්‍රකට හයිකු නිර්මාණ සංවිධාන පිහිටුවාගෙන තිබෙනවා.

චිත්‍රපට සංස්කරණ ශිල්පයේ මූලාරම්භකයා ලෙස සැලකෙන රුසියානු ජාතික සර්ජි අයිසන්ස්ටයින් විසින් මුලින් ම Battleship Potemkin චිත්‍රපටයේදී ඔඩිස්සා පඩිපෙළේ දර්ශනය සඳහා රූප ඡේදනය කිරීමෙන් 'මොන්ටාජ් සංස්කරණ රීතිය' (Montage Film Editing Method) හඳුන්වා දීමේදී පාදක කර ගෙන තිබෙන්නේ බෂෝගේ හයිකු කවියක ආභාෂය වන අතර හයිකු කාව්‍යය පිළිබඳ ලෝකයේ ඇස් ඇරෙන්නට පටන් ගත්තේ ඒ සමග බවයි මෙහිදී මුලසුනේ කතාව සිදු කරමින් පූජ්‍ය ඇතිපොල මංගල හිමියන් වදාළේ.

ග්‍රාහක ප්‍රතිචාර උපරිම මට්ටමින් පැවතීම සහ අන්‍යයන් කෙරෙහි දක්වන ගරුත්වයට මුල් තැනක් දීම හයිකුව අන්තර්ජාතික වැළඳගැනීමක් සහිත වීමට ප්‍රමුඛ හේතු බව පවසන්නේ ප්‍රවීන කිවිවර ගීත රචක සහ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී සුනිල් සරත් පෙරේරා.


Presence, IRIS, Haiku Zoo Journal, Windfall, HIA, SHAMROCK, Wales Haiku, Autumn Moon, Enchanted Garden, Daily Haiku, Connecticut, Tri Rijeke, Failed Haiku ඇතුළු ජාත්‍යන්තර හයිකු ජර්නල සහ සඟරාත් Asahi Haikuist Network Japan, Australian Haiku Society, New Zealand Poetry Society, Haiku Publications, Haiku International Association, Haiku Society of America, Connecticut Poetry Society ඇතුළු අන්තර්ජාතික හයිකු සංවිධානත් අතර ශ්‍රී ලංකා හයිකු සමාජය ද දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පරිවර්තන සහිත ව හයිකු කාව්‍ය ග්‍රන්ථ ප්‍රකාශනය කරමින් වැඩමුළු පාඨමාලා යනාදීය පවත්වමින් මෙරට සිංහල-දෙමළ පාඨක සහෘදයාට ඒවා රසවිඳින්නට සැලැස්වීම පැසසිය යුතු කාර්යයක්. මෙවැනි අන්තර්ජාතික ප්‍රකාශනවල සිය නිර්මාණ පළ කළ සහ එම සංවිධානවලට සම්බන්ධ ව ක්‍රියා කරන ලේඛක ලේඛිකාවන් ද එහි සාමාජිකත්වය දරනවා. ජාත්‍යන්තර හයිකු පදනමේ නාමලේඛනයේ (International Haiku Registry) ද ඔවුන් සිටින්නේ ලේඛනගත ව.

ශ්‍රී ලංකා හයිකු සංගමය 2017 වසරේදී බිහිවූවක්. ථෙරවාදී බුදුදහම පවතින ශ්‍රී ලංකාවේ හයිකු කවිය ප්‍රචලිත වීමට සංගමයේ දායකත්වය ප්‍රබල පිටිවහලක් බවයි මෙවර සංවත්සර උත්සවයේදී ප්‍රකාශ වුණේ. සම්මේලනයට සහභාගි වෙමින් අදහස් දැක්වූ එහි සභාපති කිවිවර පාලිත සේනාරත්න අවධාරණය කළේ ඔවුන් විසින් සිදුකරන හයිකු කවියේ රස සොයාගෙන යාම කේවල ගමනක් මිස ශ්‍රී ලංකාවේ ඒ පිළිබඳ විධිමත් ශාස්ත්‍රීය හැදෑරීමක් තවමත් සිදු නොවන බව.


ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද පැවසුවේ සිය විශ්වවිද්‍යාලයේ ජපන් භාෂාව ඉගැන්වීමෙන් නොසෑහී ජපන් සංස්කෘතියේ හරවත් සංකල්ප සිසුන්ට හඳුන්වා දීමට දැරූ උත්සාහයේදී හයිකු සමාජය සමග සම්බන්ධ වීමට අවස්ථාව ලැබුණු බව. ඔහු; "සීගිරි කුරුටු ගීයේ පටන් හයිකු සම්ප්‍රදායට නෑකම් කියන කෙටි කාව්‍ය ප්‍රභේද ශ්‍රී ලංකාවේ භාවිත වී තිබෙන්නේ විශිෂ්ට ලෙස. සරසවි කුරුටු ගීයත් ඊට ම ඥාතිත්වයක් දක්වන්න නව හඳුනා ගැනීමක්. ඩිජිටල්කරණය වූ




වැරදුණ පින්සල් පාර
අලෙවි වුණා
ඇන්ද සිතුවම පසෙක
(31 පිටුව)



පාට ගණින අතරේ ම
චූටි පුතු
මැකී යන දේදුන්න
(28 පිටුව)



මහගෙදර මිදුලේ
පතිත පත්
ගොඩගැසෙමින්
(52 පිටුව)



කන්ද අතැර
තැන්නට වැටෙන
දියඇල්ල
(30 පිටුව)

ලෝකයේ මෙවැනි කලා ශානර ව්‍යාප්ත වීමට තිබෙන්නේ පුළුල් අවකාශයක්. එහෙත් ඒවායේ හිමිකාරිත්වයේත් ගුණාත්මකභාවයේත් ආකෘතිකමය සහ සංස්කෘතිකමය ලක්ෂණවලත් ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිමය ගැටලු මතුවීමට ඉඩ තිබෙන්නේ ඒවා පාලනය කළ නොහැකි මාධ්‍ය නිසා. ජපන් හයිකු කවිය සහ දේශීය කාව්‍ය විධික්‍රම සංසන්දනය කරමින් පර්යේෂණාත්මක අධ්‍යයනයක නියැළීමට වැඩපිළිවෙළක් සම්පාදනය කළ යුතු වනවා."

**ශ්‍රී ලංකා හයිකු සංගමය 2017 වසරේදී බිහිවූවක්. ථෙරවාදී බුදුදහම පවතින ශ්‍රී ලංකාවේ හයිකු කවිය ප්‍රචලිත වීමට සංගමයේ දායකත්වය ප්‍රබල පිටිවහලක් බවයි මෙවර සංවත්සර උත්සවයේදී ප්‍රකාශ වුණේ. සම්මේලනයට සහභාගි වෙමින් අදහස් දැක්වූ එහි සභාපති කිවිවර පාලිත සේනාරත්න අවධාරණය කළේ ඔවුන් විසින් සිදුකරන හයිකු කවියේ රස සොයාගෙන යාම කේවල ගමනක් මිස ශ්‍රී ලංකාවේ ඒ පිළිබඳ විධිමත් ශාස්ත්‍රීය හැදෑරීමක් තවමත් සිදු නොවන බව.**

පූජ්‍ය ඇතිපොල මංගල හිමියන්ගේ විග්‍රහය වන්නේ බුදුදහමේ ඉගැන්වෙන පරිදි පවතින මොහොතේ ජීවත් වෙමින් තමා අවට සචේතනික සහ අචේතනික වස්තු සමග මනෝමය ගනුදෙනුවක් සිදු කරමින් හයිකු කවියක් නිර්මාණය වන බව. උන්වහන්සේ; "ඉතා සියුම් ව තමා අවට සිදු වන වෙනස්වීම් ග්‍රහණය කර ගනිමින් යෝනිසෝ මනසිකාරයෙන් යුක්ත ව හයිකු ලිවීම භාවනාවකට සමානයි. වර්තමාන පාඨකයන් මෙන් ම නිර්මාණකරුවන් ද විශ්ව සාහිත්‍ය පරිශීලනයෙන් ඈත් වීම නිසා මේවා වටහා ගැනීම අසීරුයි. එය කනගාටුවට කරුණක්."

ජාත්‍යන්තර හයිකු කාව්‍ය නිර්මාණ තරගවලින් ජයග්‍රහණය කළ සිංහල ලේඛක ලේඛිකාවන් ද ශ්‍රී ලංකා හයිකු සමාජයේ සාමාජිකත්වය දරනවා. අදහස් දක්වන විවෘත විශ්වවිද්‍යාලයේ මහාචාර්ය රාධිකා ද සිල්වා: ''හයිකු කවියේ අනන්‍ය ලක්ෂණය වන්නේ නිශ්චිත විනිශ්චයක් (Judgment) හෝ මතයක් (Opinion) හෝ තේමාවක් හෝ මාතෘකාවක් (Plot, Theme, Topic) හෝ ඉදිරිපත් නොකිරීම. අනෙකුත් රටවල කවියන්ට නිශ්චිත හයිකු ආකෘතිය භාවිත කිරීම අපහසු බව පෙනී යනවා. විශේෂයෙන් ම ශබ්ද සහ පේළි සංඛ්‍යාවේ නිවැරදි ව ම රැඳී සිටීම දක්නට ලැබෙන්නේ කලාතුරකින්. විවිධ භාෂාවල හැඩය ඊට බලපානවා. ශ්‍රී ලංකාව වැනි ඍතු භේදයක් නැති රටවල පරිසර වර්ණනා වෙනස් වන අතර අනෙකුත් හයිකු ලක්ෂණ හැකිතාක් ආරක්ෂා කරනවා. 'හයිකු අධ්‍යයන කව' ලෝකයේ බිහිවීමත් ධනාත්මක ප්‍රවණතාවක්. මාර්ගගත ක්‍රමවේදය යටතේ ජාත්‍යන්තර මට්ටමින් හයිකු අධ්‍යයන පාඨමාලා පවා පැවැත්වෙනවා. එයින් සංඛ්‍යාත්මක ව වර්ධනය වී තිබෙන්නේ හයිකු හදාරන රසවතුන්."

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ මළගිය ඇත්තෝ සහ මළවුන්ගේ අවුරුදු දා කෘති පරිශීලනයෙන් ලද ආශ්වාදය ජපානය ගැන සොයන්නට තමා පෙළඹවූ බව ප්‍රවීණ කිවිවර සුනිල් සරත් පෙරේරා පැවසුවා. ඔහුඃ අද ලංකාවේ හයිකු කවි කියා ලේබල් අලවනවා කෙටි කවියට. ඒ නිසා මෙරට හයිකු සමාජය බිහි වීමත් ඔවුන් විසින් ගැඹුරින් සහ පුළුල් ව හයිකු කවිය හැදෑරීමත් ඒ සම්බන්ධ සැබෑ තතු සමාජගත කිරීමත් නිසා හයිකු කවියේ අනන්‍යතාව ආරක්ෂා කරගෙන නව නිර්මාණ කරන්නට අවස්ථාව උදා වී තිබෙනවා. අර්ථාන්විතභාවය සහ අර්ථ සංකෝචනය යන කාව්‍ය ලක්ෂණ හයිකු කවියේ අන්‍යතාව සහ විශිෂ්ටත්වය පිබිඹු කරන කැටපත්. ඒ සඳහා භාෂාත්මක ප්‍රයෝග යොදාගෙන ඇති ආකාරය හැදෑරීම ගීත රචනයට පිටිවහලක්." සම්ප්‍රදායෙන් නව්‍යත්වය වෙත ගිය ජපානයේ තාක්ෂණය සංවර්ධනයට යොදවන මුදලට සමාන මුදලක් භාෂාව හා සාහිත්‍ය සංවර්ධනයට ද යෙදවීම එරට කාව්‍ය ක්ෂේත්‍රයේ දියුණුවට මග පාදා තිබෙන බවත් පවසන ඔහු තාක්ෂණයට අවශ්‍ය ආකාරයට භාෂාව හැඩගස්වන්නට ක්‍රියා නොකිරීමත් භාෂාවට අවශ්‍ය විදියට තාක්ෂණය හැඩගස්වන්නට ක්‍රියා කිරීමත් රටක දියුණුවට ඉවහල් වන බව අවධාරණය කරන්නේ ජපානය ආදර්ශයට ගෙන.

පුවත්පත් සාකච්ඡාවකට එක්වෙමින් ප්‍රවීණ කිවියර සුමින්ද කිත්සිරි ගුණරත්න ප්‍රකාශ කර තිබුණේ ශ්‍රී ලංකාවේ හයිකු කවිය සම්බන්ධයෙන් පුළුල් සංකථනයක් ඇති වී තිබුණත් හයිකු ආකෘතිය සහ අන්තර්ගතය ඊට අනන්‍ය රටේ සංස්කෘතියෙන් උලුප්පාගෙන වෙනත් රටක සංස්කෘතියක පැළ කරන්නට නොහැකි බව. ඔහුඃ ජපන් හයිකු කවියේ ක්ෂණ දර්ශනය ප්‍රබල සම්ප්‍රදායක් නියෝජනය කරනවා. එය සෙන් බුදු දහමේ ගැඹුරු ලෝක දෘෂ්ඨිය සමග ම ගමන් කරන්නක් බැවින් ශ්‍රී ලංකාවේ ථෙරවාදී සංකල්පය සමග ඇත්තේ දුරස් බවක්. දෙරටේ සමාජීය, ආර්ථික සහ දේශපාලනික තත්ත්ව පවා එකිනෙකට ගැළපෙන්නේ නැහැ. එක් රටක භූමියේ ජනනය වන ජන සංස්කෘතික විඥානයේ නිමැවුමක් තවත් රටක පැළ කළ හැකි නම් අපේ පැල් කවිය, ගොයම් කවිය, ශාන්තිකර්ම ගායනා වැනි ජන කාව්‍ය සාහිත්‍ය කලා ප්‍රභේද එම රටවලත් පැළ කළ හැකි විය යුතුයි. එබඳු හේතු නිසා සිංහලෙන් හයිකු ලිවීමට උත්සාහ කිරීම අනුකාරකවාදී ප්‍රයත්නයක්." ඒ නිසා ශ්‍රී ලංකාවේ ලියැවෙන සීගිරි ගීයට නෑකම් කියන හුරුබුහුටි කෙටි කාව්‍ය ක්‍රමය 'සංකිත කවි' යනුවෙන් තමා නාමකරණය කළ බවත් ඔහු පවසනවා.

අතීතයේ මහගම සේකර, සිරි ගුණසිංහ වැනි ප්‍රවීණයන් මේ ආකෘතියට සමාන ආකෘතිවලින් පබැඳූ නිදහස් කෙටි කවි වඩාත් පාඨක ආකර්ෂණය දිනා ගත්තා. අපරැක්කේ සිරි සුධම්ම හිමි, මහාචාර්ය ආරිය රාජකරුණා, ජයන්ත විමලසේන, ආරියවංශ රණවීර, නන්දන වීරසිංහ වැනි කවියන් ද මෙරට හයිකු සහ කෙටි කවිය උදෙසා දැක්වූ දායකත්වය ප්‍රබලයි. වර්තමානයේ මාලන් බණ්ඩාර, කල්පනා ඇම්බ්‍රෝස්, මංජුල වෙඩිවර්ධන, ලක්ශාන්ත අතුකෝරල, ලහිරු කරුණානායක, සරත්චන්ද්‍ර වල්පොල, ටිම්රාන් කීර්ති ඇතුළු කවියන් රැසක් මේ ශානරයේ සාර්ථක අත්හදාබැලීම් සිදු කර තිබෙනවා. ඒ ඒ කවියන් හයිකු ලෙස නොහැඳින්වූවත් කෙටි කවි (Short Poems), සාර සංක්ෂිප්ත කවි, සංකිත කවි, පොඩි කවි, කුඩා කවි, කොට කවි, සැකෙවි කවි, ක්ෂුද්‍ර කවි, සැකිලි කවි, මුක්තක කවි යනාදී විවිධ නම්වලින් හයිකුවට සමාන ලක්ෂණ සහිත තම ප්‍රබන්ධ නම් කර තිබෙනවා. ශ්‍රී ලංකා හයිකු සමාජයේ කවි කිවිඳියන් අලුතින් නිකුත් කළ කාව්‍ය කෘති 08 මෙන් ම 2022 වසරේ නිකුත් කළ කවි පොත් 04 ඍජු ව ම 'හයිකු කාව්‍ය සංග්‍රහය' ලෙස නම් කර තිබීමත් සුවිශේෂත්වයක්.

මෙයින් පෙනී යන්නේ හයිකු කාව්‍ය පිළිබඳ පුළුල් පර්යේෂණාත්මක, ගවේශනාත්මක සහ ප්‍රවර්ධනාත්මක හැදෑරීමකට කාලය එළඹී ඇති බව.

# ඔස්කා පිස්ටෝරියස්

**වර්නන් ගුණසේකර**

ලෝක පූජිත පැරාලිම්පික් ශූරයකු වන දකුණු අප්‍රිකාවේ ඔස්කා පිස්ටොරියස් නොබෝදා හිරෙන් නිදහස් වුණේ ඔහුට නියම වූ සිරදඬුවම් කාලය අවසන් වීමට පෙර. අඛණ්ඩ ව දුම්පානය කරන්නකු වී බන්ධනාගාරයෙන් නිදහස් මිනිසකු ලෙස පිට ව ගියත් ඔහුට සැමදා වසන්නට සිදුවන්නේ සිය උරහිසට ඉහළින් පිටුපස බලමින් බියෙන් සැකෙන්.

සැත්කමකින් ගාත්‍රා දෙක ම කපා දැමුණු ඔලිම්පික් ඉතිහාසයේ එක ම මලල ක්‍රීඩකයා මෙන් ම උසාවියෙන් මිනීමරුවකු බවට ද තීන්දු කෙරුණු ඔස්කා පිස්ටොරියස් ඔහුගේ පොහොසත් මාමා සමග ජීවත් වන්නේ පාතාලයෙන් තිබෙන තර්ජන යටතේ.

තමාගේ මාස තුනක පෙම්වතිය වූ රීවා ස්ටීන්කැම්ප්ට සිව් වතාවක් වෙඩි තබා ඝාතනය කිරීමේ වරදට නියම වූ වසර 13යි මාස 5ක සිරදඬුවමින් අවුරුදු 9කට ආසන්න කාලයක් ගෙවීමෙන් පසුව පිස්ටොරියස් හිරෙන් නිදහස් වුණේ හොඳ කල්ක්‍රියාවෙන් පසුවන බවට දුන් පොරොන්දුවකින්. දකුණු



ඔස්කා පිස්ටොරියස්

අප්‍රිකාවේ නීතියට අනුව නියමිත සිරදඬුවමෙන් අඩක් නිම කිරීමෙන් පසුව හොඳ කල්ක්‍රියාවෙන් සිටින බවට වාචික ප්‍රතිඥාවක් දෙමින් තාවකාලික ව නිදහස ලබා ගැනීම සෑම සිරකරුවකුට ම තිබෙන අයිතියක්. පිස්ටොරියස්ගේ සම්පූර්ණ සිරදඬුවම අවසන් වන්නේ 2029 වසරේදී. මේ ඉතිරි කාලයේ ඔහු නිදහස ලැබීමේ කොන්දේසි උල්ලංඝනය කළහොත් සිදුවන්නේ නැවත සිරගත වීමට.

මිය යන විට 30 හැවිරිදි වියේ පසුවූ රීවා ස්ටීන්කැම්ප් නීති උපාධිධරයෙක්. සාර්ථක නිරූපිකාවක්. රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කරන්නියක්. පිස්ටොරියස් තම නිවසේ නානකාමරයේ සිටි පෙම්වතිය රීවාට දොරගුළු ලා තිබූ දොර හරහා මිලි මීටර් 9 පිස්තෝලයකින් වෙඩි තබා මරා දැමුවේ 2013 වසරේ පෙබරවාරි 14 ආදරවන්තයන්ගේ දිනයේ. නානකාමරයේ සිටියේ රීවා බව තමා දැන නොසිටි බවත් තමා වෙඩි තැබුවේ නානකාමරයේ සැඟවී සිටින සොරෙක් යැයි සිතාගෙන බවත් පසුව ඔහු කියා සිටියා.

ඒ වන විට ඔහු කාබන් ෆයිබ තහඩුවලින් ලන්ඩන් 2012 ඔලිම්පික් උළෙලේ දුවමින් ලෝක ප්‍රසිද්ධියට පත් ව ගත වී තිබුණේ මාස 06ක පමණ කාලයක්. මේ ධාවනය නිසා ඔස්කා පිස්ටොරියස් Blade Runner ලෙසින් ජනප්‍රිය වුණා.

2024 ජනවාරි 5 දා අවසන් වතාවට තමාගේ තැඹිලි පාට බන්ධනාගාර නිල ඇඳුම නවා දමා ජොහැන්නස්බර්ග් නුවර Atteridgeville බන්ධනාගාරයෙන් 37 හැවිරිදි ඔස්කා පිස්ටොරියස් නික්ම ගිය ද ඔහු පියමං කළේ සැබෑ නිදහසකට නෙවෙයි. ඔහු ගියේ සැතපුම් 15ක් නැගෙනහිරින් පිහිටි, තමා සමග අමනාප වී සිටින පියාගේ සහෝදරයා වන, නොවරදවා පල්ලියට යන, ධනවත් ආනොල්ඩ් මාමා සමග ඔහුගේ උස් තාප්පවලින් වට වූ මුරකාවල් යෙදූ වතුයායේ ජීවත් වීමට. මේ වතුයාය පිහිටි ප්‍රැටෝරියා නමැති ලෝකයේ වැඩියෙන් ම අපරාධ සිදුවන නගරයක ඔස්කෝට තිබෙන්නේ අවිනිශ්චිත අනාගතයක්.

මේ අගනුවර ආනොල්ඩ් වෙසෙන Waterkloof නමැති උපනගරයේ සියලු ඉඩකඩම් ආරක්ෂා වී තිබෙන්නේ පවුම් මිලියන 10ක් පමණ වටිනා විද්‍යුත් වැටකින්. ආරක්ෂක නිලධාරීන් තණ බිම අද්දර හෝ ගේට්ටුව පිටත සිට දේපළ මුර කරනවා. එය නිශ්ශබ්ද ව භය ගන්වන ස්ථානයක්.

**තමාගේ මාස තුනක පෙම්වතිය වූ රීවා ස්ටීන්කැම්ප්ට සිව් වතාවක් වෙඩි තබා ඝාතනය කිරීමේ වරදට නියම වූ වසර 13යි මාස 5ක සිරදඬුවමින් අවුරුදු 9කට ආසන්න කාලයක් ගෙවීමෙන් පසුව පිස්ටොරියස් හිරෙන් නිදහස් වුණේ හොඳ කල්ක්‍රියාවෙන් පසුවන බවට දුන් පොරොන්දුවකින්.**


සිය පෙම්වතිය සමඟ

අනවසරයෙන් ඇතුළුවන්නන් වළකනු ලබන්නේ ADT Rapid Response - ඉක්මන් ප්‍රතිචාර - යන අනතුරු අඟවන නිල් සහ කහ පැහැති සංඥාවලින්. පාතාලයේ කුලී මිනිමරුවන්ගේ ඉලක්කයක් විය හැකි බැවින් ආරක්ෂා වන ලෙසට පිස්ටෝරියස් බන්ධනාගාරයෙන් පිටත් වන දිනට පෙර දිනයේ ඔහුට දන්වා තිබුණේ අපකීර්තිමත් පිස්ටොරියස් විසින් ඝාතනය කරනු ලැබූ රීවා ස්ටීන්කැම්ප්ගේ පවුලට අනුකම්පාව දක්වන්නන්ගේ ඉලක්කයක් බවට ඔහු පත්වීමට ඉඩ ඇති බවට අනතුරු අඟවමින්.

පිස්ටෝරියස්ගේ නඩු විභාගය පැවති දිනෙක උසාවියට පැමිණි කුලී මිනිමරුවකු දැඩි අධිෂ්ඨානයකින් යුත් මුහුණකින් ඔහු දෙස රවා බලා සිටීමෙන් පසුව ඔහුගේ පවුලේ අය සමග වාදයකට ද පැටලී තිබුණා. පිස්ටොරියස්ට ඔහුගේ ඉතිරි ජීවිතයේ යළි කිසිම දිනෙක තමන්ගේ උරහිසට උඩින් පසුපස නොබලමින් කිසිම තැනකට යාමට නොහැකි වනු ඇත්තේ මේ තර්ජන හේතුවෙන්. තමා කළ මිනීමරු ක්‍රියාවට පිස්ටොරියස්ට ඔහුගේ ජන්ම භූමිය දක්වන්නේ එතරමට ම ප්‍රබල පිළිකුලක්. රීවා මරා දැමීමේ පළිය ගැනීමට නගරයේ මැර කල්ලි සූදානම් වෙමින් සිටින බවට ජොහැන්නස්බර්ග් පොලිසියට තොරතුරු ලැබී තිබුණා.

උපතින් ම ලද දෝෂයක් නිසා ඔස්කා පිස්ටොරියස්ගේ පාදවල දණහිසෙන් පහළ කොටස සැත්කමකින් කපා ඉවත් කර ඇත්තේ ඔහුට වයස මාස 11ක් ව තිබියදී. ඔහු ඉපදුණේ කකුල් දෙකේ ම පිට පැති දෙක හා කෙණ්ඩවල කුඩා අස්ථි දෙක නොමැති ව.

පිස්ටොරියස් ආබාධිත නොවන අය සඳහා වන කෙටි දුර තරග සහ දණහිසෙන් පහළ කොටස කපා ඉවත් කෙරුණු අය වෙනුවෙන් පැවති කෙටි දුර ධාවන තරග යන ඉසව් දෙකේ ම තරග කළා. පැරාලිම්පික් හා ඔලිම්පික් ක්‍රීඩා උළෙල දෙකේ ම තරග වැදුණු ලොව 10 වැනි මලල ක්‍රීඩකයා වන්නේ පිස්ටොරියස්.

පැරාලිම්පික් ශූරයකු බවට පත්වීමෙන් පසුව පිස්ටොරියස් ආබාධිත නොවන ජාත්‍යන්තර තරගවලට ඇතුළුවීමට උත්සාහ කළේ මලල ක්‍රීඩා සම්මේලනවල ජාත්‍යන්තර සංගමයේ විරුද්ධත්වය හා ඔහුගේ කෘත්‍රිම ගාත්‍රාවලින් ඔහුට අසාධාරණ වාසියක් ලබාදෙන බවට නිරතුරු ව නැගුණු තර්ක මැද. පිස්ටොරියස් මේ නීති මතභේදය ජය ගත්තා. 2011 ලෝක මලල ක්‍රීඩා ශූරතාවලියේදී ඔහු ආබාධිත නොවන ලෝක ජවන පදක්කමක් දිනා ගත් ගාත්‍රා කපා ඉවත් කරන ලද පළමු ක්‍රීඩකයා බවට පත්වුණා. 2012 ඔලිම්පික් උළෙලේදී ද්වි-පාද ඉවත් කෙරුණු පළමු ක්‍රීඩකයා බවට ඉතිහාසයට එක්වුණේත් පිස්ටොරියස්.

2013 පෙබරවාරි 14 දා සිය පෙම්වතිය රීවා ස්ටීන්කැම්ප් මරා දැමීමෙන් පසුව පිස්ටොරියස් අත්අඩංගුවට ගෙන මිනීමැරීමේ චෝදනාව යටතේ ඔහුට නඩු පවරනු ලැබුවා. ඊළඟ වසරේ පැවති ඔහුගේ නඩු විභාගයේදී ඔහු මිනීමැරුමට නිවැරදිකරු වුවත් සාපරාධී මනුෂ්‍ය ඝාතනයට වරදකරු වුණා. මේ වරද වෙනුවෙන් ඔහුට පස් වසරක සිරදඬුවමක් නියම කෙරුණු අතර ඊට සමගාමී ව වෙන ම තෙවසරක අත්හිටවූ සිරදඬුවමක් ද නියම කෙරුණේ නොසැලකිමත් ලෙසින් අනතුරට භාජන කිරීමේ වරදට. මේ දඬුවම් දෙක ඔහුට නියම කෙරුණේ 2014 ඔක්තෝබරයේ.

දකුණු අප්‍රිකාවේ අභියාචන ශ්‍රේෂ්ඨාධිකරණයේ කමිටුවක් වෙත නඩුව ඉදිරිපත් කර තිබියදී පිස්ටොරියස් නිවාස අඩස්සිය මත 2015 ඔක්තෝබර් මාසයේදී තාවකාලික ව සිරෙන් නිදහස් කෙරුණු අතර ඇපැල් උසාවිය ඔහුගේ සාපරාධී මනුෂ්‍ය ඝාතන තීන්දුව ආපසු වෙනස් කරමින් ඔහු මිනීමැරුමට වරදකරු බවට තීන්දු කළා. 2016 වසරේ ජූලි මාසයේදී විනිසුරුවරයා පිස්ටොරියස්ගේ සිරදඬුවම වසර හයකට දීර්ඝ කළා. අනතුරු ව ශ්‍රේෂ්ඨාධිකරණය ඔහුගේ සිරදඬුවමේ සම්පූර්ණ කාලය අවුරුදු 15 දක්වා වැඩි කළේ වඩාත් දීර්ඝ සිරදඬුවමක් ඉල්ලා රජය ඉදිරිපත් කළ ඇපැලක් මත. අවසානයේ හොඳ කල්ක්‍රියාවෙන් පසුවන බවට පොරොන්දුවක් දෙමින් පිස්ටොරියස් තාවකාලික ව 2024 ජනවාරි 5 දා හිරෙන් නිදහස් වුණා.

මේ දිනය නිය ම කෙරුණේ 2023 වසරේ නොවැම්බර් 24 දා. ඒ, ඔහු පිළිබඳ ව සිරකරුවන් මුදා හැරීමේ මණ්ඩලය කරන ලද සමාලෝචනයකදී 37 හැවිරිදි පිස්ටොරියස් සමාජයට යළි එකතු කිරීමට සුදුසු බවට තහවුරු කර ගැනීමෙන් පසුව.

# රාජකීය සම්ප්‍රාප්තිය



ජනාධිපති මන්දිරයේදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ සමග කතාබහක

**ශම්මි රණසිංහ**

එක්සත් රාජධානිය හා ශ්‍රී ලංකාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා සඳහා වසර 75ක් සැපිරෙන මොහොතේ රාජකීය කුමරිය ඇන් සහ ඇයගේ සැමියා වන වයිස් අද්මිරාල් ශ්‍රීමත් තිමොති ලෝරන්ස් මැතිතුමා මෙරට තෙදින නිල සංචාරයක් සඳහා 2024 ජනවාරි 10 දින ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් යූ.එල්. 504 දරන ගුවන් යානයෙන් මෙරටට පැමිණියා.

එක්සත් රාජධානියේ විදේශීය, පොදුරාජ්‍ය මණ්ඩලීය සහ සංවර්ධන කාර්යාලයේ ඉල්ලීම මත මේ සංචාරයේ යෙදුණු ඇන් කුමරිය ඇතුළු රාජකීය දූත පිරිස කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේදී මහත් හරසරින් පිළිගනු ලැබුවේ විදේශ කටයුතු අමාත්‍ය, ජනාධිපති නීතිඥ අලි සබ්‍රි විසින්. ජනාධිපති මන්දිරයේදී ඇය ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ හමු වූ අතර මේ අවස්ථාව සනිටුහන් කරමින් එහි තැන්පත් කර ඇති විශේෂ අමුත්තන්ගේ සමරු පොතෙහි සටහනක් ද තැබුවා. තෙදින නිල සංචාරයේදී ඇන් කුමරිය කොළඹ, මහනුවර මෙන් ම යාපනයේ ද සංචාරය කළා.

ඇය, දෙවැනි එලිසබෙත් රැජිනගේ එක ම දියණිය. තෙවැනි චාල්ස් රජුගේ සහෝදරිය. 1987 ජූනි මාසයේදී 'රාජකීය කුමරිය' යන පදවි නාමය ප්‍රදානය කෙරුණු ඇයට එක්සත් රාජධානියේ සිංහාසනය සඳහා වන අනුප්‍රාප්තික පිළිවෙළේ තෙවැන්නිය වුවත් මේ වන විට හිමි ව ඇත්තේ 16 වැනි ස්ථානය.


මීට පෙර 1995 වසරේ මාර්තු මාසයේ ඇය ශ්‍රී ලංකාවට පැමිණියේ තමන් අනුශාසකත්වය දරන Save the Children ආයතනය අනුග්‍රහය දක්වන ව්‍යාපෘති පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා.

නිල සංචාරය නිමා කර ජනවාරි 13 දින ඇය ඇතුළු පිරිස ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ යූ.එල්. 505 දරන ගුවන් යානයෙන් යළි ලන්ඩන් නුවර බලා පිටත්ව ගියා. ඇන් කුමරියගේ ශ්‍රී ලංකා සංචාරය 2024 වසරේ රාජකීය පවුලේ සාමාජිකයකු සිදු කළ ප්‍රථම විදෙස් සංචාරය.





බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළට සම්ප්‍රාප්ත වූ ඇන් කුමරිය



ගුවන් තොටුපොළ රන් සමරු පොතේ (Golden Book)සමරු සටහන් තබමින්


දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත
Department of Government Information
news.lk
GFU Sri Lanka
Rs. 100/-